ශ්‍රී ලංකා රේගුව

# වාර්ෂික

# කාර්ය සාධන වාර්තාව

# 2014


සැකසුම

ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## පටුන


ප්‍රධාන නිලධාරීන් 5
සමස්ථ කාර්ය සාධනය 2014 7

*නීති බලාත්මක කිරීමේ පර්ෂදය*
නිවාරණ අංශය 21
සමාජ ආරක්ෂණ අංශය 27
මධ්‍යම විමර්ශන අංශය 35
නීති අංශය 41
මධ්‍යම බුද්ධි අංශය 43
*ආදායම් හා සේවා පර්ෂදය*
ප්‍රකාශන අංශය 49
කර්මාන්ත හා සේවා අංශය 63
භාණ්ඩ පරීක්ෂණ අංශය 69
මගී සේවා - කොළඹ අංශය 73
අපනයන අංශය 79
*සහය සේවා පර්ෂදය*
ප්‍රතිපත්ති, සැළසුම් හා පර්යේෂණ අංශය 83
පශ්චාත් නිශ්කාශන හා විගණන අංශය 93
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය 103
මධ්‍යම මිල පිරික්සුම් අංශය 105
විශේෂිත සේවා අංශය 111
*මානව සම්පත් පර්ෂදය*
මානව සම්පත් කළමනාකරණ අංශය 117
මානව සම්පත් සංවර්ධන අංශය 119
කාර්ය මණ්ඩල සේවා අංශය 123
සැපයුම් අංශය 125
*ප්‍රාදේශීය පර්ෂදය*
මගී සේවා - කටුනායක අංශය 129
ආදායම් හා සේවා - කටුනායක 133
ආදායම් හා සේවා ප්‍රාදේශීය 135
මගී සේවා - ප්‍රාදේශීය 137
*රේගු අධ්‍යක්ෂ ජනරාල් යටතේ ඇති අංශ*
පද්ධති, ක්‍රියාපටිපාටි, අනුකූලතා විගණන අංශය 141
මූල්‍ය අංශය 143
විශේෂ කාර්ය හා සුපරීක්ෂණ අංශය 147
නිෂ්පාදන බදු (විශේෂ විධි විධාන) අංශය 149

# ශ්‍රී ලංකා රේගුව
# 2014
# ප්‍රධාන නිලධාරීන්


**ජගත් පී. විජේවීර මහතා**
රේගු අධ්‍යක්ෂ ජනරාල්
**ඒ සේනානායක මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්)
**ආර්.පී.ඩී.ටී. සෙනෙවිරත්න මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රාදේශීය)
**කේ.එල්.ජී.ටී. පෙරේරා මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (නීති බලාත්මක කිරීම)
**එම්. පුවිහරන් මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (ආදායම් හා සේවා)
**එස්. රාජේන්ද්‍රන් මහතා**
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (සහාය සේවා)
**කේ.ඒ.ඩී.ආර්. ක්‍රිස්ටි මහතා**
රේගු අධ්‍යක්ෂ (නිවාරණ)
**එම්.පාස්කරන් මහතා**
රේගු අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ)
**පී.එච්. ලියනගේ මහතා**
රේගු අධ්‍යක්ෂ (පශ්චාත් නිශ්කාශන විගණන)
**කේ.ඒ. ධර්මසේන මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම බුද්ධි තොරතුරු)
**ජී.ඒ. ලෙස්ලි ගාමිණී මහතා**
රේගු අධ්‍යක්ෂ (නීති කටයුතු)
**යූ. ලියනගේ මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම බුද්ධි තොරතුරු)
**කේ. ප්‍රේමනාත් මහතා**
රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන)
**එම්.රිෂාපි මහතා**
රේගු අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා)
**ටී.ඩබ්.ඒ.සේනානායක මහතා**
රේගු අධ්‍යක්ෂ (අපනයන)
**ඩී.ඒ.අයි. දරණගම මහතා**
රේගු අධ්‍යක්ෂ (භාණ්ඩ පරීක්ෂණ)
**එස්. සිවකුමාර් මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා -කොළඹ)
**පී.බී.එස්. සී නෝනිස් මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා -කටුනායක)
**බී.ඒ. කේ. ඩබ්.මහේන්ද්‍රන් මහතා**
රේගු අධ්‍යක්ෂ (ආදායම් හා සේවා - කටුනායක)
**ටී.ඒ.එල්. වීරසිංහ මහතා**
රේගු අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති, සැළසුම් හා පර්යේෂණ)
**එස්. නෙත්කුනනාදන් මහතා**
රේගු අධ්‍යක්ෂ (සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ)
**එම්.යු. එස්. පෙරේරා මහතා**
රේගු අධ්‍යක්ෂ (මධ්‍යම මිල පිරික්සුම්)

**ඒ. කුලේන්ද්‍රන් මහතා**
රේගු අධ්‍යක්ෂ (විශේෂ සේවා)
**එස්. ගුණවර්ධන මහතා**
රේගු අධ්‍යක්ෂ (සැපයුම් අංශය)
**එම්.යූ.එස්. පෙරේරා මහතා**
රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)
**අයි.ජේ. අබේරත්න මිය**
රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)
**ප්‍රදීප් කුමාර මහතා**
රේගු අධ්‍යක්ෂ (කාර්ය මණ්ඩල සේවා)
**කේ.ඩී.නිකලස් මහතා**
රේගු අධ්‍යක්ෂ (විශේෂ කාර්ය හා සුපරීක්ෂණ)
**පී.ටී.ජී. ගුණතිලක මයා**
ප්‍රධාන ගණකාධිකාරී
**ජගත් ඩයස් මහතා**
රේගු අධ්‍යක්ෂ (ආදායම් හා සේවා - ප්‍රාදේශීය)
**කේ.කේ. බාලචන්ද්‍රන් මහතා**
රේගු අධ්‍යක්ෂ (කර්මාන්ත හා සේවා - ප්‍රාදේශීය)
**කේ.කේ. විතාන මහතා**
රේගු අධ්‍යක්ෂ (මගී සේවා - ප්‍රාදේශීය)
**ජී.කේ. වීරසූරිය මිය**
රේගු අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
**යූ.එස්. වනපුෂ්ප මහතා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යා ලේඛන)
**ඒ.කේ.එන්. වික්‍රමසිංහ මහතා**
නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (නිෂ්පාදන බදු)

# සමස්ත කාර්ය සාධනය
# 2014

**ආදායම් එකතුව - 2014**


**ජාතික බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස***




** තාවකාලික දත්ත*

## ආදායම රැස් කිරීම – 2014: බදු සංයුතිය

| කාණ්ඩය | (රු.මිලි.) | මුලු ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| එකතු කළ අගය මත බද්ද (VAT)- ආනයන | 101,412 | 22.4 |
| රේගු ආනයන බද්ද | 80,052 | 17.7 |
| ආනයන සෙස් බද්ද | 35,967 | 8 |
| වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද | 65,849 | 14.6 |
| නිෂ්පාදන බද්ද | 99,350 | 21.9 |
| විශේෂ භාණ්ඩ බද්ද | 47,663 | 10.5 |
| ජාතිය ගොඩ නැගීමේ බද්ද | 22475 | 4.9 |
| අනෙකුත් | 66 | 0 |
| එකතුව | 452,835 | |



# <u>ශ්‍රී ලංකා රේගුව - ආදායම් එකතුව - 2014</u>

| අදායම් කේතය | විස්තරය | සංශෝධිත ඉලක්කය 2014 | ප්‍රගතිය දෙසැම්බර් දක්වා. | | | සංසංදනය 2013 සහ 2014 දෙසැම්බර් දක්වා | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | සත්‍ය | අපගමනය | 2013 | 2014 | අපගමනය | % |
| 1001.01.00 | රේගු ආනයන බද්ද | 85,000 | 85,000 | 77,701 | -7,299 | 74,766 | 77,701 | 2,935 | 3.93 |
| 1001.02.00 | රේගු ආනයන බද්ද | 20 | 20 | 24 | 4 | 22 | 24 | 2 | 9.09 |
| 1001.04.00 | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 80,000 | 80,000 | 68,625 | -11,375 | 61,516 | 68,625 | 7,109 | 11.56 |
| 1001.05.01 | ආනයන සෙස් බදු | 41,500 | 41,500 | 35,609 | -5,891 | 33,011 | 35,609 | 2,598 | 7.87 |
| 1001.05.02 | අපනයන සෙස් බද්ද | 3,500 | 3,500 | 3,085 | -415 | 3,088 | 3,085 | -3 | -0.1 |
| 1001.08.00 | විශේෂ භාණ්ඩ බද්ද | 65,000 | 65,000 | 47,953 | -17,047 | 46,705 | 47,953 | 1,248 | 2.67 |
| | **මුළු රේගු බදු ආදායම** | **275,025** | **275,025** | **232,997** | **-42,028** | **219,108** | **232,997** | 13,889 | 6.34 |
| 1002.05.01 | නිෂ්පාදන බද්ද - සිගරට් | 61,000 | 61,000 | 57,204 | -3,796 | 58,534 | 57,204 | -1,330 | -2.27 |
| 1002.05.02 | නිෂ්පාදන බද්ද - මත්පැන් | - | - | 12 | 12 | | 12 | 12 | |
| 1002.05.03 | **නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම්** | **40,000** | **40,000** | **31,819** | **-8,181** | **27,131** | **31,819** | 4,688 | 17.28 |
| | ***නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම් ( ආනයන)*** | | | *28,732* | | 27,131 | *28,732* | 1,601 | 5.9 |
| | ***නිෂ්පාදන බද්ද - පෙට්‍රෝලියම් ( දේශීය)*** | | | 3,087 | | 0 | 3,087 | 3,087 | |
| 1002.05.04 | නිෂ්පාදන බද්ද - මෝටර් රථවාහන | 70,000 | 70,000 | 76,435 | 6,435 | 55,517 | 76,435 | 20,918 | 37.68 |
| 1002.05.09 | ***නිෂ්පාදන බද්ද - නෙකුත්*** | **7,000** | **7,000** | | **-7,000** | **2,528** | | -2,528 | -100 |
| | නිෂ්පාදන බද්ද - අනෙකුත් - ආනයන | | | | 0 | 1,248 | | -1,248 | -100 |
| | *නිෂ්පාදන බද්ද - අනෙකුත් - දේශීය* | | | | 0 | 1,279 | | -1,279 | -100 |
| | **මුළු නිෂ්පාදන බද්ද ආදායම** | **178,000** | **178,000** | **165,470** | **-12,530** | **143,710** | **165,470** | 21,760 | 15.14 |
| 1002.01.04 | එකතු කළ අගය මත බද්ද - VAT ආනයන | 135,000 | 135,000 | 102,235 | -32,765 | 96,591 | 102,235 | 5,644 | 5.84 |
| 1003.10.00 | **සමාජ වගකීම් බද්ද (SRL)** | **-** | **-** | **-** | **-** | **1** | **-** | -1 | -100 |
| | *සමාජ වගකීම් බද්ද - ආනයන* | - | - | - | - | 1 | - | -1 | -100 |
| | *සමාජ වගකීම් බද්ද - දේශීය* | - | - | - | - | - | - | - | - |
| 1002.12.03 | ජාතිය ගොඩනැගීමේ බද්ද | *19,000* | *19,000* | *16,086* | -2,914 | 22,443 | *16,086* | -6,357 | -28.33 |
| | **මුළු අනෙකුත් බදු ආදායම** | **154,000** | **154,000** | **118,321** | **-35,679** | **119,034** | **118,321** | -713 | -0.6 |
| | **මුළු බදු ආදායම** | **607,025** | **607,025** | **516,788** | **-90,237** | **481,852** | **516,788** | 34,936 | 7.25 |
| 2003.02.17 | ඇඟලුම් අලෙවිය | | | 89 | 89 | 92 | 89 | -3 | -3.26 |
| 2003.02.99 | | | | | - | - | | - | - |
| 2003.99.00 | විවිධ | | | | 0 | 2,141 | | -2,141 | -100 |
| 2003.03.00 | | | | | | | | | |
| | **මුළු බදු නොවන ආදායම** | | | **89** | **89** | **2,233** | **89** | -2,144 | -96.01 |
| | **මුළු ආදායම ( බදු සහ බදු නොවන)** | **607,025** | **607,025** | **516,877** | **-90,148** | **484,085** | **516,877** | 32,792 | 6.77 |

* *අනුමාන දත්ත*


* *දත්ත ලබාගැනීම – ගිණුම් අංශය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

## ඉහළ බදු ආදායම් උපදවන භාණ්ඩ වර්ග පනහ (වර්ගීකරණ පරිච්ඡේද අනුව)

| Rank | HS ඡේද | විස්තරය | මුළු ආදායම |
|---|---|---|---|
| 1 | 87 | වාහන | 120,515,025,852 |
| 2 | 27 | ඛණිජ තෙල් හා ඉන්ධන | 69,859,389,953 |
| 3 | 25 | සිමෙන්ති හා ක්ලින්කර් | 20,968,302,855 |
| 4 | 84 | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 18,543,429,984 |
| 5 | 39 | ප්ලාස්ටික් හා ප්ලාස්ටික්වලින් නිමකළ භාණ්ඩ | 15,793,353,353 |
| 6 | 15 | පාම් තෙල්, පාම් ස්ටියරින් සහ මාගරින් | 15,474,217,487 |
| 7 | 17 | සීනි සහ රසකැවිලි | 15,194,043,120 |
| 8 | 10 | ධාන්‍ය | 13,808,337,424 |
| 9 | 85 | විද්‍යුත් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 12,220,469,525 |
| 10 | 4 | පශු නිෂ්පාදන | 11,697,761,708 |
| 11 | 72 | යකඩ හා වානේ | 9,764,009,126 |
| 12 | 48 | කඩදාසි සහ කඩදාසි බෝඩ් | 9,396,057,519 |
| 13 | 69 | පිඟන්මැටි නිෂ්පාදන | 8,397,588,807 |
| 14 | 7 | කෑමට ගන්නා එළවළු හා අල | 7,964,071,983 |
| 15 | 40 | රබර් සහ ඒවායින් නිමකල භාණ්ඩ | 7,310,689,418 |
| 16 | 22 | පාන වර්ග | 7,089,926,036 |
| 17 | 73 | යකඩ සහ වානේ වලින් නිමකල භාණ්ඩ | 7,034,176,250 |
| 18 | 38 | විවිධ රසායනික නිෂ්පාදන | 5,596,549,586 |
| 19 | 62 | නොගෙතු හෝ ක්‍රෝෂේ නොගෙතු ඇඟලුම් හා රෙදිපිළි උපාංග | 3,511,971,079 |
| 20 | 9 | කෝපි, තේ, මේඩ් හා කුළුබඩු වර්ග | 3,391,102,468 |
| 21 | 19 | පිළියෙළ කල ධාන්‍ය පිටි | 3,181,589,662 |
| 22 | 33 | සුගන්ධ තෙල් හා රෙසිනොයිඩ් වර්ග | 3,162,937,569 |
| 23 | 8 | කෑමට ගන්නා පළතුරු හා ඇට වර්ග | 3,006,046,284 |
| 24 | 32 | සම් පදම් කිරීමට සහ සායම් පෙවීමට ගන්නා සාරක | 2,787,630,317 |
| 25 | 76 | ඇලුමිනියම් හා ඒවායින් සෑදූ භාණ්ඩ | 2,738,769,801 |
| 26 | 3 | මත්ස්‍යයන් හා කවචයන් | 2,608,643,893 |
| 27 | 29 | කාබනික රසායන ද්‍රව්‍ය | 2,497,040,935 |
| 28 | 55 | කෘතිම මූලික කෙඳි වර්ග | 2,475,419,768 |
| 29 | 70 | වීදුරු හා වීදුරු භාණ්ඩ | 2,430,655,298 |
| 30 | 23 | ආහාර නිෂ්පාදනයේදී ඉවත දමන ලද හා අවශේෂයන් | 2,382,771,895 |
| 31 | 83 | ලෝහ වලින් නිමවූ විවිධ භාණ්ඩ | 2,192,439,868 |
| 32 | 16 | මස් වලින්, මාළු වලින් හා කවචයින්ගෙන් කරනු ලබන පිළියෙළ කිරීම. | 2,172,066,502 |
| 33 | 52 | කපු | 2,158,257,150 |
| 34 | 21 | කෑමට යෝග්‍ය සංයෝජන | 2,126,340,564 |
| 35 | 94 | ගෘහ භාණ්ඩ | 2,023,567,609 |
| 36 | 34 | සබන්, කාබනික පෘෂ්ඨ ක්‍රියා කාරක වර්ග | 2,012,200,183 |
| 37 | 31 | පොහොර | 1,853,332,735 |
| 38 | 20 | එළවළු, පළතුරු, බීජ වලින් කල පිළියෙල කිරීම් | 1,835,064,775 |
| 39 | 74 | තඹ හා එයින් සෑදූ භාණ්ඩ | 1,751,400,098 |
| 40 | 28 | අකාබනික රසායන ද්‍රව්‍ය | 1,738,665,987 |
| 41 | 44 | දැව හා දැවයෙන් නිමකල භාණ්ඩ | 1,598,937,669 |
| 42 | 96 | විවිධ නිෂ්පාදන ද්‍රව්‍ය | 1,563,782,633 |
| 43 | 68 | ගලින්, බදාමෙන්, සිමෙන්තිවලින් නිමවූ ද්‍රව්‍ය | 1,533,216,879 |
| 44 | 90 | ඡායාරූපකරණ හා සිනමාකරනයේදී ගන්නා උපකාරක ද්‍රව්‍ය | 1,519,956,249 |
| 45 | 64 | පාවහන් | 1,300,803,618 |
| 46 | 82 | ආයුධ හැඳි ගෑරුප්පු ආදිය | 1,119,374,664 |
| 47 | 11 | ඇඹරුම් කර්මාන්ත නිෂ්පාදන | 997,293,926 |
| 48 | 61 | ගෙතු හෝ ක්‍රෝෂේ නොගෙතු ඇඟලුම් හා රෙදි පිළි උපාංග | 919,167,488 |
| 49 | 14 | උන, කපු ලින්ටර්ස්, | 878,812,857 |
| 50 | 60 | ගෙතු හෝ ක්‍රෝෂේ නොගෙතු රෙදි | 872,301,291 |

## සැලකිය යුතු ආදායම් උපයන භාණ්ඩ අවරෝහණ පිළිවෙලට 2014

| විස්තරය | මුළු ආදායම | මුළු ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|
| මෝටර් වාහන | 120,515,025,852 | 26.6 |
| ඛනිජ තෙල් හා ඉන්ධන | 69,859,389,953 | 15.4 |
| සිමෙන්ති හා සිමෙන්ති ක්ලින්කර් | 20,968,302,855 | 4.6 |
| යන්ත්‍රෝපකරණ | 18,543,429,984 | 4.0 |
| පාම් ඔයිල් , Palm Stearin සහ මාගරින් | 15,793,353,353 | 3.4 |
| ප්ලාස්ටික් හා ආශ්‍රිත භාණ්ඩ | 15,474,217,487 | 3.4 |
| සීනි සහ රස කැවිලි | 15,194,043,120 | 3.3 |
| කිරි නිෂ්පාදන | 13,808,337,424 | 3.0 |
| විදුලි යන්ත්‍රෝපකරණ | 12,220,469,525 | 2.7 |
| ආහාරයට ගන්නා එළවළු හා අල | 11,697,761,708 | 2.6 |
| අනෙකුත් | 138,760,521,556 | 30.6 |




# බදු ආදායම් සංසන්දනය - 2013 සහ 2014

(රු. මිලියන )

| කාණ්ඩය | 2013 | 2014 | DEVIATION |
|---|---|---|---|
| ආනයන බද්ද | 74,765.96 | 74,520.00 | -245.96 |
| අපනයන බද්ද | 21.658164 | 24 | 2.341836 |
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 61,516.09 | 63,327.00 | 1,810.91 |
| සෙස් බද්ද - ආනයන | 33,010.93 | 35,518.00 | 2,507.07 |
| මෝටර් වාහන අනුග්‍රාහකත්ව බද්ද | 0 | 0 | 0 |
| ප්‍රාදේශීය යටිතල සංවර්ධන බද්ද (RIDL) | 1.35 | 0 | -1.35 |
| ආනයන සෙස් බදු | 3,087.14 | 3,085.00 | -2.14 |
| විශේෂ භාණ්ඩ බද්ද | 46,704.89 | 47,834.00 | 1,129.11 |
| මුළු රේගු ආදායම | 219108.0189 | 224,308.00 | 5199.9811 |
| නිෂ්පාදන බදු - සිගරට් | 58,534.24 | 57,205.00 | -1,329.24 |
| නිෂ්පාදන බදු - මත්පැන් | 0.0752 | | -0.0752 |
| නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් | 27,130.55 | 4,296.00 | -22,834.55 |
| නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් (ආනයන) | 27,130.55 | 4,296.00 | -22834.55 |
| නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් (දේශීය) | 0.00 | 0 | 0 |
| | | | |
| නිෂ්පාදන බදු - මෝටර් වාහන | 55,517.12 | 92,320.00 | 36,802.88 |
| නිෂ්පාදන බදු - වෙනත් | 2,423.83 | 2,626.00 | 202.17 |
| නිෂ්පාදන බදු- වෙනත් ආනයන | 1,144.39 | 150.00 | -994.39 |
| නිෂ්පාදන බදු - වෙනත් - දේශීය | 1,279.44 | 2,476.00 | 1196.56 |
| මුළු නිෂ්පාදන බදු ආදායම | 143,605.82 | 156,447.00 | 12,841.18 |
| එකතු කල අගය මත බද්ද ( VAT) ආනයන | 96,590.88 | 101,197.00 | 4,606.12 |
| සමාජ වගකීම් බද්ද ( SRL) | 0.23 | 0 | -0.23 |
| සමාජ වගකීම් බද්ද (SRL) - ආනයන | 0.23 | 0 | -0.23 |
| සමාජ වගකීම් බද්ද (SRL) - දේශීය | 0.00 | 0 | 0 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 22,443.44 | 23,422.00 | 978.56 |
| මුළු වෙනත් ආදායම් බද්ද | 119,034.54 | 124,619.00 | 5,584.46 |
| මුළු ආදායම් බද්ද | 481,748.38 | 505,374.00 | 23,625.62 |
| ඇහලුම් විකිණීම | 91.51 | 89 | -2.51 |
| | 0.00 | 0 | 0 |
| විවිධ | 2,142.35 | 1,186.00 | -956.35 |
| | | | |
| මුළු බදු නොවන ආදායම | 2,233.87 | 1,275.00 | -958.87 |
| මුළු ආදායම ( බදු හා බදු නොවන) | 483982.247 | 506,649.00 | 22666.753 |
| ශුද්ධ තැන්පත් | 1,230.52 | 0.00 | -1230.52 |
| **තැන්පතු ද සමග සමස්ථ ආදායම** | **485212.762** | **506,649.00** | **21436.24** |

බදු ආදායම් සංසන්දනය - 2013 සහ 2014




## වාර්ෂික හා මාසික මුළු රේගු බදු ආදායම් සංසන්දනය - අවුරුදු සහ මාස

(රුපියල් මිලියන)


| මාස | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 17,582 | 20,973 | 33,334 | 36,759 | 39,161 | 35,158 |
| පෙබරවාරි | 16,886 | 27,635 | 29,384 | 32,071 | 31,490 | 30,473 |
| මාර්තු | 31,520 | 28,276 | 38,853 | 45,402 | 41,938 | 38,832 |
| අප්‍රේල් | 19,401 | 25,968 | 33,264 | 40,701 | 39,133 | 40,625 |
| මැයි | 18,666 | 26,127 | 36,451 | 43,343 | 38,875 | 31,561 |
| ජූනි | 21,856 | 26,949 | 36,743 | 46,809 | 36,363 | 43,156 |
| ජූලි | 23,788 | 35,494 | 37,725 | 32,940 | 46,159 | 40,630 |
| අගෝස්තු | 23,964 | 34,429 | 38,763 | 33,310 | 37,737 | 40,857 |
| සැප්තැම්බර් | 57,971 | 34,620 | 40,482 | 33,643 | 36,258 | 45,519 |
| ඔක්තෝබර් | 22,424 | 38,703 | 37,156 | 33,890 | 42,603 | 44,997 |
| නොවැම්බර් | 26,380 | 40,527 | 40,537 | 33,073 | 41,169 | 44,434 |
| දෙසැම්බර් | 38,545 | 41,201 | 57,650 | 31,916 | 65,227 | 47,109 |
| **එකතුව** | **318,982** | **380,903** | **460,343** | **443,858** | **498,126** | **503,351** |

## වාර්ෂික හා මාසික රේගු බදු ආදායම් සංසන්දනය - අවුරුදු සහ මාස

(රුපියල් මිලියන)




## මුළු රේගු බදු වාර්ෂික ආදායම් සංසන්දනය




## මෝටර් වාහන ආනයනය
(ආනයනිත ඒකක)


| ඒකක | | | |
|---|---|---|---|
| | **2012** | **2013** | **2014** |
| ජනවාරි | 50,311 | 31,973 | 28961 |
| පෙබරවාරි | 38,477 | 19,372 | 22781 |
| මාර්තු | 53,228 | 22,667 | 31942 |
| අප්‍රේල් | 33,767 | 47,239 | 24676 |
| මැයි | 31,080 | 34,541 | 19851 |
| ජූනි | 19,862 | 28,484 | 28344 |
| ජූලි | 17,519 | 32,489 | 40658 |
| අගෝස්තු | 19,800 | 31,879 | 48651 |
| සැප්තැම්බර් | 33,313 | 28,674 | 68599 |
| ඔක්තෝබර් | 43,758 | 29,577 | 58907 |
| නොවැම්බර් | 25,505 | 22,174 | 47054 |
| දෙසැම්බර් | 26,668 | 31,974 | 58240 |
| එකතුව | **393,288** | **363,056** | **478664** |



# මෝටර් රථ වාහන ආනයනය

## CIF මිළ


| | CIF (රුපි.) | | |
|---|---|---|---|
| | 2012 | 2013 | 2014 |
| ජනවාරි | 21,256,336,140 | 9,218,870,452 | 10,871,256,577 |
| පෙබරවාරි | 16,954,170,840 | 6,820,909,872 | 9,849,389,666 |
| මාර්තු | 24,426,409,258 | 8,909,287,488 | 15,121,975,481 |
| අප්‍රේල් | 16,083,149,987 | 10,181,244,706 | 10,250,247,330 |
| මැයි | 15,659,343,418 | 10,177,872,461 | 9,430,318,276 |
| ජුනි | 10,556,027,168 | 10,578,778,215 | 11,072,682,201 |
| ජූලි | 10,720,764,216 | 13,111,273,250 | 14,500,538,888 |
| අගෝස්තු | 10,329,151,341 | 13,919,258,974 | 16,128,300,040 |
| සැප්තැම්බර් | 8,438,231,519 | 10,940,010,209 | 19,172,584,501 |
| ඔක්තෝබර් | 7,275,261,435 | 13,074,143,192 | 21,727,938,606 |
| නොවැම්බර් | 8,406,879,450 | 10,489,455,387 | 19,086,904,228 |
| දෙසැම්බර් | 7,179,033,205 | 9,443,419,725 | 27,051,414,531 |
| එකතුව | **157,284,757,977** | **126,864,523,931** | **184,263,550,325** |



# මෝටර් රථ වාහන ආනයන

## බදු ආදායම

| | ආදායම (රු.) | | |
|---|---|---|---|
| | **2012** | **2013** | **2014** |
| ජනවාරි | 11,110 | 6,110 | 4,809 |
| පෙබරවාරි | 8,233 | 3,900 | 4,159 |
| මාර්තු | 13,912 | 5,778 | 5,558 |
| අප්‍රේල් | 11,784 | 6,648 | 6,577 |
| මැයි | 12,364 | 6,821 | 3,291 |
| ජූනි | 5,354 | 6,985 | 7,916 |
| ජූලි | 5,456 | 9,300 | 6,070 |
| අගෝස්තු | 5,919 | 9,302 | 5,521 |
| සැප්තැම්බර් | 5,414 | 7,464 | 7,384 |
| ඔක්තෝබර් | 4,923 | 8,433 | 7,410 |
| නොවැම්බර් | 4,996 | 7,029 | 12,545 |
| දෙසැම්බර් | 5,008 | 6,515 | 21,080 |
| **එකතුව** | **94,473** | **84,285** | **92,320** |



# නීති බලාත්මක කිරීමේ පර්ෂදය

# නිවාරණ අංශය

## හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුවේ නීති බලාත්මක කිරීමේ ප්‍රධාන අංශය වන්නේ නිවාරණ අංශයයි. තවද නිවාරණ අංශය මඟින් රේගුවේ සමස්ත ක්‍රියාකාරී ස්ථානවල සුපරීක්ෂාව භාරව කටයුතු කරන අතර, කොළඹ වරාය හා අනෙකුත් වරායන්, ජාත්‍යන්තර ගුවන් තොටුපල, නිදහස් වෙළඳ කලාප, ආපනයන ප්‍රවර්ධන කලාප, භාණ්ඩ පරීක්ෂණ අංගන, දේශීය අභ්‍යන්තර නිශ්කාෂණ ආයතන, වෙරළ හා මුහුදු කලාප හා ජල මාර්ග ඒ අතරින් විශේෂ වේ.

නිවාරණ අංශය ශාඛා කීපයකින් සමන්විත වන අතර ඒවා නම්, පාලන ශාඛාව, "පී" ශාඛාව, මෙහෙයුම් ශාඛාව, විමර්ශන ශාඛාව, මෙගා පෝට් සුපරීක්ෂණ ශාඛාව, මධ්‍යම විකුණුම් ශාඛාව, සමුද්‍ර ශාඛාව සහ අනෙකුත් උපාය මාර්ගික ස්ථානවල පිහිටි උප රේගු කාර්යාල වේ.

## ප්‍රධාන කාර්යයන්.

1. නීති විරෝධී ලෙස රටට භාණ්ඩ ගෙන ඒම, මත්ද්‍රව්‍ය වැරදි හා වාණිජ වංචා නිවාරණය කිරීම (වැළැක්වීම.)
2. රේගු වැරදි සම්බන්ධ තොරතුරු ලබා ගැනීම, ඒ සම්බන්ධ ක්‍රියා මාර්ග ගැනීම.
3. රේගු වැරදි හසුකර ගැනීම, රේගු බදු නොගෙවූ භාණ්ඩ අත් අඩංගුවට ගැනීම, රේගු විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීම, නඩු කටයුතු මෙහෙය වීම.
4. රජයට ලැබීමට නියමිත ආදායම් ලැබෙන බවට සහතික වීම.
5. රටේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අවශ්‍යතාවයන් සුරක්ෂිත කිරීම හා එම ක්ෂේත්‍රයේ නීති හා රෙගුලාසි බලාත්මක කිරීම.
6. කොළඹ වරාය ඇතුළු අනෙකුත් වරායන්, බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළ හා මත්තල මහින්ද රාජපක්ෂ අන්තර් ජාතික ගුවන්තොටුපළ ආවේක්ෂණ කටයුතු.
7. මුහුදු යාත්‍රා සංචලනය පාලනය කිරීම හා වෙරළ ආරක්ෂිත මෙහෙයුම් කටයුතු.
8. ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ විධිමත් ලෙස බැහැර කිරීම.

### 1. නීති විරෝධී ලෙස රටට ගෙන එන භාණ්ඩ, වාණිජ වංචා හා මත්ද්‍රව්‍ය වැරදි වැළැක්වීම;

කොටුව ප්‍රධාන නිවාරණ කාර්යාලය පිහිටි ස්ථානය වෙනස් වූ අතර ප්‍රධාන ශාඛා 3ක් කොළඹ වරායෙන් ඇතුළත හා පිටත ස්ථාන වෙත මාරු කරන ලදී. වර්තමානයේ පාලන ශාඛාව සහ රේගු අධ්‍යක්ෂ(නිවාරණ) ගේ කාර්යාලය රේගු ප්‍රධාන මූලස්ථානයේ පිහිටා තිබේ. මීට අමතරව රේගු උප නිවාරණ කාර්යාල ප්‍රධාන මුහුදුබඩ නගරවල පිහිටා ඇත. ඒවා නම්, ත්‍රිකුණාමලය, ගාල්ල, කොග්ගල, මීගමුව හා සින්නපාඩු වේ.

රට තුළට හා ඉන් පිටත සිදුවන නීති විරෝධී භාණ්ඩ ප්‍රවාහනය, වෙළඳ වංචා හා මත්ද්‍රව්‍ය වැරදි වැළැක්වීම සඳහා මෙම කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිවාරණ නිලධාරීන් ක්‍රියාකාරීව හා කාර්යක්ෂමව පියවර ගෙන ඇත. මීට අමතරව, නිදහස් වෙළඳ කලාප තුළ පිහිටි නිවාරණ කාර්යාලවලට අනුයුක්ත කරන ලද නිලධාරීන් විසින් සිදුකරනු ලැබූ මෙහෙයුම් මගින් රේගු බදු අයවිය යුතු භාණ්ඩ මෙම කලාපවලින් බැහැරව යෑම වැළැක්වීමට කටයුතු කර ඇත.

රටේ සාමය ස්ථාපිත කිරීමෙන් පසු යාපනයේ සහ මන්නාරමේ රේගු නිවාරණ උප කාර්යාල නැවත ආරම්භ කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. එසේ වුවත්, මුහුදේ යාත්‍රා කිරීමට සුදුසු මුර යාත්‍රා හා පුහුණු නිලධාරීන්ගේ අඩුපාඩු නිසා සමුද්‍ර නීති බලාත්මක කිරීම නැවත ආරම්භ කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී ඇත. කෙසේ හෝ මේ පිළිබඳව සලකා බැලීමට කමිටුවක් පත් කර ඇති අතර අදාල වාර්තාව මේවනවිටත් ඉදිරිපත් කර ඇත.

හම්බන්තොට වරායේ හා මහින්ද රාජපක්ෂ අන්තර්ජාතික ගුවන් තොටුපලේ රේගු නිවාරණ කටයුතු ද මේ වන විට ක්‍රියාත්මකව පවතී.

## 2. අත්අඩංගුවට ගැනීම්, තහනම් කිරීම්, විමර්ශනය හා නඩු මෙහෙයුම්.

රේගු නිවාරණ අංශය විසින් ප්‍රධාන වශයෙන් පහත සඳහන් පරිදි රේගු නීති උල්ලංඝනය කිරීම් හොරබඩු ජාවාරම්, වෙළඳ වංචා, මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් තොරතුරු ලබාගනී:

a) නිවාරණ අංශයට අනුයුක්ත කරන ලද නිවාරණ නිලධාරීන්ගේ පුද්ගලික ඔත්තුකරුවන් මඟින්.
b) මහජනතාවගෙන් ලබා ගන්නා ඔත්තු මඟින්.

මීට අමතරව, නැව් බඩු ලේඛන හා ආනයන ලේඛන උපයෝගී කර ගෙන නිවාරණ නිලධාරීන් විසින් රේගු වංචා රැසක් අනාවරණය කර ගැනීමට සමත්ව ඇත. එසැනින් පරිගණක ගත කළ තොරතුරු ඇසුරෙන් වංචා සහගත ආනයනකරුවන් හසු කර ගැනීමේ ප්‍රවණතාව නැව් බඩු ලේඛන හා ආනයන සටහන් කර ඇසුරෙන් කරන වැටලීම්වලට වඩා ඉහළ මට්ටමක පවතී.

සොයාගත් තොරතුරු ආශ්‍රයෙන් කළ වැටලීම් මඟින් හොරබඩු ලෙස හෝ රේගුවට ප්‍රකාශ නොකර ආනයනය කළ රේගු තීරු ගාස්තු නොගෙවූ භාණ්ඩ විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට, රේගු නිවාරණ අංශය සමත් විය. අදාළ විර්ශන කටයුතු හා රේගු නීති සම්බන්ධ කටයුතු නිවාරණ නිලධාරීන් විසින්ම සිදුකරන ලදී.

රේගු නීති බලාත්මක කිරීමේ අංශයන්හි අඩුපාඩුවක්ව පවතින මානව සම්පතෙහි කාර්ය සාධනය ඉහළ නැංවීමට හැකිවන පරිදි විධිමත් අවදානම් කළමනාකරණ වැඩසටහනක් දියුණු කිරිම සඳහා තාක්ෂණ සහාය ලබාගැනීමට ඉල්ලීම් කළද, එය තවමත් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. තවද නීති බලාත්මක කිරීමේ රාජකාරි සඳහා විශේෂ අවධානය යොමු කරමින් නිවාරණ නිලධාරින් සඳහා ධාරිතාව වර්ධනය කිරීමේ පුහුණු සැසි පැවැත්වීමේ අවශ්‍යතාවය පවතී.

## 3. නියමිත පරිදි රාජ්‍ය ආදායම එකතු කරන බවට වගබලා ගැනීම.

ආනයන හා අපනයන මඟින් ලැබෙන රාජ්‍ය ආදායම එකතු කිරීම රේගුවේ ප්‍රධාන කාර්ය භාරයකි. රේගු දෙපාර්තමේන්තුව මඟින් අව්‍යාජ වෙළඳුන් වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා හඳුන්වා දෙනු ලැබූ විශාල වශයෙන් ප්‍රතිඵල ගෙන දෙන්නා වූ පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග රාජ්‍ය ආදායම වංචා කිරීමට නැඹුරුවක් ඇති අයට රේගු දැලෙන් රිංගා යාමට සුළු ඉඩක් ලැබී ඇත. බහුතරයක් වෙළඳුන් ස්වෙච්ඡාවෙන්ම නීතියට අනුකූලව කටයුතු කරන අතර, සුලුතරයක් වැරදි කිරීමට නැඹුරුවක් ඇත. සුළුතරයක් වෙළඳුන් ආනයනික භාණ්ඩ සඳහා වැරදි වර්ගීකරණය, මිල අඩුවෙන් සඳහන් කිරීම, හා භාණ්ඩ රේගුවට ප්‍රකාශ නොකර සිටීම වැනි රේගු වැරදිවලට යොමු වේ.

2014 වසර තුළ දී නිවාරණ අංශය මඟින් මෙහෙයවනු ලැබූ රේගු පරීක්ෂණ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ලියාපදිංචි වූ පරික්ෂණ සංඛ්‍යාව | | **4458** |
| සම්පූර්ණ කළ පරීක්ෂණ සංඛ්යාව | | 3918 |
| වැරදි තහවුරු කර අභිමි කිරීම්/ දඬ නියම කළ පරීක්ෂණ සංඛ්‍යාව | | 586 |
| දඩ හා අභිමි කිරීම් මඟින් අය කළ මුලු මුදල | රු. මිලියන | 245 |
| අමතර සටහන්කර ( A/E) මඟින් අයකළ | රු. මිලියන | 48 |
| රාජසන්තක කළ භාණ්ඩ විකිණීම් මඟින් අයකරගත් මුලු මුදල | රු. මිලියන | 91 |
| අතිකාල හා වෙනත් අයකර | රු.මිලියන | 466 |
| සම්පූර්ණ අයකරගත් | රු. මිලියන | 850 |

## 4. රටේ සමාජ ආර්ථික, සංස්කෘතික, පරිසර විද්‍යාත්මක හා පාරිසරික වැදගත්කමක් ඇති දෑ ආරක්ෂණය සහ අදාළ නීති, රෙගුලාසි බලාත්මක කිරීම

රටේ පවතින සමාජ ආර්ථික, සංස්කෘතික, පරිසර විද්‍යාත්මක හා පාරිසරික වශයෙන් වැදගත් කමක් දක්වන දෑ ආරක්ෂණය කිරීමට නිවාරණ අංශයට එහි මෙහෙයුම් අනුව හැකි වී ඇත.

රේගු ආඥා පනත යටතේ එන රෙගුලාසිවලට අමතරව, නිවාරණ අංශයේ නිලධාරීන් විසින් වෙනත් නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහතික කරනු ලබයි.
උදා-

1. ගිණි අවි සහ පතරොම් පනත
2. වන සත්ත්ව සහ ශාක පිළිබඳ පනත
3. ආනයන සහ අපනයන පාලක පනත
4. ඖෂධ සුවඳ විලවුන් හා උපකරණ පනත
5. විදුලි සංදේශ නියාමන කොමිෂන් පනත
6. ආහාර හා ඖෂධ පනත
7. විනිමය පාලන පනත
8. බුද්ධිමය දේපළ පනත

## 5. කොළඹ වරාය අනෙකුත් වරායන්, නිදහස් වෙළෙඳ කලාප සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සුපිරික්සුම

කොළඹ වරායේ සුපරීක්ෂාව නිවාරණ අංශයට අයත් කොටුව නිවාරණ කාර්යාලය හා කොච්චිකඩේ නිවාරණ කාර්යාලය මගින් සිදු කරන අතර, කොටුව ප්‍රදේශයේ හා කොච්චිකඩේ ප්‍රදේශයේ සුපරීක්ෂාව පිළිවෙලින් ඉහත කාර්යාල වෙත පැවරී ඇත. දිනපතා පැය 24 පුරාම මෙම කාර්යාල විවෘතව පවතින අතර, ඒ ඒ කාර්යාල සඳහා වෙන වෙනම ගොඩබිම රාජකාරි භාර නිලධාරියෙක් **(LDO)** හැම මොහොතකම රාජකාරියේ නියුතු වෙයි. මෙම නිලධාරීන් තමන්ට අදාළ ගේට්ටු නිල පිරික්සුමට භාජනය කරන අතර, එමගින් එම අදාළ ස්ථානවල නියමිත නිලධාරීන් සේවයේ යෙදී සිටින බවට තහවුරු කර ගනී.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සහ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ නයිකන්දේ පිහිටි උප නිවාරණ කාර්යාලයෙනි. එලෙසම බියගම පිහිටි උප නිවාරණ කාර්යාලය මගින් බියගම නිදහස් වෙළඳ කලාපයේ කටයුතු අධීක්ෂණය කෙරේ.

කෙසේ වුවත්, පල්ලෙකැලේ, හොරණ, මීරිගම යනාදී අපනයන සැකසුම් කලාප නිවාරණ අංශයේ සුපරීක්ෂණය යටතේ නොපවතී. එනිසා එම කලාප ආශ්‍රිතව උප නිවාරණ කාර්යාල පිහිටුවීම හෝ එම කලාපවලට උප නිවාරණ කාර්යාලවලින් නිලධාරීන් පත් කිරීම රේගු කටයුතු සිදු කිරීමට මහත් වූ අවශ්‍යතාවයකි.

එසේ වුනත් වර්තමානයේ දික්ඕවිට මත්ස්‍ය වරායේ ක්‍රියාකාරකම් ආරම්භ වූ හෙයින් ඒ කාර්යාල හා නවාතැන් පහසුකම් අවශ්‍යතා සම්බන්ධ තොරතුරු ප්‍රධාන කාර්යාලයට දැනුම් දී ඇති අතර මේදක්වා එම පහසුකම් සලසා දී නොමැත. එම නිසා නිවාරණ අංශයේ ක්‍රියාකාරකම් දික්ඕවිට මත්ස්‍ය වරායේ ආරම්භ කර නොමැත.

## 6. නාවික යාත්‍රා මෙහෙයුම් පාලනය සහ දේශ සීමා මෙහෙයුම්

හම්බන්තොට වරාය ද ඇතුලුව ප්‍රධාන වරායන් හතරෙහි නාවික යාත්‍රා මෙහෙයුම් පාලනය නිවාරණ අංශය සතු වගකීමකි. කොටුව නිවාරණ කාර්යාලය මගින් කොළඹ වරායේ එම රාජකාරි සිදු කරන අතර, ගාල්ල, ත්‍රිකුණාමලය හා හම්බන්තොට වරායන්වල දී අදාළ ස්ථානවල උප නිවාරණ කාර්යාල මගින් එම රාජකාරි සිදු කරනු ලැබේ.

කොටුව නිවාරණ කාර්යාලය මගින් දවසේපැය 24 පුරා වරාය රාජකාරි භාර නිලධාරීවරයෙකු (HDO) නාවික යාත්‍රා මෙහෙයුම් රාජකාරි සඳහා යොදවනු ලබයි. ඔහු වරායට සේන්දු වන නැව්වලට ගොඩවන අතර, එහිදී අදාළ නැව අවසන් වරට පිටත් වූ වරායෙන් නිකුත් කෙරුණු නික්ම යාමේ අවසර පත්‍රය තිබේදැයි විමසිලිමත් වෙයි. අදාළ නැවේ සියලු නාවුකයින්ට අදාළ ප්‍රකාශ පත්‍රය ද ඔහු පරීක්ෂා කරයි. (IMO Crew declarations) ආනයන බඩු ලේඛනය, නැවෙන් නැවට මාරු කරන භාණ්ඩ ලේඛනය හා නැවෙහි කැටුව රැගෙන යන භාණ්ඩ ලේඛන රේගුවට ප්‍රකාශ කර භාරදීම කොළඹ වරායට සේන්දු වන සෑම නැවකම දේශීය නියෝජිතගේ (අදාළ නැවේ කපිතාන්ගේ නියෝජිත වශයෙන්) වගකීමකි.

අදාල නැවේ කපිතාන්ගේ නියෝජිත වශයෙන් සිටින දේශීය නියෝජිත විසින් අදාළ සියලු රාජකාරිමය අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ පසු සෑම නැවක් සඳහාම පිටත්වීමේ අවසරය "Outward Clearance" වරාය රාජකාරි භාර නිලධාරියා විසින් නිකුත කරනු ලබයි.

දැනට නැවේ දේශීය නියෝජිත විසින් අපනයන නැව් බඩු ලේඛනය export cargo manifest නිවාරණ කාර්යාලයට භාර නොදෙන බැවින් පිටත්වීමේ අවසරය ලබා දෙන නිලධාරියාට අදාළ නික්ම යන නැවේ ඇති අපනයන භාණ්ඩ දත්ත පිළිබඳ වැටහීමක් නැත.

## 7. ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කරන ලද භාණ්ඩ (බැහැර කිරීම) අලෙවි කිරීම

මුලු දෙපාර්තමේන්තුවට අයත් විවිධ අංශ හා ශාඛා මගින් තහනම් කරනලද හා රාජසන්තක කරන ලද භාණ්ඩ විකිණීමේ බලය මධ්‍යම විකුණුම් අංශය වෙත පවරා ඇත. රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකිණීම සම්බන්ධ ප්‍රතිපාදන රේගු ආඥා පනත මගින් සලසා ඇත. රජයේ මුදල් රෙගුලාසි යටතේ ස්ථාපිත කර ඇති ටෙන්ඩර් මගින් විකිණීමේ පටිපාටිය එම වෙන්දේසිවලදී අනුගමනය කරනු ලැබේ.

| ප්‍රධාන ක්‍රියාකාරකම 01<br>කොළඹ වරායේ සියලු ප්‍රවේශ ද්වාර අසල CCTV කැමරා සවි කිරීම | | | | |
|---|---|---|---|---|
| **කාර්යය** | | **ඉලක්කය** | **තත්‍යය** | **ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු** |
| I. දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම | 1. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම | 1 වන කාර්තුව | 1 වන කාර්තුව | |
| II. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග සාකච්ඡා පැවැත්වීම | 1. යටිතල පහසුකම් සම්පාදනය කිරීම පිළිබඳව ශ්‍රී.ල.ව.අ. සමග රැස්වීමක් පැවැත්වීම<br>2. CCTV කැමරා සවි කළ යුතු ප්‍රධාන ස්ථාන හඳුනා ගැනීම | 1 වන කාර්තුව | 1 වන කාර්තුව | මේ වන විටත් කැමරා පද්ධතියක් සවි කොට ඇති බව ශ්‍රී.ලං.ව.අ. විසින් දැනුම් දෙනු ලැබීය.<br>(ඉදිරියේදී මෙම පද්ධතිය අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සහාය ශ්‍රී.ලං.ව.අ. යෙන් ඉල්ලා සිටිනු ලැබේ.) |
| II. අරමුදල් රැස් කිරීම | අවශ්‍ය මිලදී ගැනීම් ආදිය පිළිබඳව DC සංවිධාන දැනුවත් කිරීම | | | ඉහත කරුණු හේතුවෙන් ප්‍රගතිය මන්දගාමී විය |
| V. සවි කිරීම | I. සවි කිරීම සම්පූර්ණ කිරීම | | | සැලසුම අනුව කටයුතු කිරීමට නොහැකි විය |
| V. අධීක්ෂණය හා සුපරික්ෂණය කිරීම | DC/DDC /(පරීක්ෂණ) / ජංගම ඒකකය අධීක්ෂණ යාන්ත්‍රණය ලෙස කටයුතු කරයි | | | සැලසුම අනුව කටයුතු කිරීමට නොහැකි විය |

# සමාජ ආරක්ෂණ අංශය

## හැඳින්වීම

සමාජ ආරක්ෂණය තහවුරු කිරීම සඳහා මෙතෙක් රේගුවේ විවිධ අංශ යටතේ ක්‍රියාත්මක වූ ශාඛා කීපයක් සම්බන්ධ කරමින් සමාජ ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා වෙනමම අංශයක් ස්ථාපිත කරන ලදී. රේගු නීතිය හා අනෙකුත් සම්බන්ධිත නීති දැඩිවම බලාත්මක කිරීම පිණිස මත්ද්‍රව්‍ය නිවාරණ අංශය, වරාය පාලන අංශය, පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුම ආරක්ෂණ අංශය යන අංශ හඳුනාගෙන ඇත.

## ප්‍රධාන කාර්ය භාරයන්

රේගු කාර්යාල තුළ දී වෙළඳාම සඳහා පහසුකම් සැලසීමත්, පවතින නීති බලාත්මක කිරීම තුළින් නියමිත බදු ආදායම එකතු කිරීම සහතික කරන අතරම නීති විරෝධී ලෙස මෙරටට ඇතුලුවන හෝ පිටව යන මත් ද්‍රව්‍ය අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය වැළැක්වීම හා තහනම් කිරීමත් පාරිසරික, ජෛව විවිධත්ව, සංස්කෘතික, ජාතික උරුමයන් හා පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීම මෙම අංශයේ කාර්ය භාරය වේ.

## මත් ද්‍රව්‍ය පාලන අංශය

සමාජ ආර්ථික, සෞඛ්‍ය හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරන අතරම, ආනයන අපනයන, තැපැල් තෑගි පාර්සල් කුරියර් සේවය මගීන් හා මගීන්ගේ ගමන් බඩු ආදිය මගින් සිදු විය හැකි මත් ද්‍රව්‍ය හා අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය නීති විරෝධී සංසරණය රේගු හා අනෙකුත් සම්බන්ධිත නීති බලාත්මක කිරීම තුළින් වැළැක්වීම පිණිස මත් ද්‍රව්‍ය නිවාරණ අංශය ස්ථාපිත කරන ලදී.

## ප්‍රධාන කාර්ය භාරයන්

1. ගුවන් තොටුපළේ පැය 24 පුරා සුපරීක්ෂාව.
2. ගුවන් බඩු මුහුදු බඩු, තැපැල් හා කුරියර් අංශවල අඟහු සුපරීක්ෂාව
3. ගුවන් හා මුහුදු මගින් සිදු වන වාණිජමය ආනයන හා අපනයන හරහා සිදුවිය හැකි මත් ද්‍රව්‍ය හා අවමානසික තත්ත්ව කෙරෙහි බලපාන ද්‍රව්‍ය නීති විරෝධී සංසරණ හඳුනා ගැනීම හා වැළැක්වීම.
4. විශ්වාසනීය ඔත්තු විමර්ශනය කිරීම
5. පුහුණු හා දැනුවත් කිරීමේ පුහුණු සැසි පැවැත්වීම
6. precursor රසායන ද්‍රව්‍ය ආනයනය transshipments (නැවෙන් නැවට මාරු කිරීම) අපනයනය අධීක්ෂණය කිරීම
7. පොලිස් මත් ද්‍රව්‍ය කාර්යාංශය සමග සාමූහික මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍යය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| (1) මගීන් විසින් ගමන් බෑගවල සඟවා රැගෙන එන මත්ද්‍රව්‍ය හා මාදක ද්‍රව්‍ය සොයා ගැනීම | | | |
| 1. සැක කටයුතු ගුවන් මාර්ග හා මගීන් ඉලක්ක කිරීම | 100% | 100% | |
| 2. මගී ගමන් බෑග වල සඟවා ඇති මත්ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා සුදුසු යන්ත්‍රයක් මිලදී ගැනිම | 100% | 0% | ස්කෑනර් යන්ත්‍රය තවම සාකච්ඡා මට්ටමේ පවතී. |

| | | | |
|---|---|---|---|
| 3. ඛ.ජා.ගු සේවා මුර වලට මත්ද්‍රව්‍ය අංශයේ සහකාර රේගු අධිකාරීන් යෙදවීමට අතිරේකව මත්ද්‍රව්‍ය අංශයේ අනෙකුත් නලධාරීන් විසින් නිරන්තර සෝදිසි කිරීම් හා කණ්ඩායම් සෝදිසි පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම | 100% | 100% | |
| (2) කුරියර් සේවා හා පාර්සල් තැපැල් මගින් ජාවාරම් කෙරෙන මත්ද්‍රව්‍ය හා මාදක ද්‍රව්‍ය සොයා ගැනීම | | | |
| 1. රට තුළට ගෙන එනු ලබන පාර්සල් නිරන්තර පරීක්ෂාවට භාජනය කිරීම හා එම පරීක්ෂාවන් පිළිබඳ වාර්තා ඉදිරිපත්කිරීම | 100% | 100% | |
| (3) UNODC හා WCO හි මාර්ගෝපදේශකය මත පරිසනක පාලන වැඩසටහන් ස්ථාපිත කිරිම | 100% | 100% | *** දැනට මෙම කාර්යය ඉටු කරනු ලබන්නේ වරාය පාලන ඒකකය විසිනි. |
| 1. බහාලුම් ගමන් මාර්ග ලුහු බැඳීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම | 100% | 0% | |
| 2. වාණිජ බහාලුම් වල සඟවා රැගෙන එන මත්ද්‍රව්‍ය සොයාගැනීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම | 100% | 0% | |
| 3. සැක කටයුතු මුහුදු ගමන් මාර්ග හා ආනයනකරුවන් ඉලක්ක කිරීම | 100% | 0% | |
| 4. සැක කටයුතු බහාලුම් පරීක්ෂා කිරීම සඳහා රඳවා ගැනීම | 100% | 0% | |
| (4) වෙරළ තීරය ඔස්සේ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් පරීක්ෂාවට ලක් කිරීම හා ඒවා වැලැක්වීමට අවශ්‍ය පියවර ගැනීම | | | |
| 1. දේශ සීමා හරහා මත්ද්‍රව්‍ය ජාවාරමේ නියැලෙන අපරාධකරුවන් භාවිතා කරනු ලබන නව උපක්‍රම අවබෝධ කර ගැනීම | 100% | 100% | |
| 2. විවෘත මුහුදු මාර්ග ඔස්සේ මෙරටට පැමිණෙන මත්ද්‍රව්‍ය වල බලපෑම අධ්‍යයනය කිරීම | 100% | 100% | |
| (5) දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් | | | |
| 1. ඉල්ලුම පහළ දැමීම පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 0% | % | |

| | | | |
|---|---|---|---|
| 2. NDDCB හා මානව සම්පත් අංශයේ සහාය මත රේගු කාර්ය මණ්ඩල පුහුණු කිරීම | 100% | 100% | |
| (6) අනෙකුත් ආයතන සමග සහයෝගිතාවය ගොඩනැගීම | | | |
| 1. NDDCB, PNB, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව හා වෙනත් ආයතන සමග එක්ව මත් ද්‍රව්‍ය ජාවාරම් කිරීමේ තත්ත්වයන් පිළිබඳ සාකච්ඡා හා රැස්වීම් පැවැත්වීම | 100% | 100% | |

## ජෛව විවිධත්ව, සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂණ අංශය

වෙළඳාම සඳහා පහසුකම් සලසමින්, නියමිත බදු ආදායම සුරක්ෂිත කරන අතරේ නීති විරෝධී වන සත්ව වෙළඳාම වැළැක්වීමට පියවර ගනිමින් - පාරිසරික, ජෛව විවිධත්ව හා ජාතික උරුමයන් ආරක්ෂා කිරීම පිණිස මෙම අංශය ස්ථාපිත කරන ලදී.

**ප්‍රධාන කාර්ය භාරයන්:**

1. දේශසීමා අතරේ ජෛව විවිධත්ව ගණයට අයත් භාණ්ඩ සංචලනයේදී අදාල ජාතික හා ජාත්‍යන්තර නීති බලාත්මක කිරීම.
2. සියළුම ජෛව විවිධත්ව සම්බන්ධකම් ඇති ආනයන හා අපනයනවල විස්තර වර්ගීකරණ හා මිල සෝදිසි කිරීම.
3. වනසත්ව හා වෘක්ෂලතා සම්බන්ධ ආනයන හා අපනයන් පාලනය සඳහා වන බලපත්‍ර අවශ්‍යතාවයන් සෝදිසි කිරීම හා එවැනි ආනයන හා අපනයනවල අවිධිමත් භාවය නිසා රේගු ක්‍රියාදාමයන්ට වන බලපෑම සොයා බැලීම.
4. ජීව විද්‍යාත්මක සමතුලිතතාවයට හානි නොවන ආකාරය, අප රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වන සත්ව හා වෘක්ෂලතා ආනයන හා අපනයන දිරිමත් කිරීම.

| ප්‍රධාන කාර්යයන් | ඉලක්කය (අදාල වේ නම්) | 2014.11.30 දිනට ප්‍රගතිය | විශේෂ සටහන් |
|---|---|---|---|
| 1. BCNP/BPTF කාර්ය මණ්ඩල සඳහා වන සත්ව හා වෘක්ෂලතා හඳුනාගැනීම පිළිබඳ උසස් පුහුණුව | BCNP/BPTF කාර්යමණ්ඩලයේ දැනුම ඉහළ දැමීම | 100% | ශ්‍රී ලංකාවේ ආක්‍රමණකාරී ආගන්තුක විශේෂයන් පිළිබඳව රේගු නිලධාරීන් පුහුණු කොට ඇත. |
| 2. වනසත්ව හා වෘක්ෂලතා සහ පුරාවස්තු හඳුනාගැනීම පිළිබඳ සාමාන්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන (රේගු නිලධාරීන් සඳහා) | සාගර ජෛව විවිධත්වය පිළිබඳව රේගු නිලධාරීන්ගේ දැනුම ඉහළ දැමීම | 100% | ත්‍රිකුණාමලයේ පරෙවි දූපතේ පුහුණු වැඩසටහන පැවැත්විණි. |

| | | | |
|---|---|---|---|
| 3. BCNP/BPTF කාර්ය මණ්ඩලය පුහුණු කිරීම (දේශීය සහ විදේශීය) | රේගු නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම | 100% | ආගන්තුක ශාඛ විශේෂයන් හඳුනාගැනීම කළමනාකරණය පාලනය හා රට තුළ ඒවා පැතිරීම වැලැක්වීම පිළිබඳව රේගු නිලධාරීන් පුහුණු කොට ඇත. මේ සඳහා තායිලන්තයේ පරිසර ආරක්ෂාව පිළිබඳ බහුපාර්ශ්වික පාරිසරික ගිවිසුම ප්‍රකාර තායිලන්තයේ UNEP පාඨමාලාවේ සහාය ලබා ගැනිණ. |
| 4. බ.ජා.ගු. හරහා ශාඛ හා සත්ව කොටස් සංසරණය අධීක්ෂණය කිරීම (ආනයන) | | 30% | කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නැත. |
| 5. ගුවන් භාණ්ඩ හරහා ශාඛ හා සතුන් ආනයනය කිරීම සතොයක්ෂණය හා අධීක්ෂණය කිරීම | | 50% | කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නැත. |
| 6. හඳුනාගැනීමේ නාමාවලී සකස් කිරීම | | | මුදල් හා සම්පත් පුද්ගලයින් අවශ්‍යය |
| 7.ක්ෂේත්‍ර මාර්ගෝපදේශ සැකසීම (අත්පොත්) | | | මුදල් හා සම්පත් පුද්ගලයින් අවශ්‍යය |
| 8. අපනයනය කරනු ලබන කුරියර් නැව් භාණ්ඩ අධීක්ෂණය කිරීම සඳහා වන ක්‍රමවේද හඳුනාගැනීම | | 50% | වාර්තාවක් මගින් ඉහළ බලධාරීන් දැනුවත් කොට ඇතත් මේ වන තෙක් ඊට කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. |
| 9. රේගු කෞතුකාගාරය නිර්මාණය කිරීම සහ පිහිටුවීම | | 100% | |
| 10. කෞතුකාගාර තේ මේස පොත සකස් කිරීම | | 100% | |
| 11. කෞතුකාගාර පැනල නිර්මාණය කිරීම | | 95% | පැනල වල අවසන් වැඩ කටයුතු නිම වෙමින් පවතී. |
| 12. 2015 සඳහා කෞතුකාගාර මේස කැලැන්ඩර් මුද්‍රණය කිරීම | | 100% | |

## පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය

දැනට රටේ බලපැවැත්වෙන රෙගුලාසි හා ප්‍රමිතිවලට අනුකූලව ආනයනික භාණ්ඩවල තත්ත්වය පාලනය හා අධීක්ෂණය කිරීමේ අදහසින් 2011 දී පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ස්ථාපිත කරන ලදී. ආනයනික හා අපනයනික භාණ්ඩවල බුද්ධිමය දේපල අයිතීන් සම්බන්ධ නීති බලාත්මක කරන ශ්‍රී ලංකා රේගුවේ කේන්ද්‍රීය ස්ථානය ලෙස පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය ක්‍රියාත්මක වේ. ජාත්‍යන්තර සම්මේලනවලදී ගන්නා තීන්දු හා තීරණ මත නීති හා බලාත්මක කිරීම තුළින් වෙනත් සම්බන්ධිත ආයතනවල සහයෝගීතාවය හරහා පරිසරය ආරක්ෂා කිරීමට ද පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය දායක වේ.

**ප්‍රධාන කාර්ය භාරයන්**

1. බුද්ධිමය දේපළ පනත, ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යංශ පනත, ඖෂධ, සුවඳ විළවුන් හා උපකරණ, පනත, පාරිභෝගික සේවා අධිකාරි පනත, නීති උල්ලංඝනය කිරීම් හා වංචා වළක්වා ගැනීම සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ආරක්ෂක අමාත්‍යාංශය නියම කර ඇති රේගුවට සම්බන්ධ නීති, අණපනත්වල අවශ්‍යතාවයන් බලාත්මක කිරීම. ඉහත අධිකාරී බලයන්ගෙන් ආවරණය වන සියළුම ආනයන රේගුවෙන් නිදහස් කර ගැනීමට පෙර පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශය (CPU) වෙත යොමු කිරිම අවශ්‍යතාවයකි.
2. මෙම අරමුණ උදෙසා ඉහත සඳහන් අධිකාරී ආයතන වෙනුවෙන් සකස් කරන ලද ඇපකර එක් එක් ආනයනකරු වෙනුවෙන් ලියාපදිංචි කිරීම සඳහා ලේඛණ පවත්වා ගෙන යෑම.
3. අදාළ අධිකාරී ආයතනවලින් පැනවූ රෙගුලාසි ක්‍රියාත්මක වන පරිදි රේගු පටිපාටි යාවත්කාලීන කිරිම.
4. අවශ්‍යතාවයන් පැන නැගුණ විට භාණ්ඩ පරීක්ෂණ අංගන සඳහා පාරිභෝගික හා පාරිසරික ආරක්ෂණ අංශයේ නිලධාරින් අනුයුක්ත කිරීම.
5. මෙතෙක් හඳුනාගෙන ඇති රේගු නීතියට සම්බන්ධ වෙනත් අණ පනත්වල සඳහන් රෙගුලාසි සමාලෝචනය කිරීම
6. ඉහත ක්‍රියාකාරකම්වලට අදාළ වෙනත් අණ පනත් සමග කියැවෙන රේගු ආඥා පනත ප්‍රකාර නීති බලාත්මක කිරීම.

| ප්‍රධාන කාර්යයන් | ඉලක්කය (අදාල වේ නම්) | 2014.11.30 දිනට ප්‍රගතිය | විශේෂ සටහන් |
|---|---|---|---|
| (1) මොන්ට්‍රියල් සංධානය යටතේ ගැනෙන ඕසෝන් ස්ථරයට හානි විය හැකි දේ ආනයනය කිරීමට අදාල රෙගුලාසි ක්‍රියාවට නැංවීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | ජාතික ඕසෝන් ඒකකය හා එක්ව ඕසෝන් ස්ථරයට හානි විය හැකි දේ ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම පාලනය කොට ඇත. | 100% | |
| (2) බේසල් සම්මුතිය මගින් ආවරණය වන හානිකර අපද්‍රව්‍ය දේශසීමා හරහා සංක්‍රමණය වීමට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 20% | අදාල රෙගුලාසි පිළිබඳව පරිසර අමාත්‍යාංශය සමග නිරන්තර සාකච්ඡා පවත්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (3) ස්ටොක්හෝම් සම්මුතිය මගින් ආවරණය කෙරෙන දිගුකල් පවතින කාබනික දූෂන ආනයනයට අදාල රෙගුලාසි ලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 60% | අදාල රෙගුලාසි පිළිබඳව පරිසර අමාත්‍යාංශය සමග නිරන්තර සාකච්ඡා පවත්වා ඇත. |
| (4) රොටර්ඩෑම් සම්මුතිය මගින් ආවරණය කෙරෙන (පූර්ව දැනුම්දීම් අනුමැතිය) ක්‍රියාවලිය බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 20% | තව කාර්යමණ්ඩලය අවශ්‍යය |
| (5) රසායනික අවි සම්මුතිය (රසායනික අවි නිෂ්පාදනය, ගබඩා කිරීම හා සංවර්ධනය තහනම් කිරීමේ හා ඒවා විනාශ කිරීමේ සම්මුතිය) යටතේ ගැනෙන භාණ්ඩ වලට අදාල රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 20% | තව කාර්යමණ්ඩලය අවශ්‍යය |
| (6) බුද්ධිමය දේපල හිමිකම් යටතේ ගැනෙන භාණ්ඩවලට අදාල රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 60% | බුද්ධිමය දේපල හිමිකම් පිළිබඳ සිද්ධි වාර්තාකරණය හා ඒවාට අදාල නඩු සඳහා පෙනී සිටීම |
| (7) ශ්‍රී ලංකා ප්‍රමිති යටතේ ගැනෙන භාණ්ඩ වලට අදාල රෙගුලාසි බලාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම | | 100% | |

# වරාය පාලන ඒකකය

## ප්‍රධාන කාර්යයන්

1. දේශ සීමාව හරහා යන සියලු නැව් හා භාණ්ඩ පූර්ණ වශයෙන් හඳුනා ගැනීමේ හැකියාව රේගුවට ලබා ගැනීම.
2. හඳුනාගත් අවදානම් රටා සම්බන්ධ බලපෑම් කාලානුරූපව තක්සේරු කිරීම හා අවදානම් රටාවල උපයෝගීතාව පිළිබඳ පර්යේෂණ කිරීම.
3. සැක කටයුතු කරුණු හඳුනා ගැනීම සඳහා වරාය හා අනෙකුත් රේගු ස්ථානයන් තුළ සුපරීක්ෂාකාරීව සොයා බැලීම.
4. අවදානම් රටා පිළිබඳ ජාත්‍යන්තරව පිළිගත් තාක්ෂණය භාවිතා කිරීම.
5. අනෙකුත් දේශීය නීති ක්‍රියාත්මක කරන නියෝජිත මෙන් අනෙකුත් රටවල සමාන තනතුරටක නියැලීයන් සමඟ (ප්‍රතිරූප)(පණිවුඩ හුවමාරු හා ජාලයන් ස්ථාපිත කිරීම තුළින් ජාත්‍යන්තර සහයෝගීත්වය අභිවර්ධනය කර ගැනීම.) දේශීය නීති ක්‍රියාත්මක කරන ආයතන හා විදේශීය ප්‍රතිරූපකයන් පාර්ශවකරුවන් සමඟ පාර්ශවකරුවන්

| ප්‍රධාන කාර්යයන් | ඉලක්කය (අදාල වේ නම්) | 2014.11.30 දිනට ප්‍රගතිය | විශේෂ සටහන් |
|---|---|---|---|
| UNODC හා WCO හි මාර්ගෝපදේශනය මත බහාලුම් පාලන වැඩසටහන ස්ථාපිත කිරීම | මුහුදු මාර්ග භාණ්ඩ සඳහා ඉලෙක්ට්‍රොනික නැව් බඩු ලේඛන පද්ධතිය සකස් කිරීම | 25% | රෙගුලාසි සකස් කරන ලද්දේ 2014 ඔක්තෝබර් 31 වන දා වන අතර තවමත් නැව් සමාගම විසින් CTS වෙත ඉ-නැව්බඩු ලේඛන ඉදිරිපත් කරමින් පවති. |
| මුහුදු තීරය ඔස්සේ මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම වැලැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ආවේක්ෂණය | මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් විසින් යොදාගන්නා නව ක්‍රම අවබෝධ කර ගැනීම හා රට තුලට මත්ද්‍රව්‍ය ගෙන එන ආකාරය අධ්‍යයනය කිරීම | 50% | බොහෝ නැව් සමාගම් සිය ඉ-නැව් බඩු ලේඛන CTS වෙත තවමත් ඉදිරිපත් කොට නොමැති අතර අදාල සියළු තොරතුරු ලැබෙන තුරු විශ්ලේෂණ කටයුතුවලින් අර්ථවත් ප්‍රතිඵල ලබාගත නොහැක. |
| දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන | දෙපාර්තමේන්තුව තුල සිටින අයගේ නිලධාරීන් සහ බාහිර පාර්ශවකරුවන් පුහුණු කිරීම | 50% | 2015 I වන කාර්තුව සඳහා වන පුහුණු සැසිය WCO පුහුණුකරුවන් විසින් සකස් කරන ලද නමුත් විවිධ පරිපාලන ගැටළු හේතුවෙන් එම පුහුණු කල් දැමීමට සිදු විය. |
| අනෙකුත් ආයතන සමග සහයෝගිතාව ගොඩනැගීම | ආයතන අතර බුද්ධි ජාලයක් ගොඩ නැගීම | 30% | ඇතැම් ආයතන තුල ඇති පාලන කටයුතු පිළිබඳ අභ්‍යන්තර දේශපාලනික ගැටළු තවමත් විසඳිය යුතුය. |

# මධ්‍යම විමර්ශන අංශය

## හැඳින්වීම

දෙපාර්තමේන්තුවේ 2010-2015 උපාය මාර්ගික සැළසුම් ප්‍රකාර, අනෙකුත් මෙහෙයුම් අංශයන් මගින් හඳුනා ගන්නා රේගු නීති හා වෙනත් රේගුලාසි උල්ලංඝණය කිරීම් පිළිබඳ විමර්ශනය කිරීම මධ්‍යම විමර්ශන අංශයේ වගකීම වේ. එසේම, මධ්‍යම නඩු වාර්තා ලේඛනය නඩත්තු කිරීමද වගකීමක් වේ.

එමනිසා, මූලික අරමුණ වන්නේ,

- සියළු රේගු විමර්ශන කටයුතු මධ්‍යගත කිරීම හා වෘත්තීමය ආකාරයට පැවැත්වීම,
- ඵලදායී හා කාර්යක්ෂම ආකාරයට මධ්‍යම නඩු වාර්තා ලේඛනය පවත්වා ගෙන යාම, සහ
- තෑගි මුදල බෙදීම මධ්‍යගත කිරීම හා විනිවිද පෙනෙන ආකාරයට පැවැත්වීම.

ඵලදායී ලෙස දෙපාර්තමේන්තු මෙහෙවර සඳහා සහයෝගය දීම.

## ප්‍රධාන කාර්යයන්

- නව දෙපාර්තමේන්තු නියෝග නිකුත් කිරීම.
- අවශ්‍ය නිලධාරීන් ලබාගැනීම.
- විමර්ශනය කිරීම සඳහා අනෙකුත් අංශවල ඇති නඩු භාරගැනීම.
- මධ්‍යම විමර්ශන කාර්යාංශයේ නඩු සම්බන්ධව විමර්ශනය කිරීම.
- තෑගි මුදල් බෙදීම භාරගැනීම.


| ප්‍රධාන කාර්යයන් 1 | ඉලක්කය (අදාල වේ නම්) | 2014.11.30 දිනට ප්‍රගතිය | විශේෂ සටහන් |
|---|---|---|---|
| CIB සඳහා නව DOPL නිකුත් කිරීම | 1 වන හා 2 වන කාර්තුවලදී සම්පූර්ණ කිරීම | ඉටු වි නොමැත | DGC විසින් DOPL අනුමත නොකරන ලදී. |
| අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම | 2 වන කාර්තුවේදී සම්පූර්ණ කිරීම | ඉටු වී නොමැත | DOPL අනුමත නොකරන ලද අතර දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකි විය. |
| අනෙකුත් ඒකක වල ඇති නඩු පවරා ගැනීම | 2, 3 හා 4 වන කාර්තු වලදී සම්පූර්ණ කිරීම | ඉටු වී නොමැත | නව DOPL නොමැතිව අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගත නොහැකිය |
| ත්‍යාග බෙදාහැරීම පවරා ගැනීම | වසරේ 2, 3 හා 4 වන කාර්තුවලදී සම්පූර්ණ කිරීම | ඉටු වී නොමැත | නව DOPL නොමැතිව අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගත නොහැකිය |
| CIB නඩු පිළිබඳ විමර්ශන කටයුතු සිදු කිරීම | ඉටු වී ඇත | ඉටු වී ඇත | ඉටු වී ඇත |

| ප්‍රධාන ක්‍රියාකාරකම් | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| 2.2 මධ්‍යම නඩු ලේඛනය පරිගණක ගත කිරීම | | | |
| 2.2.1 මෘදුකාංග සැකසීම | 1 වන කාර්තුව | ඉටු වී ඇත | |
| 2.2.2 දෘඩාංග මිලදී ගැනීම | 2 වන කාර්තුව | නියමිත කලට ඉටු වී නොමැත | 4 වන කාර්තුවේදී ICT කාර්යාංශය විසින් මිලදී ගැනිම |
| 2.2.3 පරික්ෂාව හා ක්‍රියාත්මක කිරීම | 2 වන කාර්තුව | ඉටු වී නොමැත | 4 වන කාර්තුවේදී පරීක්ෂාවන් ආරම්භ වුනු නමුත් අවශ්‍ය දෘඩාංග නොමැති වීම හේතුවෙන් ක්‍රියාත්මක කළ නොහැකි විය |
| පූර්ණ වශයෙන් ක්‍රියාවට නැංවීම | 3 වන කාර්තුව | ඉටු වී නොමැත | අවශ්‍ය දෘඩාංග නොමැති වීම හේතුවෙන් ක්‍රියාත්මක කළ නොහැකි විය |


## කාර්ය සාධනය 2014 -ජනවාරී සිට ජුනි දක්වා

| | | | | |
|---|---|---|---|---|
| අ.CIB අංශයේ විමර්ශනය - 2014.01.01සිට දක්වා 2014.06.30 | | | | |
| | 1. | අංශය මගින් සොයාගත් නඩු සංඛ්‍යාව | - | 90 |
| | 2. | අවසන් වූ නඩු සංඛ්‍යාව | - | 64 |
| | | අ. අයකරගත් දඩ මුදල්.අඩුකරනු ලැබූ අහිමි කිරීම් / | - | 105,554,782.00 |
| | | ආ. අතිරේක සටහන්කර මගින් අයකර ගත් මුදල්. | - | 3,845,938.00 |
| | | ඇ. විකුණුම් මගින් ලද මුදල්. | - | 11,668,233.00 |
| | 3. | මධ්‍යම නඩු ලේඛන කාර්ය සාධනය | | |
| | | අ. මෙම ලේඛනයේ ලියාපදිංචි කළ ගොනු සංඛ්‍යාව | - | 4269 |
| | | ආ. ලේඛනයේ යාවත්කාලීන කළ ගොනු සංඛ්‍යාව | - | 2795 |
| ඇ.අනෙකුත් අංශවල විමර්ශන | | | | |
| | 1.එම කාලය තුළ අනෙකුත් ශාඛා මගින් විමර්ශනය සඳහා මෙම අංශය වෙත එවනු ලැබූ ලිපිගොනු.සංඛ්‍යාව | | - | 02 |
| | 2. 2014.06.01 දිනට පෙර අනෙකුත් අංශවලින් විමර්ශනය සඳහා මෙම අංශයට එනු ලැබූ හා තවමත් කෙරෙමින් පවතින ගොනු සංඛ්‍යාව | | - | 15 |
| අ.මධ්‍යම නඩු ලේඛනය පවත්වාගෙන යාම | | | | |
| | | 1.මධ්‍යම නඩු ලේඛනයේ ලේඛනගත කිරීමට ලැබුණු ගොනු සංඛ්‍යාව. | - | 4269 |
| | | 2.යාවත්කාලීන වූ ගොනු සංඛ්‍යාව. | - | 2795 |
| | | 3. නිර්දේශ කළ තැගි මුදල් ලැයිස්තු සංඛ්‍යාව. | - | 104 |

**සන්සන්දනය 2013 - 2014**





මධ්‍යම නඩු ලේඛනය ලියාපදිංචි කිරීම




## කාර්ය සාධනය ජුලි සිට දෙසැම්බර් දක්වා 2014

| | | | | |
|---|---|---|---|---|
| අ.CIB අංශයේ විමර්ශනය - 2014.07 01.සිට 2014.12.31 දක්වා | | | | |
| | 1. | මධ්‍යම විමර්ශණ අංශය මගින් සොයාගත් නඩු සංඛ්‍යාව | - | 207 |
| | 2. | අවසන් වූ නඩු සංඛ්‍යාව | - | 66 |
| | | අ. අයකරගත් දඩ මුදල්.අඩුකරනු ලැබූ අභිමි කිරීම් / | - | 105,139,249.00 |
| | | ආ. අතිරේක සටහන්කර මගින් අයකර ගත් මුදල්. | - | 2,585,108.00 |
| | | ඇ. විකුණුම් මගින් ලද මුදල්. | - | 45,896,457.00 |
| | | මධ්‍යම නඩු ලේඛන කාර්ය සාධනය | | |
| | | අ. මෙම ලේඛනයේ ලියාපදිංචි කළ ගොනු සංඛ්‍යාව | - | 5263 |
| | | ආ. ලේඛනයේ යාවත්කාලීන කළ ගොනු සංඛ්‍යාව | - | 2810 |
| ඇ.අනෙකුත් අංශවල විමර්ශන | | | | |
| | එම කාලය තුළ අනෙකුත් ශාඛා මගින් විමර්ශනය සඳහා මෙම අංශය වෙත එවනු ලැබූ ලිපිගොනු සංඛ්‍යාව . | | - | 2 |
| | CIB මගින් විමර්ශනය සඳහා වෙනත් අංශ වෙත යොමු කළ ලිපිගොනු සංඛ්‍යාව | | - | 4 |
| අ.මධ්‍යම නඩු ලේඛනය පවත්වාගෙන යාම | | | | |
| | | 1. මෙම අංශය වෙත ලේඛනගත කිරීමට ලැබුණු ගොනු සංඛ්‍යාව. | - | 5310 |
| | | 2. මෙම අංශයෙහි යාවත්කාලීන වූ ගොනු සංඛ්‍යාව. | - | 2810 |
| | | 3. නිර්දේශ කළ තැගි මුදල් ලැයිස්තු සංඛ්‍යාව | - | 117 |

### සන්සන්දනය - 2013.07.01 සිට 2013.12.31දක්වා සහ 2014.07.01 සිට 2014.12.31 දක්වා







## සුවිශේෂ නඩු

1. CIB/INV/048/2014 - බහාලුම් ගත නොකළ භාණ්ඩ සඳහා අය කළ ප්‍රමාද ගාස්තු මත අයවිය යුතු රේගු බදු නොගෙවීම මෙම අංශයෙන් අනාවරණය කර ගන්නා ලදි.

2. CIB/INV/083/2014 - අය කරගනු ලැබූ අඩු කළ අභිමි කිරිම රු.මිලියන 45කි. බහාලුම් ගත නොකළ භාණ්ඩ සඳහා වන ප්‍රමාද ගාස්තු මත අය විය යුතු රේගු බදු නොගෙවීම මෙම අංශයෙන් අනාවරණය කර ගන්නා ලදි.

3. CIB/INV/279/2014 - ආයෝජන මණ්ඩලයේ පහසුකම් යොදාගෙන මිලියන 4.4ක් වටිනා සිගරට් අඩංගු 1 x 20 කන්ටේනර් නිති විරෝධීව කළ ආනයනය මෙම අංශයේ නිලධාරීන් විසින් සොයා ගන්නා ලදී.



## සුවිශේෂ නඩු

අ .CIB/INV/031/2014 - CPD

කානේ ක්‍රමය අවභාවිතා කරමින් ආනයනය කළ මෝටර් රථ 06ක් මෙම අංශයේ නිලධාරින් විසින් සොයා ගන්නා ලදි. රු. 12,228,600/- අඩු කරනු ලැබූ අභිමි කිරිම් මත මුදාහරින ලද අතර, රු. 12,228,600/-ක මුදලක් විකුණුම් ආදායම් ලෙස ලබා ගන්නා ලදි.

ආ. CIB/INV/033/2013 - CPD කානේ ක්‍රමය යටතේ නීතිවිරෝධි ලෙස ආනයනය කරනලද හමර් මෝටර් රථයක් මෙම අංශයේ නිලධාරීන් විසින් සොයාගන්නා ලදි. මෙය රාජසන්තක කළ අතර මේ සම්බන්ධව විකුණුම් ලෙස රු. 11,000,000/- අය කර ගන්නා ලදි.

## මානව සම්පත් සංවර්ධනය

### පුහුණු හා වැඩමුළු

| ක්ෂේත්‍රය | ස්ථානය | දින ගණන | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| යුධ පුහුණුව | කිලිනොච්චිය යුධ කඳවුර | 07 | 05 |
| අංගචලනය මගින් වංචනිකයින් හඳුනා ගැනීම | මානව සම්පත් සංවර්ධනය අංශය | 01 | 04 |
| විශේෂණ නායකත්ව වැඩමුළු | වෝටර්ස් එජ් | 01 | 06 |
| තක්සේරු පුහුණුව | මානව සම්පත් සංවර්ධනය අංශය | 05 | 24 |
| රේගු අධ්‍යක්ෂවරුන් හා නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරුන්ට ධනාත්මක චින්තනය හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම | සොබා දිවයින | 02 | 03 |
| නායකත්ව හා ප්‍රතිරූප සංවර්ධනය | පදනම් ආයතනය | 01 | 04 |
| ඵලදායීතාව වැඩි දියුණු කිරීම. | මහ බැංකුව | 01 | 04 |

# නීති කටයුතු අංශය

## හැඳින්වීම

අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන මෙම අංශයට එක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක්, රේගු අධිකාරිවරුන් දෙදෙනෙක්, එක් නියෝජ්‍ය රේගු අධිකාරිවරයකු සහ සහකාර රේගු අධිකාරිවරුන් දෙදෙනෙකු අයත්ය. අධිකරණ නඩු හා සම්බන්ධ පරිපාලනය හා අධීක්ෂණය සහ නීතිපති දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීම මෙම අංශය මගින් කරගෙන යනු ලබයි.

## ප්‍රධාන කාර්යයන්

1. අනෙකුත් අංශයන් සඳහා අවශ්‍ය නීති උපදෙස් ලබාදීම සනාථ කිරීම
2. දෙපාර්තමේන්තුවේ සියළු නෛතික කටයුතු හා අධීක්ෂණ කටයුතු සම්බන්ධව සහභාගී වීම. සනාථ කිරීම.

| ප්‍රධාන කාර්යයන් | ඉලක්කය (අදාල වේ නම්) | 2014.11.30 දිනට ප්‍රගතිය | විශේෂ සටහන් |
|---|---|---|---|
| නීති උපදේශ පොත සකස් කොට අවසන් කිරීම හා එය කලින් කලට යාවත්කාලීන කිරීම | 1 වන කාර්තුව | ඉටු වී ඇත | |
| නීති කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාල කාර්යාංශ සමග සම්බන්ධීකරණය ගොඩ නැගීම | නියමිත කාලසීමාව | ඉටු වී ඇත | |
| රේගු කටයුතු වලට අදාලව ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ පවතින සියළුම නඩු සඳහා නිලධාරීන් ඉදිරිපත් කරවීම. | උසාවි දිනවල | ඉටු ව ඇත | |
| මූලික අධිකරණ (ම.අ./ දි.අ./ මහාධිකරණ) සඳහා නිලධාරීන් සහභාගි කරවීම | උසාවි දිනවල | 50% ඉටු වී ඇත | නීති අංශයේ සේවයේ යෙදී සිටින්නේ නිලධාරීන් 3 දෙනෙකු පමණි. |
| ශ්‍රී ලංකාව හා වෙනත් රටවල් අතර ඇති ගිවිසුම් හා කොන්ත්‍රාත් පිළිබඳව PP&R සහ අනෙකුත් අංශ වෙත නීති උපදෙස් ලබා දීම | සතියක කාලයක් ඇතුලත | ඉටුව ඇත. | |

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකාව තුළ ඇති කොන්ත්‍රාත් හා ගිවිසුම් සම්බන්ධයෙන් වන කරුණු පිළිබඳව සැපයුම් අංශය හා අනෙකුත් සියළු කාර්යාංශ වෙත නෛතික උපදෙස් ලබා දීම | සතියක කාලයක් ඇතුලත | ඉටුව ඇත | |
| රේගුවට අදාලව ඇති නඩු සම්බන්ධයෙන් වන සඟරාවන් සකස් කොට පවත්වා ගෙන යාම | වසරක් ඇතුලත | ඉටුව ඇත | |
| රේගු ආඥාපනත හා වෙනත් අදාල නීති හා රෙගුලාසි කලින් කලට සමාලෝචනයට ලක් කිරීම සඳහා වන කමිටුවට අවශ්‍ය සහාය ලබා දීම | වසර දෙකක කාලයක් ඇතුලත | ඉටු ව ඇත | නීති අංශයේ සේවයේ නියුතුව සිටින්නේ එක් නීතිඥයෙකු පමණි. |

# මධ්‍යම බුද්ධි අංශය

## හැඳින්වීම.

මධ්‍යම බුද්ධි අංශයේ වගකීම වනුයේ නිවැරදි කාලානුරූපී හා ඵලදායී බුද්ධි තොරතුරු මෙහෙයුම් ඒකක වලට හා ඉහළ කළමනාකාරිත්වයට ලබාදීම මගින් දෙපාර්තමේන්තුවේ පරමාර්ථ වන සමාජ ආරක්ෂණ අරමුණු ආදායම් අභිමිකර ගැනීමකින් තොරව ළඟා කර ගැනීමය.

මෙහි පරමාර්ථයන් පහත පරිදිවේ:

- ඉහළම තීරණ ගැනීමේ මට්ටම් වලට අවශ්‍ය  බුද්ධි තොරතුරු සැපයීම.
- බුද්ධි තොරතුරු මත පදනම් වන භාණ්ඩ හා මගීන් නිෂ්කාශන පාලන ක්‍රම අවධාරණය සහ නියාමනයට අදාළ ක්‍රියාවලීන්ට බුද්ධි තොරතුරු සැපයීම.
- දේශසීමා වලදී කෙරෙන භාණ්ඩ හුවමාරුවේදී ජාතික ආරක්ෂාව පිළිබඳව වගකීම.
- ජාතික හා ජාත්‍යන්තර බුද්ධි තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

1. තොරතුරු එක්රැස් කිරීම
2. පැය 24 පුරා ක්‍රියාත්මක මහජන තොරතුරු ලබාගැනීමේ ඒකකය *(PIRD).*
3. දත්ත පද්ධති පවත්වාගෙන යාම හා භාවිතයට ගැනීම
4. බුද්ධි තොරතුරු වර්ධනය කිරීම හා විශ්ලේෂණය කිරීම
5. දේශීය වශයෙන් කාර්යාංශය අතරත් ජාත්‍යන්තර වශයෙන් අනුමත නියම කරන ලද ආයතන සමගත් බුද්ධි තොරතුරු බෙදා හැරීම
6. ජාත්‍යන්තර රේගු තොරතුරු පද්ධති සම්බන්ධිකරණය කිරීම
7. ආසියා ශාන්තිකර කලාපයේ බුද්ධි තොරතුරු සම්බන්ධීකරණ කාර්යාලයේ කලාපීය ජාතික සම්බන්ධක ස්ථානය ලෙස ක්‍රියා කිරීම හා ජාත්‍යන්තර බලාත්මක කිරීමේ සම්බන්ධීකරණයේ මුඛ්‍ය ස්ථානය ලෙස කටයුතු කිරීම
8. ජාතික ආරක්ෂාව සම්බන්ධ කටයුතුවලදී සම්බන්ධිකරණ ඒකකය ලෙස කටයුතු කිරීම
9. කොළඹ වරායේ බහාලුම් ආරක්ෂක මූලපිරීෙම් (Container Security Initiative) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
10. දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහභාගි වීම
11. නැව් බඩු ලේඛන සමාලෝචනය හා බුද්ධි තොරතුරු පාදක කර ගනිමින් අධි අවදානම් භාණ්ඩ තොග අල්ලා ගැනීම හා විමර්ෂණ සිදු කිරීම
12. රේගු පරීක්ෂණ සිදුකිරීම හා වැරදිකරුවන්ට එරෙහිව නඩු පැවරීම
13. පෙර වැරදිකරුවන්ගේ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම (POD)
14. CEN  දත්ත පද්ධතිය පවත්වාගෙන යාම
15. ලියාපදිංචියට පෙර ආනයනකරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පරික්ෂා කිරීම (2012 සිට)
16. CHA දත්ත පද්ධතිය පවත්වාගෙන යාමට හා  CHA අයදුම්පත්‍ර ලියාපදිංචියට පෙර පරීක්ෂා කිරීම සඳහා නිෂ්කාශන ඒජන්තවරුන්ගේ තොරතුරු ඒකරාශී කිරීම.

## 2014 කාර්ය සාධනය

**ලබාගත් හා බෙදාදුන් තොරතුරු - පසුගිය වර්ෂ සමඟ සැසඳීම**

| විස්තරය | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| PIRD හරහා ලබා ගත් තොරතුරු සංඛ්‍යාව | 60 | 45 | 30 |
| වෙනත් මූලාශ්‍ර මගින් (ෆැක්ස්, ලිපි, ප්‍රවෘත්ති) | 04 | 05 | - |
| එකතුව | **64** | **50** | **30** |
| අනෙකුත් අංශ සමග බෙදා හදා ගත් තොරතුරු සංඛ්‍යාව | | | |
| අවශ්‍ය පියවර ගැනීම සඳහා වෙනත් අංශ වෙත බෙදා හරින ලද තොරතුරු සංඛ්‍යාව | 26 | 23 | 14 |
| කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලද ක්‍රමෝපායික තක්සේරු සංඛ්‍යාව | - | - | - |

**බෙදා හරින ලද බුද්ධි තොරතුරු**

| | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| CIU අනතුරු ඇඟවීම් | 11 | 17 | 19 |
| RILO, WCO, CEN අනතුරු ඇඟවීම් | 01 | නැත | 30 |

**විවිධ අංශ වෙත ඉදිරිපත් කරන ලද පෙර වැරදිකරුවන්ගේ තොරතුරු සංඛ්‍යාව**

| | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| විවිධ අංශ වෙත ඉදිරිපත් කරන ලද පෙර වැරදිකරුවන්ගේ තොරතුරු සංඛ්‍යාව | 2091 | 397 | 143 |

### CHA සහ VATලියාපදිංචි කිරීම් සංඛ්‍යාව

| | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| රේගු නියෝජිත ආයතන බලපත්‍ර අළුත් කිරීම් | | 3500 | 3750 |
| ශ්‍රී.ලං.ව.අ. වාප්පු බලපත්‍ර (A) | | 2000 | 2200 |
| ආනයනකරුවන්ගේ VAT අංක ලියාපදිංචියට පෙර පරීක්ෂාවන් | | 1442 | 1481 |

## දේශීය සහ විදේශීය විමර්ෂණ හා බුද්ධි තොරතුරු නියෝජිතායතන සමග සම්බන්ධීකරණය

| නියෝජිතායතනය | ඉල්ලීම් සංඛ්‍යාව | | | ලැබුණු පිළිතුරු සංඛ්‍යාව | | | නොලැබුණු පිළිතුරු සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2012 | 2013 | 2014 | 2012 | 2013 | 2014 |
| | | | | | | | | | |
| DRI- ඉන්දියාව | 16 | 4 | 8 | 07 | | 2 | | | |
| ජපානයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 10 | 08 | 62 | 07 | 06 | 58 | | | |
| එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 02 | 04 | | 01 | | | | | |
| HM Customs UK | | | 2 | | | 1 | | | |
| ඕස්ට්‍රේලියා | | 03 | | | | | | | |
| සිංගප්පූරුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 01 | 01 | | | | | | | |
| UAE | | | | | | | | | |
| ජපාන රේගු දෙපාර්තමේන්තුව | 01 | | | 01 | | | | | |
| නවසීලන්ත අභ්‍යන්තර ඒජන්ත කාර්යාලය | | | | | | | | | |
| පාකිස්තාන රේගුව | | | | | | | | | |
| ඉන්දුනීසියානු රේගුව | | | | | | | | | |
| මාලදිවයින් රේගුව | 01 | | | 01 | | | | | |
| තායිලන්ත රේගුව | 02 | | 6 | 02 | | 3 | | | |
| නේපාල රේගුව | | | | | | | | | |
| ඉරාන රේගුව | | | | | | | | | |
| මලයාසියා රේගුව | | 01 | | | | | | | |
| වියට්නාම් රේගුව | | 01 | | | | | | | |
| ICE ATTACHE නව දිල්ලියෙහි ඇමෙරිකානු තානාපති කාර්යාලය | | | | | | | | | |
| තායිලන්ත තානාපති කාර්යාලය | | | 03 | | | 01 | | | |
| RILO - කොරියාව | | | | | | | | | |

## නීති ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනය

| | 2014 |
|---|---|
| වර්ෂය තුල නිලධාරීන් විසින් පටන් ගත් හා සොයා ගත් නඩු සංඛ්‍යාව | 39 |
| මෙම වර්ෂය තුල අවසන් වූ නඩු සංඛ්‍යාව | 20 |
| අය කර ගත් මුලු ගණන | 73,709,749 |

2014 වසරේ මෙම අංශයේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද සුවිශේෂ අවස්ථාවන් විමර්ශන සම්බන්ධීකරණ කාර්යාලය NCP හි 26 වන පාලන රැස්වීම පැවැත්වීම.

2014 නොවැම්බර් 11 සිට 13 දක්වා
කොළඹ, ශ්‍රී ලංකා



26 වන RILO-AP රැස්වීමට පරිපාලන සාමාජිකයන් 18 දෙනෙක් සහ ඉහත කාර්යාලය අනෙකුත් ප්‍රාදේශීය විමර්ශන සම්බන්ධීකරණ කාර්යාල සහ ලෝක රේගු සංවිධානය යනාදී ස්ථානවලින් 44 දෙනෙකු සහභාගී විය. සංග්‍රහකත්ව කාර්යය ලෙස මෙම රැස්වීමේ මූලිකත්වය ශ්‍රී ලංකාව දරන අතර ආරම්භක දේශනවලදි රේගු අධ්‍යක්ෂ ජනරාල් හා RILO-AP කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධානියා විසින් මෙහෙයවන ලදි. මෙයින් ඇතිවන සුහසාධනය සහ බලාපොරොත්තු පිලිබඳව පෙන්වා දෙන ලද තොරතුරු හුවමාරුව පිළිබඳ ප්‍රාදේශීය සම්බන්ධීකරණය හා එකට එකතුවීමේ වැදගත්කම සහ කලාපීය රේගු පරිපාලකයන්ගේ අන්‍යොන්‍ය අවබෝධය හා සම්බන්ධතාවය ඔවුන් විසින් අගය කරන ලදී.

RILO-AP සහ WCO යනාදියෙහි කාර්ය සාධනය ඉදිරිපත් කර ඇති අතර RILO-AP ඔවුන්ගේ සේවය පිළිබඳ WCO හි ඩානියෙල් මහතා විසින් විශාල අගය කිරීමක් කරන ලදී. ආසියා පැසිපික් ප්‍රදේශයෙහි වෙළඳාම සම්බන්ධ අත් අඩංගුවට ගැනීම් පිළිබඳ තොරතුරු බෙදාගත් අතර නීති විරෝධී වෙළඳාම සම්බන්ධයෙන්ද සාකච්ඡා කරන ලදී. නියෝජිතයින්ගේ ක්‍රියාශීලි සහභාගීත්වය සඳහා ස්තුති කරන ලද අතර රේගු පරිපාලනයට අලුතින් පැනනගින තර්ජන සහ ක්‍රමවේදයන්හි දැනට පවතින අඩුපාඩු හඳුනා ගන්නා ලදී. RILO කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය 2015 හා ක්‍රියාකාරී සැලැස්ම බුද්ධි තොරතුරු විශලේෂණ වාර්තාව යනාදිය මෙහිදී ඉදිරිපත් කරන ලදී. මෙම රැස්වීම ජයග්‍රාහී ලෙස පැවැත්වුන අතර 27 වන පාලන රැස්වීම ඉන්දුනීසියාවේ පැවැත්වීමට තීරණය කරන ලදී

**සුවිශේෂී වැටලීම්**
මෙම අංශයට ලැබුන තොරතුරු අනුව සිංගප්පූරුවෙන් පැමිණි මගීන් දෙදෙනෙකු ගුවන් තොටුපලේ පැමිණීමේ පර්යන්තයේ දී අත්අඩංගුවට ගත් අතර ඔවුන් අත තිබූ රු. මිලියන 11.6 වටිනා රත්‍රන් කි.ග්‍රෑම් 11.8 සොයා ගන්නා ලදි.

**ධාරිතා වර්ධනය සහ පුහුණු**
ධාරිතා වර්ධක ක්‍රියාකාරකම් පිළිබඳ සැලකීමේදී, 2014 වසරේදී RILO-AP විසින් බුද්ධි තොරතුරු විශ්ලේෂණ ක්‍රමවේද හා CEN දත්ත පද්ධතිය පිළිබඳ සහභාගීත්ව පුහුණු වැසි දෙකක් සඳහා අවස්ථාව ලබාදෙන ලදි. මෙම පුහුණු සති දෙකක් තිස්සේ දකුණු කොරියා රේගු මූලස්ථානයේ පැවැත්විය .

මීට අමතරව, මධ්‍යම බුද්ධි අධ්‍යක්ෂවරයා, දෙවන කලාපීය නීති බලාත්මක කිරීමේ රැස්වීමටත්, ඉන්දියාවේදී පැවති RRI උත්සවයටත් සහභාගී වුණි

# ආදායම් හා සේවා පරිෂදය

# ප්‍රකාශන අංශය

හැඳින්වීම

' ප්‍රකාශක' යනුවෙන් හඳුන්වන්නා වූ ආනයනයකරුවන්ගේ නියෝජිතයන් විසින් මුහුදෙන් ප්‍රවාහනය කරන සියළුම භාණ්ඩ සම්බන්ධයෙන් වන රේගු ප්‍රකාශන **(CusDec** යනුවෙන් හඳුන්වනු ලැබේ.**)** ඉදිරිපත් කරනු ලබන්නේ ප්‍රකාශන අංශය වෙත වේ. මෝටර් වාහන සඳහා ඉදිරිපත් කරන රේගු ප්‍රකාශ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම මේ වන විට මුළුමනින්ම පවරා ඇත්තේ මෙම අංශය යටතේ ඇති මෝටර් රථ වාහන අංශය වෙතය.

**ප්‍රධාන කාර්යයන්**

1. රේගු රෙගුලාසි හා අනෙකුත් ආශ්‍රිත ආඥාපනත් යටතේ රේගු ප්‍රකාශන සකස් කිරීම
2. ආනයන හා අපනයන භාණ්ඩ සම්බන්ධයෙන් නියමිත ආදායම තක්සේරු කිරීම හා එකතු කිරීම
3. වෙළඳාමේ, කර්මාන්තයේ හා පොදු මහජනතාවගේ යහපත වෙනුවෙන් රජයේ ප්‍රතිපත්ති යටතේ බදු විරාමයන් / නිදහස් කිරීම් ප්‍රදානය කිරීම හා තීරු බදු හා බදු අත්හිටුවීම
4. ආනයන හා අපනයනය වලට අදාල සියළු නෛතික අවශ්‍යතා සමග ස්වේච්ඡා අනුගත වීම තහවුරු කිරීම
5. වේගවත් නිෂ්කාශන ක්‍රියාවලී හරහා නිත්‍යානුකූල ආනයනකරුවන් / අපනයනකරුවන්ට අවශ්‍ය පහසුකම සපයා දීම

A) "D" අංශය
B) දිගු කාමරය
C) මෝටර් රථ ඒකකය
D) කර්මාන්ත හා සේවා ලේඛන සැකසුම්
E) DOC මධ්‍යස්ථානය

නව ප්‍රතිසංවිධාන සැලැස්ම පරිදි ආදායම් හා සේවා (කොළඹ) පර්ෂදය යටතේ මෙම සියලු අංශයන් ක්‍රියාත්මක වේ.

**අංශයේ විෂය ක්ෂේත්‍රය**

මෙම අංශයේ ප්‍රධාන විෂය ක්ෂේත්‍රය වන්නේ ආනයනික හා ගුදම් ගත කෙරෙන භාණ්ඩ සඳහා ප්‍රකාශන පහසුකම් සැපයීම. මෙය සපුරා ගැනීම සඳහා මෙම අංශය මගින් පහත පහසුකම් සපයා ඇත.

i. DT1 මගින් රේගු සටහන්කර ලබාගැනීම.
ii. රේගු සටහන්කරයේ ඇති තීරුබදු සහ අනෙකුත් බදුගෙවීම් යාවත්කාලීන කර ගැනීම හා නැව්බඩු ලේඛන අවලංගු කිරිම.
iii. තෝරාගත් ආනයනකරුවන්ට ඉක්මන් නිශ්කාෂණ පහසුකම සපයාදීම.
iv. රේගු අධිකාරි/තක්සේරුකරු විසින් රේගු සටහන්කර අනුමත කිරීම.
v. FCL බහාලුම් SLPA SAGT,CICTඅංගනයෙන් එලියට ගෙන යාමට අභ්‍යන්තර අවසර පත්‍ර නිකුත් කිරිම.
vi. FCL භාණ්ඩ බහාලුම් මධ්‍යස්ථානවලදීත් LCI භාණ්ඩ ගුදම් වලදීත් නිශ්කාෂණය කිරිම
vii. "**Asycuda World**" මගින් සම්පූර්ණ ස්වයංක්‍රීයකරණය ක්‍රියාත්මක වන අතර එමගින් ආනයනකරුවන්ට පහසුවෙන් හා අප්‍රමාදව රේගු සටහන්කර කටයුතු කර ගත හැකි වේ. දැන් 2 වන මහලේ දිගු කාමරයේදී "**Asycuda**" පද්ධතිය මගින් රේගු සටහන්කර වල සියලු කටයුතු ඉටු කරන අතර DTI පහසුකම මගින් පරිහරණය කරන්නන්ට තමාගේ කාර්යාලයේ සිටම රේගු සටහන්කර ඇතුලත් කර හැක.
viii. භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධ කටයුතු පමණක් දැනුමැති රේගු අධිකාරී හා තක්සේරුකරුවන්ගෙන් සමන්විත නිලධාරීන් මඬුල්ලක් අතින් සිදු කරයි.

**කාර්යාංශයේ අරමුණු**

I. ආනයනය භාණ්ඩ නිශ්කාෂණය පහසුකිරිම.
II. භාණ්ඩ ගුදම් ගත කිරීමට පහසුකම් සැලසීම.
III. භාණ්ඩ වර්ගීකරණ කටයුතු හරහා ආදායම් අඩුවීම් හා විදේශ විනිමය අහිමි වීම අවම කිරිම.
IV. D අංශය හරහා රේගු ආඥා පනත හා අදාළ නීති බලාත්මක කිරීම.
V. ආනයන භාණ්ඩ මත පනවන බදු ආදායම නියමිත පරිදි ගණනය හා එකතු කිරීම.
VI. මුදල් අමාත්‍යාංශය අනුමැතිය ඇති ව්‍යාපෘති භාණ්ඩ නිශ්කාෂණ වලට බදු සහන ලබාදීමෙන් පහසුකම සැලසීම.
VII. බලපත්‍ර හිමියන්ට/ නීත්‍යානුකුල ආනයනකරුවන්ට තම වාහන / භාණ්ඩ ඉතා ඉක්මනින් නිදහස් කර ගෙන යාමට පහසුකම් සැලසීම.
VIII. විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු/අනෙකුත් සංවිධාන/සාමාන්‍ය මහජනයාට තාවකාලික රේගු සටහන්කර හරහා භාණ්ඩ නිදහස් කර ගැනීමට සැලසීම. රජයේ ප්‍රතිපත්ති මත තීරු බදු අඩු කිරීම/ අත්හැර දැමීම හා ප්‍රමාද කිරීම ක්‍රියාත්මක කිරීම.
IX. තහනම් හා සීමා කරන ලද භාණ්ඩ සඳහා බලාත්මක කිරීම් සිදු කිරීම.

**මෙම අංශයේ නිලධාරීන්ගේ වගකීම**

ආනයනික භාණ්ඩ සඳහා රේගු සටහන්කර ක්‍රියා පරිපාටිය අයුතු පමාවකින් තොරව ඉක්මනින් සිදු කිරීමටත් රජයට නියමිත බදු ආදායම එකතු කර දීමටත් දිගු කාමරයේ නිලධාරීන් සහතික වෙයි. ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ආහාර හා බෙහෙත් වර්ග සඳහා වූ අධිකාරිය, සීනි පර්යේෂණ ආයතනය, සුවද විලවුන් උපාංග හා බෙහෙත් වර්ග සඳහා වූ අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය, පරමාණුක ශක්ති අධිකාරිය, විදුලි සංදේශ නියාමක කොමිෂම වැනි ආයතනවල අධිකාරියට යටත්ව ගෙන්වන භාණ්ඩ සඳහා එම බලපත්‍ර ලබා ගෙන තිබේදැයි සහ තනාපති, තීරු බදු නිදහස්, ශාක නිරෝධායතන සහතිකය, දුම් ගැස්සීමේ සහතිකය, කුලු බඩු මණ්ඩල සහතිකය සහ පූර්ණ නැව්ගත කිරීමේ වාර්ථාව යනාදි සහතිකයන් අපනයන කරන ලද රටවලින් නිකුත් කරන්නේ දැයි අවධානයෙන් සිටීමට මෙම නිලධාරීන් වග බලා ගනී. තවද පහත අවශ්‍යතා ආනයනකරුවන් සම්පූර්ණ කර තිබේදැයි සලකා බලයි.

- භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා භාණ්ඩ ප්‍රවාහකයාගේ අනුමැතිය.
- පරිගණක පද්ධතියේ ඇති නියමිත කේත යොදා ගනිමින් භාණ්ඩ වල සම්පූර්ණෙ විස්තරය
- සංයෝජිත භාණ්ඩ වර්ගීකරණ නාමාවලිය පදනම් කර සෑදූ ආනයන තීරුබදු නාමාවලියට අදාලව භාණ්ඩ වර්ගීකරණය නිවැරදිව සිදු කිරීම
- භාණ්ඩවල සත්‍ය හුවමාරු වටිනාකම ප්‍රකාශ කිරීම කිරීම
- නියමිත විදේශ විනිමය අනුපාතය හා අදාළ මුදල් වර්ගය යොදා ගනිමින් භාණ්ඩ වල වටිනාකම ප්‍රකාශ කිරීම
- භාණ්ඩ සඳහා අනුමත බැංකුවකින් විදේශ විනිමය හුවමාරුව සිදුවී ඇත්ද යන බව
- අවශ්‍ය පරිදි අදාළ අනුමැති, සහතික, බලපත්‍ර අමුණා තිබීම

ඉහත සියලුම කරුණු නිසි පරිදි සම්පූර්ණ කර ඇත්නම් අදාළ නිලධාරීන් භාණ්ඩ නිදහස් කර ගැනීම සඳහා රේගු සටහන්කර අනුමත කිරීම සිදු කරයි.

ඉහත සඳහන් කර ඇති පරිදි මෙම කාර්යාංශය යටතේ ඇති කාර්යයන්ට අනුකූලව මෙම ප්‍රධාන ඒකක පහකි.

**“D” ශාඛාව**

“D” ශාඛාව කාර්යාංශයේ ලේකම් කාර්යාලය ලෙස සැලකිය හැකිය. ඓතිහාසික වශයෙන් වසර 200කට පමණ පෙර රේගු පාලක, ජනරාල්වරයා පත් කිරීමේදී ඔහු යටතේ සේවයේ නියුතු ‘A’ විෂයය, ‘B’ විෂයය යනාදී ලෙස විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ලිපිකරුවන් 4 දෙනෙකු සේවයේ යෙදී සිට ඇත. පසු කාලයේදී ‘A’ විෂයය දැනට පවතින මානව සම්පත් කළමනාකරණ කාර්යාංශය ලෙස (මීන් පෙර පරිපාලන ශාඛාව) විකාශය විය. “C” ලිපිකරු වරාය රාජකාරි ඉටු කළ අතර පසුව එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය නමින් වෙනමම ආයතනයක් ලෙසින් ස්ථාපිත විය. ඓතිහාසික වශයෙන් භාණ්ඩාගාරය හා රේගුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කළ, බදු විරාමයක් / නිදහස් ලබා දුන් හා නැව් භාණ්ඩ ලේඛන භාරගත් පැරණි “D” ශාඛාව තවමත් එම කාර්යයන්ට සමාන කාර්යභාරයක් ඉටු කරන අතර තවමත් ඒ නමින්ම හැඳින්වේ.

**ආනයනකරුවන්/සාමාන්‍ය මහජනයාට පහසුකම් සැලසීම සඳහා "D" ශාඛාව සතුව අංශ කීපයක් පවතී.**

- DRA අංශය
- බැංකු ඇපකර අංශය
- තීරුබදු සහන අංශය
- තොග භාණ්ඩ අංශය
- Carnet අංශය
- නැව් බඩු ලේඛන අංශය
- විමර්ශන අංශය
- නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (D) යටතේ ඇති මෝටර් රථ බලපත්‍ර පරීක්ෂා කිරීමේ හා අවලංගු කිරීමේඅංශය

**“D” ශාඛාව විසින් පාලනය කරනු ලබන වැදගත් හා මුඛ්‍ය කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.**

1. මුදල් අමාත්‍යාංශය මගින් ලබාදෙන තීරුබදු සහන ලියාපදිංචි කිරීම මගින් නිශ්කාෂණයට පහසුකම් ලබාදීම.
2. පාර්ලිමේන්තුවෙන් පනවන ආදායම් සංරක්ෂණ වාර්තාව අනුව තීරුබදු සහන හා නිදහස් කිරීම් ලබාදීම.
3. විදේශ කටයුතු අමාත්‍යාංශය ලබාදුන් අනුමැතිය ප්‍රකාරව තානාපති කාර්යාල සේවකයන්ගේ පුද්ගලික භාණ්ඩ හා තානාපති සේවා භාණ්ඩ නිශ්කාෂණයට අවසර දීම.
4. විවිධ වෙළඳ ගිවිසුම් යටතේ ආනයනය කරන භාණ්ඩ සඳහා නිදහස් තීරුබදු හෝ වරණීය තීරුබදු අනුපාත ලබාදීම.
5. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ උපදේශකත්වය යටතේ රාජ්‍ය ආයතන සඳහා වූ භාණ්ඩ නිශ්කාෂණයේදී පසුව ගෙවීම් කොන්දේසි ලබාදී පහසුකම් සැලසීම.
6. භාණ්ඩ නිශ්කාෂණය සඳහා විවිධ හේතු මත රේගු සටහන්කර ඉක්මණින් ඉදිරිපත් කිරීමට නොහැකි අවස්ථාවේදී හා තාවකාලික ප්‍රකාශපත්‍ර (Provisional Basis ) ක්‍රමය යටතේ යම් කාර්යයක් සඳහා ආනයනය කර ප්‍රතිඅපනයනය සිදු කරන අවස්ථාවේදී ඒ සඳහා පහසුකම් සැලසීම.
7. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ තීරණය මත ප්‍රතිආනයනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘති භාණ්ඩ ලියාපදිංචිය හා අධීක්ෂණය කිරීම.
8. නාවික නියෝජිතයන් විසින් ඉදිරිපත් කරනු ලබන නැව් බඩු ලේඛන හා ඒවායේ සංශෝධන භාර ගැනීම.
9. රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) ගේ තීරණ පරිදි තාවකාලික රේගු සටහන්කර හා අනෙකුත් කාරණා සම්බන්ධයෙන් බැංකු ඇපකර හෝ ආයතනික ඇපකර ලබාගැනීම.
10. CPD Carnet or ATA Carnet මත තාවකාලිකව ආනයනය කරන ලද වාහන සහ උපකරණ අධීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීම.
11. තොග භාණ්ඩ ආනයනය කිරීම, අධීක්ෂණය කිරීම හා අවශ්‍ය විටකදී අමතර අයකිරීම් ලබාගැනීම.

12. තීරු බදු සහන ලබාදුන් භාණ්ඩ පිළිබද වාර්තා සකස් කිරීම හා ඒවා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම.
13. එතනෝල් වැටලීම් හා වාහන කැබලි අත් අඩංගුවට ගැනිම වැනි විවධ ආනයනය පාලන නීති රේගු නීති කඩකිරීම් හසු කර ගැනීම හා ඒ සම්බන්ධයෙන් රේගු ආඥා පනත යටතේ ක්‍රියා කිරීම.
14. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම.

**දිගු කාමරය**

ඓතිහාසික වශයෙන් ගත් කළ රේගු පරිපාලනයේදී දිගු කාමරය සැබැවින්ම දිගු කාමරයක් වූ අතර අදටත් එය දැකිය හැක්කේ දිගු කාමරයක් ලෙසය. මෙය බ්‍රිතාන්‍යයේ යටත්විජිත ලෙස පැවති බොහෝ ආසියාතික රටවල හා යුරෝපයේ ඉතා පැරණි රේගු සංවිධාන පැවති සමහර රටවල (උදා; ඩෙන්මාර්කය හා නෙදර්ලන්තය) දැකිය හැකි පොදු ලක්ෂණයකි. රේගුව ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආදායම කේන්ද්‍ර කොට ගත් රජයේ ආයතනයක් බැවින් මෙම දිගු කාමරයේ වැදගත්කම සුළු කොට තැකිය නොහැකිය. එවකට පැවති විශාල ප්‍රමාණයේ ඉලක්කයන් කාලය ගත වීමත් සමග සමාජ ආරක්ෂණ බැඳීම් බවට පරිමානය වී ඇති නමුත් ආදායම එකතු කිරීම නම් වූ මූලික ප්‍රමුඛතාවයේ වෙනසක් සිදුව නොමැත.
රේගු ආඥාපනතේ 10 වන වගන්තිය රේගු බදු හා වෙනත් ගාස්තු අය කිරීමට රේගුවට බලය පවරන අතර එහි 47 වන වගන්තිය අනුව භාණ්ඩ ආනයනය කරනු ලබන තැනැත්තා විසින් ඒ පිළිබඳ සැබෑ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු අතර එම භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළු බදු (තීරු බදු ඇතුළුව ගෙවිය යුතුය. (රේගුවේ දිගු කාමරය යනු, මෝටර් වාහන හැර අනෙකුත් සියළු මුහුදු භාණ්ඩ සම්බන්ධයෙන් ආනයනකරුවන් විසින් රේගු ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු ස්ථානයයි. මෝටර් රථ සම්බන්ධයෙන් රේගු සටහන්කර සකස් කිරීම දැන් පූර්ණ වශයෙන් මෝටර් රථ අංශය වෙත භාර දී තිබේ.)

රේගුව විසින් රේගු බදු වලට අමතරව පහත දැක්වෙන බදු වර්ගද අය කරනු ලැබේ.

අගය එකතු කිරීමේ බද්ද (VAT)
වරාය හා ගුවන්තොටුපොල සංවර්ධන බද්ද (PAL)
ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL)
නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)
අනෙකුත් රජයේ ආයතන වෙනුවෙන් සෙස් බදු (Cess)

පහසුවෙන් අධීක්ෂණ හා මෙහෙයවීම සඳහා සංයෝජිත වර්ගීකරණ ක්‍රමයේ (HS) ඡේද අනුව අංශ 5ක් යටතේ රේගු සටහන් කර අනුමත කිරීම සිදු කෙරේ.

| | | |
|---|---|---|
| A අංශය | - | සංයෝජිත වර්ගීකරණ ඡේද 01-44 |
| B අංශය | - | සංයෝජිත වර්ගීකරණ ඡේද 45-73 |
| C අංශය | - | සංයෝජිත වර්ගීකරණ ඡේද 74-84 |
| D අංශය | - | සංයෝජිත වර්ගීකරණ ඡේද 85-97 (මෝටර් රථ නොමැතිව) |
| E අංශය | - | කෑම වර්ග, බෙහෙත්, තොග භාණ්ඩ, ඉක්මණින් විනාශ වන භාණ්ඩ. |

**රේගු සටහන්කර ඉදිරිපත් කිරීම.**

CusDec යනු රේගු සටහන්කරය යනු ඉංග්‍රීසි යෙදුමේ කෙටි යෙදුමයි. රේගු ආඥාපනතේ 47 වන පරිච්ඡේදය යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය අනුව රේගු සටහන්කර ඉදිරිපත් කරන අවස්ථාවේදී ආනයනකරුවන් විසින් (වොරන්ට් පිටපත, බාරදීමේ පිටපත, භාරදීමේ පිටපත, විනිමය පිටපත හා පාර්ශවකරුගේ පිටපත) ලෙස සටහන්කරය පිටපත් හතරකින් ඉදිරිපත් කල යුතුව ඇත. තවද එම පිටපත් සමග පහත ලියකියවිලි ද ඉදිරිපත් කල යුතුව ඇත.

- ✓ නැව් භාර පත්‍රය
- ✓ භාර දීමේ නියෝගය
- ✓ විදේශ විනිමය අදාළ නොවන භාණ්ඩ ආනයනයකදී හැර බැංකුව විසින් අත්සන් කර සහතික කරන ලද ඉන්වොයිස් පත්‍රය
- ✓ ඇසුරුම් ලේඛනය
- ✓ HS හඳුනා ගැනීමට අදාළ තාක්ෂණික තොරතුරු
- ✓ නිෂ්පාදිත රට තහවුරු කිරීමට අදාළ ලියවිලි
- ✓ ආනයන භාණ්ඩ, සීමා කල භාණ්ඩ නම් ඊට අදාළ ආනයන බලපත්‍ර, ප්‍රමිති කාර්යාංශ සහතික ආදී බලපත්‍ර
- ✓ නිවැරදිව පුරවන ලද වටිනාකම ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍ර දෙකක්
- ✓ ණයවර ලිපි, විදුලි සංදේශ හුවමාරු වැනි විනිමය සංසරණ ක්‍රමය ගැන ඔප්පු කිරීම.
- ✓ වෙනත් විශේෂ ලේඛන (තනාපති, තීරු බදු සහන, ශාක සනීපාරක්ෂක සහතිකය, දුම් ගැස්සීමේ සහතිකය, කුලු බඩු මණ්ඩල සහතිකය, නැවේ භාණ්ඩ පැටවීම සඳහා මිණුම් වාර්ථාව සහ සීනි පර්යේෂණ ආයතනය)

එක් රේගු සටහන්කරයක භාණ්ඩ කිහිපයක් විවිධ වර්ගීකරණ කේත HS අංක යටතේ ඇති විට වැඩිම තීරුබදු ප්‍රමාණයක් ගෙවීමට ඇති භාණ්ඩය අඩංගු ඒකකය අදාළ ඒකකය ලෙස තෝරා ගැනේ.

ආඥාපනතේ 12, 43 වගන්තිය හා 'ආ' යටතේ රේගුව බලාත්මක කර ඇති උපලේඛනයට අනුව භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේදී රේගුව විසින් වෙනත් ඕනෑම නීතියකින් සීමාවන් හා තහනම් පැනවිය යුතුය. මෙම ඉතා පුලුල් විධිවිධානයට අනුව දැනට ක්‍රියාත්මකව පවතින පනත්, ආඥාපනත් හා රෙගුලාසි 33කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම රේගුවට සිදු වේ. මින් ප්‍රධානතම පනත වන්නේ 1969 අංක 01 දරණ ආනයන හා අපනයන පාලන පනතයි.

**රථ වාහන අංශය**

AsyCuda World' මෘදුකාංගය හා ඇඳුනු ACCESS ජාලය හා සම්බන්ධ වීමෙන් රේගුවට බැංකු සමග සම්බන්ධ වී වාහන ආනයනයේදී ප්‍රේෂණය කෙරෙන විදේශ විනිමය පරික්ෂා කර බැලිය හැක. ආනයනය කරනු ලබන වාහන ලියාපදිංචිය පහසු කරවා ගැනීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමගද සම්බන්ධ කර ඇත. එමගින් රේගු බදු නොගෙවන ලද වාහන ලියාපදිංචිය වැලැක්විය හැකිය.

රේගු සටහන්කර පිළියෙල කිරීමේදී පහත කරුණු පිළිබඳ අවධානය යොමු කෙරේ.

- ✓ ත්‍යාග හා පරණ වාහන සඳහා ආනයන පාලන බලපත්‍ර
- ✓ තීරුබදු සහන යටතේ රාජ්‍ය සේවකයන්ට පාර්ලිමේන්තු නියෝජිතයන්ට හා ආයෝජන ප්‍රවර්ධන අධිකාරී බලපත්‍ර
- ✓ රාජ්‍යතාන්ත්‍රිකයන්ට හා රාජ්‍ය නොවන සංවිධානවලට විදේශ කටයුතු අමාත්‍යාංශ ප්‍රධානීන්ට තීරුබදු රහිත බලපත්‍ර ලබාදීම.
- ✓ ව්‍යාපෘති සඳහා ආනයනය කරන ලද වාහන සඳහා තාවකාලික රේගු සටහන් කර පිළියෙල කිරීම.

ඊට අමතරව රේගු සටහන් කර පිළියෙල කිරීමේදී පහත සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව පරීක්ෂා කරනු ලැබේ,

- **පහත සඳහන් ලේඛන වල ප්‍රකාර භාණ්ඩ විස්තර නිවැරදි දැයි පරීක්ෂා කර බැලීම.**
    - ලියාපදිංචි කිරීමේ සහතිකය
    - පරීක්ෂා කිරීමේ සහතිකය
    - ඉන්වොයිසිය
    - අංගනයේ සිටින තක්සේරුකරු විසින් ලබාදුන් වාහනය පරීක්ෂා කිරීමේ වාර්තාව.
- වාහනයේ වයස නිවැරදිව ගණනය කිරීම.
- වාහනයට ලැබෙන රේගු වටිනාකම නිවැරදිද යන වග
- ඉන්වොයිස් පත්‍රය අනුව ඇති මුදල් වර්ගය නිවැරදිව සටහන් කර තිබීම නිවැරදිදැයි බැලීම.
- නිෂ්පාදිත නැව් ගාස්තු නිවැරදිව ප්‍රකාශ කර ඇත්ද?,
- පරික්ෂා කිරීමේ සහතිකය සමඟ ඇති අමතර උපාංග ගැලපීම.
- සහනදායී ආනයන සඳහා අදාළ බලපත්‍ර අනුමත කිරීම, වාහනයේ නිශ්කාෂණය කිරීම රථවාහන අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ අනුමත කල යුතුය.

**කර්මාන්ත හා සේවා ලේඛන සකස් කිරීමේ ඒකකය**

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යය වන්නේ ගුදම් ගත කිරීමේ ( To - Bond)- ගුදමෙන් නිදහස් කිරීමේ (Ex- Bond) සටහන් කර අනුමත කිරීම වන අතර ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර මෙය බැඳුම්කර ඒකකයේ කොටසක්ව පැවතිණ. කර්මාන්ත හා සේවා සඳහා වෙනම කාර්යාංශයක් තිබුණද, අදාල රේගු සටහන්කර අනුමත කිරිම සිදු කරනුයේ ප්‍රකාශන කාර්යාංශය විසිනි.

**ලේඛන ගත කිරීමේ මධ්‍යස්ථානය : (DOC Center)**

මෙම මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ වාර්මිස් තොටු මළුවේ වන අතර, ඉදිරියේදී එය නව මූලස්ථාන කාර්යාලය දෙවන මහළේ වන රේගු දිගු කාමරය සමගින් ඒකාබද්ධ කිරීමට අපේක්ෂිතය. මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්ය භාරය පහත පරිදි වේ.

- සියළුම FCL බඩුතොග සඳහා (අභ්‍යන්තර) රේගු ගේට්ටු අවසර පත් නිකුත් කිරීම (ආනයන, ආයෝජන මණ්ඩල, INFAC, බැඳුම්කර, UPB, කැටුව නොඑන පුද්ගලික බඩු. RTF ද ඇතුළුව විවිධ විමර්ශන ශාඛා විසින් රඳවා තබාගත් කන්ටේනර්. )
- කන්ටේනර් ඒවායෙහි (අපනයනය සඳහා වන තාවකාලික ආනයන) පර්යන්තවලින් ඉවත් කිරීම සඳහා SLPA/SAGT/CICT ගේට්ටු අවසර පත් නිකුත් කිරීම පිණිස නියෝග නිකුත් කිරීම.
- **ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයට ලැබෙන ලේඛන**
    - රේගු දිගු කාමරයේ සහ බැඳුම්කර අංශයේ ඇති සුපරීක්ෂණ ඒකක මගින් පරීක්ෂා කර යොමු කරනු ලබන රේගු ප්‍රකාශනවලට අදාළව අභ්‍යන්තර රේගු ගේට්ටු අවසරපත් නිකුත් කිරීම සඳහා ඒවා ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයට යොමු කරනු ලැබේ.
    - SLPA/SAGT/CICT ට අදාළ පර්යන්තවලින් කන්ටේනර් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසර පත් නිකුත් කිරීමට අනුමැතිය ලබාදීමට SC-DOC හට හැකිවනු පිණිස ඉන්වොසිය සහ නැව් භාර පත්‍රය සමගින් භාර දිමේ ඇණවුමේ රෝස පැහැති පිටපත SC-DOC වෙත ඉදිරිපත් කරනු ලැබේ. භාර දීමේ ඇණවුමෙහි මෙකී රෝස පැහැති පිටපත ප්‍රථම වරට රේගුවට භාර දෙනු ලබන්නේ මෙම ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයේදී වේ. (එකී පිටපතෙහි රේගුව විසින් සිදු කළ කිසිඳු පිටසනක් සඳහන් නොවන බැවින් එය ප්‍රකාශන අංශයේදී / රේගු පරීක්ෂණාගාරයේදී භාර ගන්නා ලේඛන කට්ටලයට ඇතුළත් නොකරනු ලැබේ.

- **ලේඛනගත කිරීමේ මධ්‍යස්ථානයේදී අනුගමනය කරනු ලබන කාර්ය පටිපාටිය**

    - පරීක්ෂාවට ලක් කළ රේගු ප්‍රකාශයේ රෝස පැහැති පිටපත හා භාරදීමේ නියෝගයේ රෝස පැහැති පිටපත ලේඛන ගත කිරීමේ මධ්‍යස්ථානයේ ලියාපදිංචි කරනු ලැබේ. (ICC I විසිනි)

    - ලියාපදිංචි කළ ලේඛන SC (Doc Centre) වෙත ඉදිරිපත් කෙරේ.

    - SC (Doc Centre) විසින් ලේඛන සහතික කළ පසු

        - පද්ධතියට තොරතුරු ඇතුළත් කර, කන්ටේනරය පර්යන්තයෙන් ඉවත් කිරීම සඳහා ගේට්ටු අවසරපතක් ලබාගැනීම සඳහා භාරදීමේ ඇණවුමේ රෝස පැහැති පිටපත SLPA/SAGT/CICT වෙත ඉදිරිපත් කරනු ලැබේ.

        - පද්ධතියට තොරතුරු ඇතුළත් කර, ASC (Doc Centre) විසින් නිකුත් කරන අභ්‍යන්තර ගේට්ටු අවසර පත්‍ර ලබාගැනීම සඳහා SLPA/SAGAT/CICT ගේට්ටු අවසර පත සමගින් රේගු ප්‍රකාශයේ භාරදීමේ පිටපත ASC (Doc Centre) වෙත යොමු කරනු ලැබේ.

        - රේගු ගේට්ටු අවසර පත නිකුත් කිරීමෙන් අනතුරුව CICC (Doc Centre) විසින් අදාළ රේගු ප්‍රකාශයේ භාරදීමේ පිටපතෙහි ඡායා පිටපත් සහ වාජ්පු ලිපිකරුගේ CHA අවසරපත මෙන්ම රේගු අභ්‍යන්තර ගේට්ටු අවසර පතෙහි කොළ පැහැති පිටපත ගොනු ගත කර ලියාපදිංචි කරනු ලැබේ.

        - මෙකී ගේට්ටු අවසර පත් දෙක (SLPA/SAGT/CICT සහ රේගු අභ්‍යන්තර ගේට්ටු අවසර පත) ලබාගත් පසු කන්ටේනර් එම කන්ටේනර් පර්යන්තවලින් ඉවත් කරගෙන නව කන්ටේනර් ගේට්ටුව (New Container Gate) දක්වා රැගෙන ඒමට අවසර ලැබෙන අතර, එහිදි රේගු බාහිර අවසරපත නිකුත් කර කන්ටේනරය වරාය පරිශ්‍රයෙන් ඉවතට ගෙනයාමට අවසර දෙනු ලැබේ.

        - නව කන්ටේනර් ගේට්ටුවේදී එකී කන්ටේනරයෙහි රේගුවේ කන්ටේනර් මුද්‍රාව තබන අතර, එම මුද්‍රා අංකය රේගු ගේට්ටු අවසර පතෙහි මුද්‍රණය කරනු ලැබේ.

**බදු ගෙවීමෙන් තොරව දේශ සීමා හරහා භාණ්ඩ ගෙනයාමට රේගුවෙන් ලබාදෙන අවසරපත්‍ර (Carnet)**

1. බදු ගෙවීමෙන් තොරව දේශ සීමා හරහා භාණ්ඩ ගෙනයාමට ලබාදෙන රේගු අවසර පත්‍ර වර්ග දෙකකි. ඒවා ATA සහ CPD නම් වේ.
2. ATA අවසර පත්‍ර – "ATA" යනු "Admission Temporaire / Temporary Admission" ප්‍රශ සහ ඉංග්‍රීසි වචනවල මුල අකුරු එකතු කර සකස් කරන ලද කෙටි නාමයකි.
3. වාණිජ භාණ්ඩ සාම්පල, ප්‍රදර්ශන භාණ්ඩ සහ වෘත්තීයවේදී උපකරණ තාවකාලිකව රටක් තුළට ආනයනය කිරීම ATA අවසර පත්‍ර මගින් ආවරණය කෙරේ.
4. CPD අවසරපත්‍ර - මෝටර් වාහන සහ ට්‍රේලර් සඳහා "Carnet De Passages En Douane"
5. Triptique - යතුරුපැදි සඳහා

6. 1992 වර්ෂයේදී සංශෝධනය කරන ලද, පෞද්ගලිකව මහාමාර්ග වාහන තාවකාලිකව ආනයනය කිරීම (1954) සහ වාණිජ මහාමාර්ග වාහන තාවකාලිකව ආනයනය කිරීම (1956) පිළිබඳව වන රේගු සම්මුතින්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව සකස් කරන ලද මෙම බඳු ගෙවීමෙන් තොරව භාණ්ඩ ගෙන ඒමට ලබාදෙන රේගු අවසර පත්‍රය ලයිස්තුගත රටවල / රේගු දේශභූමි තුළ භාවිතා කළහැක.

7. ආනයනය කරන ලද ස්වභාවයෙන්ම ප්‍රති අපනයනය කිරීමට ඇති භාණ්ඩ ඇතුළත්වන ඕනෑම තාවකාලික කාර්යකරණයකට A.T.A. ක්‍රියා පටිපාටිය උපයෝගී කර ගත හැක.

8. නියම කර ඇති වලංගු කාලසීමාව තුළ අවසර පත්‍රය හිමිකරු විසින් වාහනය ප්‍රති අපනයනය කරන බවට සහ තාවකාලික මෝටර් වාහන බලපත්‍රවලට අදාළ රේගු නීති සහ නියමයන්ද අනුකූල විය යුතු බවට වන කොන්දේසි මත එය නිකුත් කරනු ලැබේ.

9. A.T.A. අවසරපත්‍රයක් පිළිගනු ලැබූ විටකදී එය නියම කරනු ලබන වෙනත් කිසිඳු අපනයන ලිපි ලේඛනයකට (විනිමය පාලන අවසර පත්‍රයට හෝ අපනයන බලපත්‍රයකට) හිලව් කළ නොහැක. එවැනි අවශ්‍යතාවයන් වෙනමම සම්පූර්ණ කළයුතුය.

10. Carnet අවසර පත්‍රය නිවැරදිව නිදහස් කිරීමට නම් ඇතුල්වීමේදී රේගුව විසින් මුද්‍රා තබන ලද ආනයන වවුචරයට අනුරූප අපනයන වවුචරය රටින් පිටවන අවස්ථාවේදී රේගුව විසින් මුද්‍රා තැබිය යුතුය.

11. Carnet අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේදී අවසර පත්‍ර කරු එම අවසර පත්‍ර භාවිතා කිරීම සඳහා දී ඇති නියමයන්ට අනුව එම අවසර පත්‍ර නිකුත් කිරීමේ අදාළ අධිකාරිය සමඟ ප්‍රකාශයක් සහ ගිවිසුමක් අත්සන් කළයුතුය.

12. සම්මුතියේ සඳහන් කිසියම් විධිවිධානයක් කඩ කිරීමක්, කිසියක් ආදේශ කිරීමක්, සාවද්‍ය ප්‍රකාශයක් හෝ සිදු කර ඇත්නම්, එම වරද සිදු කරනු ලැබ ඇති රටෙහි නීති මගින් නියම කර ඇති දඬුවම්වලට යටත්ව එම වරද සිදුකරන ලද පුද්ගලයා ඒ සඳහා වගකිව යුතු වේ.

13. රේගු අධිකාරීන් A.T.A. Carnet අවසර පත්‍ර සම්මුතියට අමතරව පහත සඳහන් සම්මුතීන්ටද ගිවිසුම්කාර පාර්ශවයන් වන්නේ නම් පමණක් පහත සඳහන් කාර්යකරණයන් සඳහා A.T.A. Carnet අවසර පත්‍රය භාවිතා කළහැක.

13.1 වෘත්තීයවේදී උපකරණ සම්මුතිය
13.2 ප්‍රදර්ශන සහ සල්පිල් සම්මුතිය
13.3 වෙළඳ සාම්පල සම්මුතිය
13.4 ඇසුරුම් සම්මුතිය
13.5 මුහුදු ප්‍රවාහන සම්මුතිය
13.6 විද්‍යාත්මක උපකරණ සම්මුතිය
13.7 අධ්‍යාපනික ආධාරක ද්‍රව්‍ය සම්මුතිය
13.8 පෞද්ගලික මහාමාර්ග සහ වෙළඳ මහාමාර්ග වාහන සම්මුතිය
13.9 අභස්යානා සහ විනෝද බෝට්ටු සම්මුතිය

## Carnet De Passage අවසර පත්‍ර ක්‍රියාපටිපාටිය

1. මෙම අවසර පත්‍රය පිටකවරයකින් සහ අවසරපත්‍රය මගින් ආවරණය වන භාණ්ඩවල එක් එක් ගමනය සඳහා අවශ්‍ය වන පිටුවලින් සමන්විත වේ. පිට කවරයේ ඉදිරිපස කොටසින් පහත සඳහන් තොරතුරු සපයා දේ.

    1.1 නිකුත් කිරීමේ සංගමය
    1.2 අභ්‍යන්තර ඇපපත්‍ර දාමය
    1.3 හිමිකරුගේ නම
    1.4 වලංගු කාලසීමාව
    1.5 එය වලංගුවන රටවල් සහ එම රටවල අනුරූප ඇපවීමේ සංගම්; සහ
    1.6 හිමිකරුගේ නියෝජිතයකු විසින් අවසර පත්‍රය භාවිතා කරන්නේ නම් එම නියෝජිතයාගේ නම.

2. භාණ්ඩ යොදාගැනීමට අපේක්ෂා කරන කාර්යය ඉදිරිපස පිටකවරයේ සඳහන් කර ඇති (උදා:- ප්‍රදර්ශනය සඳහා සාම්පල ආදි වශයෙන්). Carnet අවසර පත්‍රයෙන් ආවරණය කිරීමට නියමිත සියළුම භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විස්තරය පිටකවරය පිටුපස ඇති පොදු ලැයිස්තුවට ඇතුළත් කර ඇත. Carnet අවසර පත්‍රයෙන් ආවරණය කිරීමට නියමිත සියළුම භාණ්ඩ පිළිබඳ විස්තර ඇතුළත් කිරීම සඳහා පිටකවරය සහ අනෙකුත් පිටුවල ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවල අමතර පිටු ඇතුළත් කරනු ලැබිය හැක. අවශ්‍ය කරන තොරතුරු වන්නේ විස්තර කිරීම, සලකුණු සහ අංක (තිබේනම්), ප්‍රමාණය, අවසරය පත්‍රය නිකුත් කරනු ලබන රටෙහිදී භාණ්ඩයේ වටිනාකම සහ නිෂ්පාදනය කරනු ලැබූ රට ආදිය වේ. පැහැදිලි හඳුනා ගැනීමේ අංක භාණ්ඩවල සඳහන් නොවේ නම් රේගුව විසින් හඳුනා ගැනීමේ සලකුණු ඇලවිය හැක.

3. Carnet අවසරපත්‍රය කාර්ය ගත කිරීම DC විසින් අනුමත කර වලංගු කාලසීමාව තීරණය කරනු ලබයි.

4. එම අවසර පත්‍රය ලියාපදිංචි කරන ලෙස DDC විසින් SC 'D' ට උපදෙස් දෙනු ලබයි.

5. අවසර පත්‍රය ලියාපදිංචි කර එම ලේඛනවල පිටපත් තබා ගන්නා ලෙස SC විසින් ASC ට උපදෙස් දෙනු ලබයි.

6. ASC විසින් අවසර පත්‍රය ලියාපදිංචි කර මෝටර් වාහන අංශයේදී රේගු ප්‍රකාශන ක්‍රියාවලිගත කිරීමට භාණ්ඩ තොග ලබන්නාට අවසර දෙනු ලබයි.

7. ගොනු ගත කර ඇති ආනයන ලියවිල්ලේ SC විසින් අත්සන් කර මුද්‍රාව තබා, එම අවසර පත්‍රය යටතේ ආනයනය කරනු ලබන එකී වාහනය මාස තුනක කාලයක් ඇතුළත ප්‍රති අපනයනය කරනු ලබන බවට සහතික වෙමින් DC ඉදිරියේ ගිවිසුමක් (ප්‍රකාශයක්) අත්සන් කරන ලෙසට ආනයනයකරුවන්ට උපදෙස් දෙනු ලබයි.

8. පාලක ලේඛනය පවත්වා ගෙන යනු ලබන අතර, වලංගු දිනය මත ලේඛනයක් තබයි.

9. DDC විසින් එකී වාහනය නිදහස් කිරීමට අවසර ලබාදෙන පරිදි රේගු ප්‍රකාශන සමඟ එම අවසර පත්‍රය ඉන්පසුව මෝටර් වාහන ඒකකය වෙත යවනු ලැබේ.

10. විදේශීය භාණ්ඩ විකිණීමේ අරමුණ ඇතිව පෞද්ගලික අභිමතාර්ථයන් සඳහා සාප්පුවල හෝ ව්‍යාපාරික ස්ථානවල සංවිධානය කරනු ලබන ප්‍රදර්ශන මෙම අවසර පත්‍රය මගින් ආවරණය කරනු නොලබයි.

    10.1 වලංගු කාලය මාස තුනට වඩා අඩුකාලයක් නොවන්නේ නම් මිස, තාවකාලික ඇතුල්වීමේ අවසරය ලබාදී ඇති භාණ්ඩ මාස තුනක කාලයක් ඇතුළත ප්‍රති අපනයනය කළයුතුය.

10.2 ඇතුල්වීමේ ස්ථානයන්හිදි Carnet අවසර පත්‍ර රේගුවට ඉදිරිපත් කරනු ලැබූ විටදී, රේගු නිලධාරීන් විසින් අදාළ භාණ්ඩ අවසර පත්‍රයේ දී ඇති පොදු භාණ්ඩ ලේඛනයෙහි සඳහන් භාණ්ඩවල නම් සමඟ සංසන්දනය කර බලා, හැකිනම් භාණ්ඩමත හඳුනාගැනීමේ සලකුණු තබා, එම හඳුනාගැනීමේ සලකුණු අවසර පත්‍රයේ උප පත්‍රිකාවෙහි සටහන් කර, ආනයන වවුචරයේ රේගුව සඳහා ඇති කොටස රඳවා තබා ගතයුතුය. අවශ්‍ය විස්තර රේගුව විසින් උපපත්‍රිකාව පිටපැත්තෙහි ලියනු ඇත. අදාළ භාණ්ඩ ප්‍රති අපනයනය කරන විටදී නැවත පරීක්ෂා කිරීම සඳහා වවුචරය ගොනු ගත කර, ආරක්ෂිතව තබාගැනීම පිණිස එය 'D' ශාඛාව වෙත යැවිය යුතු වේ.

11. Carnet අවසරපත්‍රයක් මත ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රති අපනයනය කරන විටදී, එම භාණ්ඩ ආනයනය කිරීමට අදාළ විස්තර රේගුව විසින් පරීක්ෂා කර බලා ප්‍රතිඅපනයනය කිරීමේ වවුචරයේ රේගුව සඳහා ඇති කොටස වෙන් කර ගෙන උප පත්‍රිකාවෙහි අවශ්‍ය පිටපසන් යොදනු ලැබේ. ප්‍රති අපනයනය කිරීමේ වවුචරයේ වෙන් කර ගන්නා ලද කොටස 'D' ශාඛාව වෙත යවනු ලැබේ.

13. භාණ්ඩ ආනයනය කිරීම සහ / හෝ අපනයනය කිරීම සඳහා Carnet අවසරපත්‍රයක් භාවිතා කිරීම අදාළ රටෙහි ජාතික නීතිවලට යටත් වන්නේය.

14. අවසරපත්‍රයේ සඳහන් විධිවිධාන අනුව හෝ රටෙහි ජාතික නීතිවලට එරෙහි කිසිදු වංචාවක්, උල්ලංඝණය කිරීමක් හෝ අයුතුලෙස යෙදා ගැනීමක් සිදු කරනු ලබන ඕනෑම carnet අවසර පත්‍ර හිමියෙකුට විරුද්ධව ක්‍රියා කිරීමටත්, එවැනි උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමටත් රේගුවට අයිතිය තිබේ.

**2014 වසරේ ප්‍රකාශන කාර්යංශයේ කාර්යසාධනය**

1. 2014 වසර සඳහා වූ අංශයන්වලට අදාළ කාර්ය සාධනය Asycuda world අසිකුඩා වර්ල්ඩ් යනුවෙන් හඳුන්වනු ලබන ස්වයංක්‍රීය ක්‍රමය යටතේ ව්‍යාපාර සඳහා පහසුකම් සැපයීම ආනයනකරුවන්ගේ භාණ්ඩ ඉක්මණින් නිශ්කාෂණය හේතුවෙන් ආනයනකරුවන් විසින් ජයග්‍රාහී ලෙස මෙම සේවය ලබාගෙන ඇත. විශේෂයෙන් කෙලින්ම ව්‍යාපාර දායකත්වය (DTI) ක්‍රමය භාවිතය ව්‍යාපාරියින් අතර ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වී ඇති අතර, ඒ මගින් ව්‍යාපාර සඳහා අමතර වටිනාකමක්ද ලැබී ඇත.

2. DTI මගින් රේගු නිලධාරීන් මත පැටවී ඇති බර අඩු වී ඇති අතර, ඔවුන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නංවා ඇත.

3. නව හඳුන්වාදීම මගින් මෙම අංශයේ සාමාන්‍ය ලේඛනගත කිරීම සිදුවීම අඩු වී ඇති අතර, තොරතුරු එකතු කිරීමේ තත්වය සහ අඩුකාලය හේතුවෙන් නිලධාරීන්ට මෙන්ම මහජනයාටද පහසු කටයුත්තක් වනු ඇත.


4. මෙම අංශය මගින් 2014 වසරේ එකතු කරන ලද සම්පූර්ණ ආදායම රු. 415,413,606,765.00 ක් වන අතර, රු. 67,133,110,388.00 ප්‍රමාණයක් මුළු රේගු බදු ආදායම ලෙස රාජ්‍ය ආදායමට එකතු විය. ඒ හැර ඉහත සඳහන් කල අය කිරීම් තුල රු. 34,315,750 දඩ රාජසන්තක කල මුදල්/ අතිරේක අයකිරීම් යනාදිය **D** අංශයෙන් එකතු කර ඇත.

5. තෝරාගත් රන් කාඩ්පත් තබා ඇති ව්‍යාපාරිකයින්ට හරිත මාර්ග පහසුකම ගිය වසර හඳුන්වා දී ඇත. 2014 වසරේ රන් කාඩ්පත් තබා ඇති ව්‍යාපාරිකයන්ට හා සමහර ඉහළ ව්‍යාපාරිකයින්ට සීඝ්‍ර මාර්ග ක්‍රමය රේගුව හඳුන්වා දී ඇත. දැනට මෙම ක්‍රමය යටතේ ව්‍යාපාරිකයින් 218 ඇතුළත් වී ඇත. මෙම විශේෂ ව්‍යාපාරිකයින් මෙහෙය වීම සඳහා නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් හඳුන්වා දී ඇත.

6. ඉලෙක්ට්‍රොනික නැව් බඩු ලේඛන ක්‍රමයක් දැන් හඳුන්වා දී ඇත. නැව් නියෝජිතයින් ඔවුන්ගේ භාණ්ඩ ලේඛන නැවෙන් නැවට වෙනම මුද්‍රිත පිටපත් ඉදිරිපත් නොකර කෙලින්ම (on line) මගින් ඉදිරිපත් කරනු ලබයි. මෙම ක්‍රමය දෙපාර්තමේන්තු භාවිතා කරන්නන්ට සාර්ථක සහයෝගයක් ලබාදෙනු ලැබේ.

7. D අංශයේ නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ විසින් මෝටර් රථ බලපත්‍ර අවලංගු කිරීම විද්‍යුත් මගින් සිදු කරයි.

8. පෝලින් පෙන්වා දීමේ ක්‍රමය හඳුන්වා දීම 2014 වසරේ ආරම්භ කර ඇත. මෙම ක්‍රමය රේගු ප්‍රකාශනයේ තත්වය මහජනතාවට එළිදක්වන අතර, මෙමගින් මෙම අංශයේ සියළු නිලධාරීන් දෛනික කාර්ය සාධනය ලබාගැනීමට පහසු වේ.




**කොළඹ වරායේ සිට බහාලුම් මෙහෙයුම් - 2014**

| **ප්‍රධාන ක්‍රියාකාරකම් 8.1**<br>**පද්ධතිය ප්‍රතිසැකසුම් කිරීම සඳහා දැනට පවතින CusDec ක්‍රියාවලී පද්ධතිය සමාලෝචනයට ලක් කිරිම** | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන පියවරයන් | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
| 1. AsyCuda World System හි පවතින බාධාවන් හා අඩුපාඩු හඳුනාගෙන ඒවාට අවශ්‍ය පිළියම් යෙදීම | X | | | | ප්‍රධාන ක්‍රියාකාරකම් 8.1 හි 1, 2 හා 3 වන ප්‍රධාන පියවරයන් ක්‍රියාත්මක කිරීම සඳහා AsyCuda පිළිබඳ තාක්ෂණික හා ක්‍රියාකාරිත්වය සම්බන්ධ අධ්‍යයනයන් සඳහා නිලධාරීන් කණ්ඩායමක් ජෝර්දාන රේගුව වෙත යැවිණ |
| 2. ද්විත්ව හෝ බහු සටහන්කර ඉදිරිපත් කිරීම වැලැක්වීම සඳහා නැව් බඩු ලේඛන පාලන කටයුතු වලදී භාවිතා කරන AsyCuda World System සංවර්ධනය කිරිම | | X | | | - එම - |
| 3. දිගු කාමරයේ සටහන්කර පරීක්ෂාව හා භාණ්ඩ පරීක්ෂා කරන ස්ථානයන්හි (නිල්, රතු, කොළ) නිලධාරින් යෙදවීම ස්වයංක්‍රීය කිරීම. | | X | | | - එම - |
| 4. දිගු කාමරයේ Cusdec පරීක්ෂා කිරීමේ හා අධීක්ෂණය කිරීමේ පද්ධතියක් නිර්මාණය කිරීම හා එය ක්‍රියාත්මක කිරීම සහ කැඳවීම සඳහා ප්‍රදර්ශන පුවරුවක් හඳුන්වා දීම | | | X | | - එම - |
| 5. ප්‍රගති සමාලෝචනය | | | | X | - එම - |

| ප්‍රධාන ක්‍රියාකාරකම් 8.2<br>**සීමා කිරීම් සම්බන්ධයෙන් වෙනත් රජයේ ආයතන සමගින් සහ බදු නිදහස් කිරීම් හා විරාමයන් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමගින් එක් කවුළු සංකල්පය යටතේ විද්‍යුත් සන්නිවේදන පද්ධතියක් සකස් කිරීම.** | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන පියවරයන් | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
| (1) ADP අංශය හා එක්ව ශ්‍රී.ලං.ප්‍ර.කා. වි.නි.කො. ආනයන පාලක, CDDA, ශාබ නිරෝධායන, ශ්‍රී.ලං.ව.අ., SAGT, CICT ආදී ආයතන සමග පරිසනක සම්බන්ධතාව ගොඩනැගීම - එක් කවුළු පරිසරය | X | | | | දැනටත් රේගු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල තුළ රජයේ ආයතන විසින් සියළු සේවා එක් තැනකදී (one stop shop) සංකල්පය යටතේ කවුළුවක් ස්ථාපිත කොට ඇත. කෙසේ වෙතත් පරිගණක සබඳතාවය තවමත් ස්ථාපිත වී නොමැත. |
| (2) එවන් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ ඉඩ ප්‍රස්ථාව සොයා බලන ලෙස අනෙකුත් ආයන වෙත දැනුම්දීම | | X | | | - එම- |
| (3) මුදල් ප්‍රවාහය සහ Cusdec ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා ස්වයංක්‍රීය පද්ධතියක් ස්ථාපිත කිරීම | | | X | | - එම- |
| (4) ප්‍රගති සමාලෝචනය | | | | X | - එම- |

| **ප්‍රධාන ක්‍රියාකාරකම 8.3 :**<br>**එක් කවුළු සංකල්පය යටතේ Cusdec ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මුදා හැරීම පාලනය කිරීම හා ඒ සඳහා අවසර ලබා දීම සඳහා සේවා සපයන්නන් (ශ්‍රී.ලං.ව.අ. SAGT ආදී) සමග විද්‍යුත් සන්නිවේදන පද්ධතියක් සකස් කිරීම.** | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන පියවරයන් | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
| 1. අපගේ පද්ධතිය SAGT, CICT හා ශ්‍රී.ලං.ව.අ. පද්ධතිය සමග සමමූර්ත කිරීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳව සොයා බැලීම. AsyCuDa World තුලින් මෙය ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳව ADP සමග සාකච්ඡා කිරීම | X | | | | පද්ධතියේ අනනුකූලතාව හේතුවෙන් දොරටු අවසරපත් නිකුත් කිරීමේ මධ්‍යගත පරිඝනක සැලසුම තවමත් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. |
| 2. වැඩි පාරදෘශ්‍යභාවයක් අත්පත් කර ගැනීම පිණිස භාරදීම් ඇණවුම් පරිඝනක මාර්ගයෙන් ලබා දීම සඳහා නැව් සමාගමේ ප්‍රධාන නියෝජිතයා සමග සාකච්ඡා කිරීම | | X | | | - එම - |
| 3. ක්‍රියාවට නැංවීම | | | X | | - එම - |
| 4. ප්‍රගති සමාලෝචනය | | | | X | - එම - |

| **ප්‍රධාන ක්‍රියාකාරකම 8.4 :**<br>**වේගවත් නිෂ්කාශන පද්ධතියක් සකස් කිරීම හා AEO සංකල්පය හඳුන්වා දීම** | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන පියවරයන් | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
| 1. ගැටළු සහගත තත්ත්වයන් වලක්වාගැනීම පිණිස වේගවත් නිෂ්කාශන පද්ධතියේ CusDec ක්‍රියාවලිය හා භාණ්ඩ පරීක්ෂණ ක්‍රියාවලිය සකස් කිරීම | | | | | චීනය, ඉන්දියාව, ඉරානය, එ.අ.එ. රාජ්‍යය යන රටවල් සමග සාකච්ඡා පවත්වමින් සිටින අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම ඉදිරියේදී සිදුවීමට නියමිතය. |
| 2. AEO තත්ත්වය පිරිනැමීම සඳහා ජාතික ආර්ථික ක්‍රියාකාරකයන් සකස් කිරීම | | | | | - එම - |
| 3. වැඩිපුර ආයතන සංඛ්‍යාවක් වෙත AEO තත්ත්වය ප්‍රදානය කිරීම හා පහසුකම් ව්‍යාප්ත කිරීම | | | | | - එම - |
| 4. ප්‍රගති සමාලෝචනය | | | | | - එම - |

# කර්මාන්ත හා සේවා අංශය

**හැඳින්වීම**

ඓතිහාසිකව රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ ආනයන හා අපනයන බදුකරණයයි. යම් විශේෂ හේතූන් මත මෙම බදුකරණ ක්‍රියාවලිය 'බැඳුම්කර' ආකාරයෙන් සීමිත කාලයකට තාවකාලිකව නතර කරනු ලබන (අත්හිටුවන) අවස්ථා තිබේ. රේගු ව්‍යවහාරයේදී 'බැඳුම්කර' යන්නෙන් අදහස් කරනුයේ ආනයනය කරන ලද බදු අය කළ යුතු භාණ්ඩ එම කාර්යය සඳහාම වෙන් වූ 'බැඳුම්කර ගුදමක්' ලෙසින් හඳුන්වනු ලබන ගබඩාවක ආරක්ෂිතව තැබීමයි.

අතීතයේදී මෙම 'බැඳුම්කර' ක්‍රමවේදය යොදාගනු ලැබුවේ බදු ගෙවීමකින් තොරව සිය ආනයනික භාණ්ඩ නැවත අවශ්‍ය වන තෙක් 'රැජිනගේ ගබඩාවේ' තැන්පත් කොට තබන වෙළඳුන් හට අවශ්‍ය පහසුව සැපයීමයි. ඇතැම් අවස්ථාවල වෙළඳුන් මූල්‍ය හේතු මත භාණ්ඩ බැඳුම්කරණය කිරීමටද ඉදිරිපත් වී ඇත. පසු කාලයකදී මෙම ක්‍රමය වෙනස් වී නිෂ්පාදකයන් හට බදු ගෙවීමකින් තොරව අමුද්‍රව්‍ය ගබඩාකොට තැබීමටත් එම අමුද්‍රව්‍ය යොදාගනිමින් අපනයනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ඉඩ දීම දක්වාත් විකාශනය විය. එමගින් ඔහුට බදු ගෙවීමට අවශ්‍යතාවයක් උදා නොවුනු නමුත් රටට අවශ්‍ය විදේශ විනිමය ඉපැයීමට එය හොඳ අවස්ථාවක් විය. මෙම මූලික සංකල්පයට විවිධ එකතුවීම් සිදුව ඇති අතර එමගින් විවිධ නව කර්මාන්තයන් හට ඉදිරියට ඒමට අවස්ථාව නිර්මාණය වී තිබේ. දැනට එය රටේ කර්මාන්ත හා ආර්ථික වර්ධනයට දිරි දීමේ ක්‍රමවේදයක් ලෙස ඉදිරියට පැමිණ ඇත. මෙහි වඩාත්ම වැදගත් කාර්යය වනුයේ එය අප රට ජාත්‍යන්තර වෙළඳාමේ කරලියට ගෙන ඒමයි.

කර්මාන්ත හා සේවා අංශය ආනයනය කරන ලද භාණ්ඩ, කර්මාන්ත හ වාණිජ අවශ්‍යතාවයන් පරිදි විශේෂිත ක්‍රියා පටිපාටි යටතේ නිෂ්කාශනය කිරීම සඳහා ආරක්ෂිත / බැඳුම්කර යටතේ තාවකාලිකව ගබඩා කර තැබීමට අදාල රේගු කටයුතු සිදු කරයි. එමෙන්ම රේඛීය ආයතන සම්බන්ධීකරණය කිරීම මගින් එනම්, විශේෂයෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග සම්බන්ධිකරණය මගින් නිෂ්පාදන / අපනයන කර්මාන්ත විවිධාංගීකරණ ප්‍රවණතාව ගවේෂණය කිරීමේ අරමුණින් කටයුතු කිරීම සඳහා එකී කර්මාන්ත ධෛර්යමත් කරයි.

**ප්‍රධාන කාර්යයන්**

වෙළඳාම පහසු කිරීමේ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම / පරිපාලනය කිරීම මෙම කාර්යාංශය වෙත පවරා ඇති කාර්යභාරය වේ. කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

1. රේගු බැඳුම්කර ගබඩා කළමනාකරණය කිරීම.
2. අපනයන සැකසුම් සඳහා වන තාවකාලික ආනයන හා තීරුබදු ප්‍රතිදාන පරිපාටි ආදී අපනයන පහසුකරවීමේ යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම.
3. තීරු බදු රහිත සාප්පුවල කටයුතු කළමනාකරණය කිරීම.
4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාරවලට අදාල භාණ්ඩ ආනයන / අපනයන කටයුතු කිරීමේදී එම ආයතනය සමග සම්බන්ධිකරණය කිරීම.
5. බඩු ගබඩා කිරීම, තොග පාලනය, නැව් බඩු පාලනය හා ආයෝජන මණ්ඩලයේ ආනයන / අපනයන සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ පද්ධති පවත්වා ගෙන යාම සඳහා ICT කාර්යාංශය සමග සම්බන්ධිකරණය කිරීම.
6. 'විලම්බන තන්ත්‍ර' රේගු සටහන්කර. සකස් කිරීමේදී ප්‍රකාශන කාර්යාංශය සමග සම්බන්ධිකරණය කිරීම.


කර්මාන්ත හා සේවා කාර්යාංශයේ ප්‍රධාන ශාඛා

I. ලේඛන ශාඛාව
II. ව්‍යාපෘති ශාඛාව
III. නියාමන හා ආපසු ගෙවීමේ ශාඛාව
IV. ආයෝජන මණ්ඩල කර්මාන්ත සම්බන්ධිකරණ ඒකකය
V. තැපැල් තක්සේරු (කොළඹ) ශාඛාව

**ලේඛන ශාඛාව**


සකස් කරන ලද රේගු සටහන්කර සංඛ්‍යාව


| | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| (අ) ප්‍රධාන කාර්යාලයේ ඇති මුළු රේගු සටහන්කර සංඛ්‍යාව | 95,397 | 110865 | 97222 |
| (ආ) ආයෝජන පහසුකම් අංශයෙහි ඇති මුළු රේගුසටහන් කර සංඛ්‍යාව | 4,618 | 5,154 | 5,391 |



**අය කර ගැනීම්**

| | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| **ආදායම් එකතුකර ගැනීම (රු. මිලියන)** | 15,783 | 21,211.9 | 22,917 |
| **පරීක්ෂණ ගාස්තු (රු. මිලියන)** | 7.3 | 8..08 | 10.16 |



**ව්‍යාපෘති අංශය**

රේගු බැඳුම්කර ගුදම්වල වත්මන් තත්ත්වය (2014)

| | | පොදු බැඳුම්කර | පෞද්ගලික බැඳුම්කර | නිෂ්පාදන බැඳුම්කර | සීනි බැඳුම්කර | UPB බැඳුම්කර |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| i | වසර ආරම්භයේදී බැඳුම්කර සංඛ්‍යාව | 6 | 49 | 6 | 4 | 8 |
| ii | වසර තුළදී නව අනුමැති සංඛ්‍යාව | | 2 | | | |
| iii | අවලංගු කිරීම් සංඛ්‍යාව | | - | | 1 | |
| iv | වසර අවසානයේදී බැඳුම්කර සංඛ්‍යාව | 6 | 51 | 6 | 3 | 8 |

| | | සේවා බැඳුම්කර | සැපයුම් බැඳුම්කර | තීරු බදු රහිත සාප්පු | බදු පාර්ශ්ව ගොනු කිරීම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| i | වසර ආරම්භයේදී බැඳුම්කර සංඛ්‍යාව | 12 | 78 | 54 | 7 | 224 |
| ii | වසර තුළදී නව අනුමැති සංඛ්‍යාව | | | | | 2 |
| iii | අවලංගු කිරීම් සංඛ්‍යාව | | | | | 1 |
| iv | වසර අවසානයේදී බැඳුම්කර සංඛ්‍යාව | 12 | 78 | 54 | 7 | 225 |

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ තීරුබදු රහිත සාප්පුවල වෙළඳාම පිළිබඳ තොරතුරු**

| | **2012** | **2013** | **2014** |
|---|---|---|---|
| සී ට්‍රාන්ස් ඩියුටි ෆ්‍රී ෂොප් (USD) | 1,144,855/- | 1,246,289/- | |
| සිලෝන් පෝර්ට්ස් සර්විසස් ලිමිටඩ්. (USD) | නැත | නැත | නැත |
| STC ජෙනරල් ට්‍රේඩින් කොම්පැණි ලිමිටඩ් . (USD) | 1,161,806/- | 1,588,401/- | 1,643,397 |
| එඩිසන් ඉලෙක්ට්‍රිකල් ඩියුටි ෆ්‍රී | නැත | නැත | නැත |
| Total (USD) | 2,306,661/- | 2,834,690/- | 2,944,738/- |

**TIEP1, TIEP 4 & IBG** වැඩසටහන්වල වර්තමාන තත්ත්වය **(2014)**

1. **මෙහෙයුම්කරුවන්**

| | TIEP 1 | TIEP 4 | IBG |
|---|---|---|---|
| i. වසර ආරම්භයේදී මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව. | 1001 | 517 | 225 |
| ii. වසර තුළදී එක් වූ මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව. | 54 | 17 | 14 |
| iii. වසර අවසානයේදී මෙහෙයුම්කරුවන් සංඛ්‍යාව. | 1055 | 534 | 240 |

අධීක්ෂණ හා ආපසු ගෙවීම් අංශය

**ලබාගත් ආදායම**

| | 2014 |
|---|---|
| | ඇපකර සංඛ්‍යාව |
| පිළිගත් බැංකු ඇපකර | 2187 |
| ඉල්ලා සිටි බැංකු ඇපකර | 2203 |
| පියවන ලද බැංකු ඇපකර | 2137 |
| පිළිගත් පුද්ගල ඇපකර හා ආයතනික ඇපකර | 151 |

**බැඳුම්කර විමර්ෂණ ඒකකය**


**අනාවරණය කරගත් උල්ලංඝණයන් සංඛ්‍යාව, අයකරගත් සංඛ්‍යාව හා අධිකරණයේ පවරන ලද නඩු**

| | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| වසර මුලදී තිබූ නඩු සංඛ්‍යාව | 569 | 574 | 44 |
| වසර තුළදී මුල පුරන ලද නඩු සංඛ්‍යාව | 29 | 59 | - |
| වසර තුළදී අවසන් කරන ලද විමර්ෂණ සංඛ්‍යාව | 7 | 10 | 13 |
| විමර්ෂණ අවසන් නොමැති නඩු සංඛ්‍යාව | 574 | 611 | 31 |
| වසර අවසානයේදී අවසන්වන නොමැති විමර්ෂණ සංඛ්‍යාව | 1 | 4 | - |
| අධිකරණයේ නඩු පවරන ලද සිද්ධි සංඛ්‍යාව (වසර තුළදී) | නැත | නැත | නැත |
| දඩ/ රජසන්තක කිරීම | 14,229,764 | 266,043,829 | 7,367,295 |
| රාජසන්තක කිරීම් වල වටිනාකම | 37,637,847 | - | - |

**තැපැල් තක්සේරු අංශය**

2014 වසරේදී එකතුකරගත් ආදායම

| කොළඹ (රු.) | නුවර (රු.) | ගාල්ල (රු.) | ත්‍රිකුණාමලය (රු.) | යාපනය (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|
| 57,692,903 | 5,207,169 | 2,395,743 | 1,050,174 | 2,851,483 | 69,197,472 |



# භාණ්ඩ පරීක්ෂණ අංශය

## හැඳින්වීම

තාක්ෂණික හා භෞතික තහවුරුව මගින් රේගු ආඥා පනත හා අනෙකුත් අනුෂාංගික අණ පනත් මගින් කර ඇති තහනම් හා සීමා කිරීම් පිළිබඳව කටයුතු කිරීම සහතික කිරීම මෙමගින් සිදු කෙරේ. නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැලසීමද මෙම අංශයේ ප්‍රධාන වගකීමකි.

**ප්‍රධාන කාර්යයන්:**

I. ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ආනයන රේගු ප්‍රකාශන නිරවද්‍යභාවය සඳහා තවදුරටත් පරීක්ෂා කිරීම.

II. වෙනස් පරීක්ෂණ මට්ටම් යටතේ භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා බහාලුම් විවිධ පරීක්ෂණ මධ්‍යස්ථානවලට යොමු කිරීම හා නිදහස් කිරීමේ දී අවදානම් කළමනාකරණය පදනම් කරගත් බහාලුම් තේරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

III. නියමිත ආදායම ලබන බව සහතික කිරීම සඳහා බහාලුම් භෞතිකව පරීක්ෂා කිරීම. සිතාමතාම බහාලුම් ප්‍රකාශන නිසි පරිදි ඉදිරිපත් නොකෙරෙන අවස්ථා හසු කර ගැනීමට හා වැළැක්වීම සඳහා බහාලුම් භෞතිකව පරීක්ෂා කිරීම.

IV. වේගවත් නිශ්කාශන කටයුත් පහසු කරන මෙවලමක් වශයෙන් සඟවා ගෙන එන සහ ප්‍රකාශ නොකළ භාණ්ඩ හසුකර ගැනීම සඳහා එක්ස්රේ ස්කෑන් යන්ත්‍ර භාවිතා කිරීම.


V. අවදානම් සැසඳීමේ පදනම යටතේ තෝරා ගත් ආනයනකරුවන්ට සමූහ පරීක්ෂාව අනුමත කිරීම.


### 2014 ක්‍රියාකාරී සැලසුමේ කාර්යසාධනය සැසඳීම

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| ○ RCT හි බහාලුම් සංචරන අධීක්ෂණ පද්ධතිය ශක්තිමත් කිරීම | ICT, සංවිධාන හා නිවාරණ යන අංශ විසින් අවශ්‍ය යටිතල පහසුකම් සපයා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් සැලසුම ක්‍රියාත්මක නොකරන ලදී. | | |
| ○ පරීක්ෂණ ස්ථානවල "ASYCUDA WORLD" හි 'Exit Note' ක්‍රියාත්මක කිරීම | | | |


කාර්ය සාධනය 2014

| විස්තරය | | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|
| පරීක්ෂණ මධ්‍යස්ථානවලදී ලියාපදිංචි කරන ලද ආනයන රේගු ප්‍රකාශන ( නිවාස වල භාවිතය සඳහා -LCL & FCL ) registered at examination points | | 226,584 | 222,131 | 189,617 | 175,062 | 192559 |
| පරීක්ෂණ මාදිලිය | Amber | 114,257 | 153,647 | 138,360 | 140,624 | 162742 |
| | Detail | 12,834 | 12,791 | 15,036 | 18,748 | 19556 |
| | HRC | 4,416 | 5,956 | 3,329 | 2,257 | 1600 |
| | Red | 9,145 | 1,576 | 1,868 | 6,217 | 1572 |
| | වෙනත් (InFac, TIEP, etc...) | 13,725 | 7,749 | 6,240 | 7,216 | 7378 |
| නිශ්කාෂණයේදී බහලුම් සංඛ්‍යාව ( දේශීය භාවිතය සඳහා) | | 200,314 | 236,103 | 245,714 | 261,165 | 177633 |
| කොළ වැනලය යටතේ නිශ්කාෂණය කරන ලද බහලුම් සංඛ්‍යාව | | | | 24,784 | 29,446 | 13189 |
| ස්කෑන් කරන ලද බහලුම් සංඛ්‍යාව | | 9,758 | 12,627 | 14,238 | 24,985 | 17797 |
| BOI ආයතන සඳහා නිශ්කාෂණ (පිටත කලාප - LCL & FCL) cleared | | 27,968 | 58,362 | 59,010 | 58,065 | 64645* |
| ආනයනය කළ බහලුම් සංඛ්‍යාව (BOI - පිටත කලාප) | | | | 27,446 | 24,765 | 31153 |
| අපනයනය කළ බහලුම් සංඛ්‍යාව (BOI - පිටත කලාප) | | | | 17,316 | 19,260 | 20702 |
| හසුකරගත් සිද්ධි සංඛ්‍යාව | | 325 | 436 | 572 | 222 | 49 |
| අතිරේක රේගු සටහන්කරවලින් අයකරගත් මුදල් (රු. මිලියන) | | 113.0 | 506.3 | 487.0 | 715.6 | 115.15^ |
| අයකරගත් දඩ මුදල් (රු. මිලියන) | | 55.8 | 62.4 | 67.0 | 49.1 | 24.24 |
| රාජසන්තක කළ බඩුවල වටිනාකම (රු. මිලියන) | | 7.8 | 30.5 | 2.1 | 7.2 | 4.21 |






නිෂ්කාශනය කරන ලද ආනයන භාණ්ඩ (ගෘහස්ථ භාවිතය) - 2014
100,000
10,000
1,000
100
10
1
Gray Line I
Gray Line II
HRC
ICD NNR
JCT
BQ
G/Pier
Kochikade
PVQ
ගෘහස්ථ භාවිතය සඳහා ලියාපදිංචි කරනලද රේගු සටහන්කර (CusDec)

බහාලුම් සහ රේගු ප්‍රකාශන සංසන්දනය 2010-2014
300,000
250,000
200,000
150,000
100,000
50,000
0
2010
2011
2012
2013
2014
පරීක්ෂණ ස්ථානයන්හිදී ලියාපදිංචි කළ ආනයන සටහන්කර (CusDec)
නිෂ්කාශනය කරන ලද කන්ටේනර් සංඛ්‍යාව (ගෘහස්ථ භාවිතය)
ස්කෑන් කරනලද කන්ටේනර් සංඛ්‍යාව
ආයෝජන මණ්ඩල ව්‍යාපාර සඳහා වන ආනයන

අය කරගත් ආදායම සංසන්දනය (2010-2014)
1,000.0
100.0
10.0
1.0
2010
2011
2012
2013
2014
රාජ්‍ය සන්තක කළ භාණ්ඩ වටිනාකම (රු.මිලියන)
අතිරේක CusDec මගින් අයකර ගත් මුදල් (රු.මිලියන)
දඩ මුදල් අය කරගැනීම (රු. මිලියන)

# මගී සේවා (කොළඹ) අංශය

**අරමුණ-:**

කොළඹ වරායේ දී හා මගීන් හා කැටුව නොඑන භාණ්ඩ (UPB) ගබඩාවලදී මගීන් හා වෙනත් සම්බන්ධිත ආයතනවල භාණ්ඩ නිෂ්කාශණයේදී විදේශ ගත වූවන් හා මව්බිමට නැවත එන අය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් ඔවුනට කාර්යක්ෂම හා ආචාරශීලි සේවාවක් සැපයීම.

ප්‍රධාන කාර්යයන්

1. රටින් බැහැරව හා රටට පැමිණෙන මගීන් හා භාණ්ඩ නිශ්කාෂණය පහසු කිරීම
2. ආදායම් සුරක්ෂිත කිරීම හා තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ ආනයනය හා අපනයනය වැලැක්වීම
3. සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අපේක්ෂාවන් ආරක්ෂා කිරීම
4. UPB ගබඩා පාලනය හා නියාමනය කිරීම

**2014 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය (රු)**


| | මලු සංඛ්‍යාව | දඩමුදල් | අතිකාල | බදු හා අයබදු | එකතුව |
|---|---|---|---|---|---|
| BO (සමූහ පරීක්ෂණ) | 0 | 0.00 | 0.00 | 3,077,309.00 | 3,077,309.00 |
| BO (කවුන්ටරය) | 0 | 12,165,014.00 | 0.00 | 25,388,899.00 | 37,553,913.00 |
| BO (විකුණුම්) | 0 | 2,842,008.00 | 0.00 | 8,088,600.00 | 10,930,608.00 |
| BO (NNR) | 16,685 | 1,256,520.00 | 0.00 | 29,548,856.00 | 30,805,376.00 |
| ලක්සිරි සේවා | 60,076 | 463,078.00 | 3,866,085.00 | 25,444,072.00 | 29,773,235.00 |
| ට්‍රාන්ස්කෝ | 71,171 | 998,600.00 | 2,588,493.00 | 22,457,618.00 | 26,044,711.00 |
| මිඩ්කෝ | 49,289 | 945,013.00 | 2,701,784.00 | 14,914,833.00 | 18,561,630.00 |
| ට්‍රයිකෝ(කොළඹ) | 85,119 | 883,771.00 | 3,318,279.00 | 32,107,656.00 | 36,309,706.00 |
| CSL (කොළඹ) | 83,776 | 1,703,337.00 | 2,887,314.50 | 47,186,782.00 | 51,777,433.50 |
| **එකතුව** | **366,116** | **21,257,341.00** | **15,361,955.50** | **208,214,625.00** | **244,833,921.50** |

## 2013/ 2014 වර්ෂවල මුල්‍ය කාර්ය සාධන සසඳා බැලීම (රු)

| | මගී සංඛ්‍යාව 2013 | මගී සංඛ්‍යාව 2014 | දඩමුදල් 2013 | දඩමුදල් 2014 | අතිකාල 2013 | අතිකාල 2014 | බදු 2013 | බදු 2014 |
|---|---|---|---|---|---|---|---|---|
| BO (සමූහ පරීක්ෂණ) | 0 | 0 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 3,077,309.00 |
| BO (කවුන්ටරය) | 0 | 0 | 11,065,325.00 | 12,165,014.00 | 0.00 | 0.00 | 42,573,011.00 | 25,388,899.00 |
| BO (විකුණුම්) | 0 | 0 | 19,250.00 | 2,842,008.00 | 0.00 | 0.00 | 665,136,372.00 | 8,088,600.00 |
| BO (NNR) | 17,025 | 16,685 | 2,282,203.00 | 1,256,520.00 | 0.00 | 0.00 | 36,470,100.00 | 29,548,856.00 |
| ලක්සිරි සේවා | 63,469 | 60,076 | 465,799.00 | 463,078.00 | 2,650,231.00 | 3,866,085.00 | 21,734,979.00 | 25,444,072.00 |
| ට්‍රාන්ස්කෝ | 61,038 | 71,171 | 578,665.00 | 998,600.00 | 2,278,260.00 | 2,588,493.00 | 25,117,111.00 | 22,457,618.00 |
| මීඩිකෝ | 58,297 | 49,289 | 816,212.00 | 945,013.00 | 2,713,097.00 | 2,701,784.00 | 15,135,441.00 | 14,914,833.00 |
| ට්‍රයිකෝ (කොළඹ) | 87,037 | 85,119 | 1,330,202.00 | 883,771.00 | 3,275,349.00 | 3,318,279.00 | 61,641,685.00 | 32,107,656.00 |
| CSL (කොළඹ) | 81,296 | 83,776 | 1,100,663.00 | 1,703,337.00 | 2,951,439.00 | 2,887,314.50 | 39,802,554.00 | 47,186,782.00 |
| | **368,162** | **366,116** | **17,658,319.00** | **21,257,341.00** | **13,868,376.00** | **15,361,955.50** | **907,611,253.00** | **208,214,625.00** |


**2013/2014 වර්ෂවල ගමන් බඩු මෙහෙයුම් සසදා බැලීම**

| | මලු සංඛ්‍යාව 2013 | මලු සංඛ්‍යාව 2014 |
|---|---|---|
| BO (සමූහ පරීක්ෂණ) | 0 | 0 |
| BO (කවුන්ටරය) | 0 | 0 |
| BO (විකුණුම්) | 0 | 0 |
| BO (NNR) | 17,025 | 16,685 |
| ලක්සිරි සේවා | 63,469 | 60,076 |
| ට්‍රාන්ස්කෝ | 61,038 | 71,171 |
| මිඩ්කෝ | 58,297 | 49,289 |
| ට්‍රයිකෝ(කොළඹ) | 87,037 | 85,119 |
| CSL (කොළඹ) | 81,296 | 83,776 |
| **එකතුව** | **368,162** | **366,116** |




**2013/2014 වර්ෂවල දඩ මුදල් අයකර ගැනීම සසඳා බැලීම**

| | 2013 | 2014 |
|---|---:|---:|
| BO (සභාව) | 0.00 | 0.00 |
| BO (කවුන්ටරය) | 11,065,325.00 | 12,165,014.00 |
| BO (විකුණුම්) | 19,250.00 | 2,842,008.00 |
| BO (NNR) | 2,282,203.00 | 1,256,520.00 |
| ලක්සිරි සේවා | 465,799.00 | 463,078.00 |
| ට්‍රාන්ස්කෝ | 578,665.00 | 998,600.00 |
| මිඩ්කෝ | 816,212.00 | 945,013.00 |
| ට්‍රයිකෝ(කොළඹ) | 1,330,202.00 | 883,771.00 |
| CSL (කොළඹ) | 1,100,663.00 | 1,703,337.00 |
| **එකතුව** | 17,658,319.00 | 21,257,341.00 |



**2013/2014 වර්ෂවල අතිකාල අයකර ගැනීම සසඳා බැලීම**

| | 2013 | 2014 |
|---|---|---|
| BO (සභාව) | 0.00 | 0.00 |
| BO (කවුන්ටරය) | 0.00 | 0.00 |
| BO (විකුණුම්) | 0.00 | 0.00 |
| BO (NNR) | 0.00 | 0.00 |
| ලක්සිරි සේවා | 2,650,231.00 | 3,866,085.00 |
| ට්‍රාන්ස්කෝ | 2,278,260.00 | 2,588,493.00 |
| මිඩ්කෝ | 2,713,097.00 | 2,701,784.00 |
| ට්‍රයිකෝ(කොළඹ) | 3,275,349.00 | 3,318,279.00 |
| CSL (කොළඹ) | 2,951,439.00 | 2,887,314.50 |
| **එකතුව** | **13,868,376.00** | **15,361,955.50** |



2013/2014 වර්ෂවල බදු අයකර ගැනීම සසදා බැලීම

| | බදු 2013 | බදු 2014 |
|---|---|---|
| BO (සභාව) | 0.00 | 3,077,309.00 |
| BO (කවුන්ටරය) | 42,573,011.00 | 25,388,899.00 |
| BO (විකුණුම්) | 665,136,372.00 | 8,088,600.00 |
| BO (NNR) | 36,470,100.00 | 29,548,856.00 |
| ලක්සිරි සේවා | 21,734,979.00 | 25,444,072.00 |
| ට්‍රාන්ස්කෝ | 25,117,111.00 | 22,457,618.00 |
| මිඩ්කෝ | 15,135,441.00 | 14,914,833.00 |
| ට්‍රයිකෝ(කොළඹ) | 61,641,685.00 | 32,107,656.00 |
| CSL (කොළඹ) | 39,802,554.00 | 47,186,782.00 |
| **එකතුව** | **907,611,253.00** | **208,214,625.00** |

# අපනයන කාර්යාංශය

## හැඳින්වීම

අපනයන අංශය ක්‍රියාපටිපාටි සරල කිරීම තුලින් හා ඍජු ගණුදෙනුකාර දායකත්වය (DTI), ක්‍රමය හඳුන්වාදීම මගින් නිත්‍යානුකූල අන්තර්ජාතික භාණ්ඩ සංචලනය ධෛර්යමත් කරන අතර ඍජු අපනයන හා ප්‍රති අපනයන කටයුතු වර්ධනය කරවයි. එමෙන්ම මෙම අංශය රටේ සංස්කෘතික, පාරිසරික හා සමාජ අභිලාෂයන් ආරක්ෂා කිරීම පිළිබඳ වගකීමද දරනු ලබයි.

### ප්‍රධාන කාර්යයන්

1. ජාතික ආදායම සහ ආරක්ෂක අවශ්‍යතා සඳහා අපනයන භාණ්ඩ පරීක්ෂා කිරීම අපනයන බදු, සෙස් බදු, රාජ්‍ය භාග අය කිරීම .
2. තොරතුරු තාක්ෂණය උපරිම ආකාරයට භාවිතා කිරීම තුලින් අපනයන වෙළදාම පහසුකිරීම සඳහා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම.
3. ජාතික වෙළඳ සංඛ්‍යාති සැපයීම
4. ජාතියේ සමාජ ආර්ථික, සංස්කෘතික හා පාරිසරික අවශ්‍යතා ආරක්ෂා කිරීම

### 2014 ක්‍රියාකාරී සැලසුමේ කාර්යසාධනය සැසඳීම

**(ආනයන භාණ්ඩ පරීක්ෂා කිරීමේ මධ්‍යගතස්ථානයක් ස්ථාපිත කිරීම)**

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| ICT අංශය හා මෙහෙයුම්කරුවන් සමග රැස්වීම් පැවැත්වීම | 1 වන කාර්තුව<br>2 වන කාර්තුව | 1 වන කාර්තුව | |
| මෙහෙයුම්කරුවන් සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම | 2 වන කාර්තුව | 2 වන කාර්තුව | |
| ICT හි සහාය මත අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 2, 3 හා 4 වන කාර්තු | 2 වන කාර්තුව | |

"නැව් ගත කිරීම සඳහා අවසර 'දීම' සහ අපනයන මුදාහැරීමේදී" බලපාන ස්වයංක්‍රීය දත්ත හුවමාරු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය ,SAGT හා CICT සමඟ සම්බන්ධ කිරීම .

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| ICT අවශ්‍ය හා පර්යන්ත මෙහෙයුම්කරුවන් සමග රැස්වීම් පැවැත්වීම | 1 වන කාර්තුව | 1 වන කාර්තුව | |
| පර්යන්ත මෙහෙයුම්කරුවන් සමග අවබෝධතා ගිවිසුමකට එළඹීම | 2 වන කාර්තුව | 2 වන කාර්තුව | |
| සම්බන්ධතාවය ක්‍රියාත්මක කිරීම | 3 වන සහ 4 වන කාර්තු | 3 වන කාර්තුව | |

**භාණ්ඩ අඩංගු බහාලුම් මෙහෙයුම් (CFS) ස්ථාන පද්ධතියට සම්බන්ධ කිරීම**

| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| CusDec දර්ශනය කිරීම සඳහා සම්බන්ධතාවයක් ඇති කිරීමට ACE/DHL (CFS) ආයතන සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය සමග සාකච්ඡා පැවැත්වීම | 1 වන කාර්තුව | 1 වන කාර්තුව | |
| බහාලුම් වල ඇති භාණ්ඩ ගොඩබෑමේ ස්ථාන සමග සම්බන්ධතාවය | 3 වන සහ 4 වන කාර්තු | 3 වන කාර්තුව | |
| | | | |

**අවසර ලබා දීම පහසු කිරීම සඳහා සාමාන්‍ය බලපත්‍ර ක්‍රමය වෙනුවට ඉ-බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීම**

| ප්‍රධාන පියවරයන් | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| බලපත්‍ර ලබාදීමේ ආයතන තොරතුරු හා සන්නිවේදන අංශය සමග සාකච්ඡා පැවැත්වීම | 1, 2 හා 3 වන කාර්තු | 3 හා 4 වන කාර්තු | |
| තෝරාගත් බලපත්‍ර ලබාදීමේ ආයතන සමග ඉලෙක්ට්‍රොනික් සම්බන්ධතාවය සක්‍රිය කිරීම | 2 හා 4 වන කාර්තු | 2, 3 හා 4 වන කාර්තු | සාකච්ඡා අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ක්‍රියාත්මක කළ නොහැකි විය. |

# සහාය සේවා පරිෂදය

# ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය

## හැඳින්වීම:

ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශය ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්තිමය ගැටළු, තීරුබදු ගැටළු හා අන්තර් ජාතික කටයුතු පිළිබඳ වගකීම දරයි. එම අංශයේ පුළුල් අරමුණු පහත දැක්වෙන පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.:

1. දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය කරුණු වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම හා එම ප්‍රතිපත්ති අදාළ අංශයන් මගින් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියා පටිපාටි බවට පත් කිරීම, එකී තීරණ නිලධාරීන්ගේ දැන ගැනීමට හා අනුගත වීඹ සඳහා දැනුම් දීම.
2. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ඉල්ලා සිටි විට
   (i) ආර්ථික/වෙළඳ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම සහ
   (ii) එම ප්‍රතිපත්ති තීරුබදු උපාය මාර්ග බවට පත් කිරීම යන කටයුතුවලට සහාය වීම;
3. තීරුබදු උපාය මාර්ග මහජනතාවට හා නිලධාරීන්ට අවශ්‍ය පරිදි දැන ගැනීමට හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබාදීම.
4. ජාතික රේගු තීරුබදු නිරතුරුවම යාවත්කාලීන ලෙස පවත්වාගෙන යාම සහතික වීම, සියලුම තීරුබදු සම්බන්ධ විමසුම් වලට අවශ්‍ය කටයුතු කිරීම.
5. රේගු තොරතුරු මධ්‍යස්ථානය මගින් මහජනතාව වෙත ස්වයං අනුගතවීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.
6. ලෝක රේගු සංවිධානයේදී එහි ප්‍රාදේශීය සංවිධානවලදී හා අනෙකුත් අන්තර් ජාතික සංවිධාන (ලෝක වෙළඳ සංවිධානය හා බහුවිධ පාරිසරික ගිවිසුම්) හා ද්විපාර්ශවික හා බහු පාර්ශවික වෙළඳ සංවිධාන වලදී ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම.
   දෙපාර්තමේන්තුවේ දැක්ම ළඟා කරගනු පිණිස ලෝක රේගු සංවිධානයේ නිර්දේශ හා හොඳම ක්‍රමවේද, ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි බවට පත් කිරීම.

## ප්‍රධාන කාර්යයන්:

1. රේගු සම්බන්ධ තොරතුරු වහාම හා නිවැරදිව ඉදිරිපත්කිරීම.
2. දේශ සීමා නියෝජිතයන් සමග අඛණ්ඩ සම්බන්ධතා පැවැත්වීම.
3. ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිසංවිධානය.
4. උපාය මාර්ග සැලැස්ම සකස් කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් /අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ආයතන) සහයෝගය ලබාදීම.
5. වාර්ෂික කාර්ය සැලැස්ම සකස් කිරීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල් /අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ආයතන) සහයෝගය ලබාදීම.
6. රේගු ප්‍රතිපත්ති හා පටිපාටිය , බදු හා වෙළඳ පහසුකම් සම්බන්ධ අවස්ථාවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල් /අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට සහභාගීවීම.
7. ජාත්‍යන්තර රේගු දිනය සංවිධානය කිරීම හා සැමරීම.
8. දෙපාර්තමේන්තු නියෝග (DOPLs) නිසි පරිදි බෙදා හැරීමට කටයුතු කරන බවට සහතික කිරීම.
9. ජාතික රේගු නාමාවලිය බෙදා හැරීමට කටයුතු කරන බවට සහතික කිරීම.
10. රේගු තොරතුරු සම්බන්ධ පර්යේෂණයන් සිදු කිරීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| 2014 වසර සඳහා ජාතික තීරු බදු නාමාවලිය ප්‍රකාශනය | වසරේ 1 වන කාර්තුවේදි ප්‍රකාශනය කිරීම | 1 වන කාර්තුවේදී ප්‍රකාශනය කරන ලදී | - |
| ජාත්‍යන්තර රේගු දිනය සැමරුම සංවිධානය කිරිම | වසරේ 1 වන කාර්තුවේදී සංවිධානය කිරිම | 1 වන කාර්තුවේදී සංවිධානය කරන ලදී | - |
| කාල විරාම ගණන අධ්‍යයන | වසරේ 1 වන කාර්තුවේදී ක්‍රියාකාරී කණ්ඩායම ස්ථාපිත කිරීම | 1 වන කාර්තුවේදී ක්‍රියාකාරී කණ්ඩායම ස්ථාපිත කරන ලදී | - |
| | වසරේ 1 වන කාර්තුවේදී අධ්‍යයනයේ විෂයපථය හා නිර්මාණය තීරණය කිරීම | 1 වන කාර්තුවේදී විෂයපථය හා නිර්මාණය තීරණය කරන ලදි. | - |
| | වසරේ 2 වන කාර්තුවේදී ක්‍රමවේදය සැලසුම් කිරීම | 2 වන කාර්තුවේදි ක්‍රමවේදය සැලසුම් කරන ලදී | - |
| | වසරේ 2 වන කාර්තුවේදී සවිස්තරාත්මක සැලසුම සකස් කිරීම | 2 වන කාර්තුවේදී සවිස්තරාත්මක සැලසුම සකස් කරන ලදී | - |
| | වසරේ 3 වන කාර්තුවේදි නියැදි සකස් කිරීම | 3 වන කාර්තුවේදී නියැදි සකස් කරන ලදී | - |
| | වසරේ 3 වන කාර්තුවේදී සමීක්ෂණ ප්‍රශ්න සකස් කිරිම | 3 වන කාර්තුවේදී සමීක්ෂණ ප්‍රශ්න සකස් කරන ලදී | - |
| | වසරේ 3 වන කාර්තුවේදී පෙරහුරු අභ්‍යාසයක් පැවැත්වීම | 4 වන කාර්තුවේදී පෙරහුරු අභ්‍යාසයක් පවත්වන ලදී | - |

## රේගු තීරුබදු නාමාවලිය

ශ්‍රී ලංකා රේගුවට අන්තර්ජාතික වෙළඳාමේදී පනවා ඇති සියලු බදු රැස් කිරීම පිළිබඳ වගකීම පැවරී ඇත. 2014 වර්ෂය තුළ ආනයන භාණ්ඩ සම්බන්ධයෙන් රේගුව විසින් ආනයන බද්ද, නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද, ආනයන සෙස් බදු, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු, එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද යන බදු මගින් ආදායම් රැස්කර ඇත. සමහර අපනයන භාණ්ඩ සම්බනධයෙන් අපනයන බදු හා අපනයන සෙස් බදු ගෙවිය යුතුවේ. ඊට අමතරව සමහර අත්‍යවශ්‍ය පරිභෝජන භාණ්ඩ සම්බන්ධව විශේෂ භාණ්ඩ බද්ද කාලානුරූපව පනවන ආකාරයට ගෙවිය යුතුය. මෙම විවිධ බදු නිසා රේගු තීරු බදුවල දැක්වෙන එක් එක් භාණ්ඩය සඳහා විවිධ බදු පැනවෙන අතර එය සංකීර්ණ ලේඛණයක් බවට පත්ව ඇත. මීට අමතරව ශ්‍රී ලංකාව හා ද්විපාර්ශ්වික හා බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම් ඇති කරගත් රටවල නිෂ්පාදන භාණ්ඩ සඳහා වරණීය තීරුබදු අයකරනු ලබයි. තවද එම බදු වටිනාකම මත හා ඒකක මත අයකරන බදු අනුපාත වශයෙන්ද ගනු ලබයි. මෙලෙස සංකීර්ණත්වයට පත්වන තීරුබදු සාමාන්‍ය ජනතාවට මෙන්ම රේගු නිලධාරීන්ටද මතක තබා ගැනීමට අපහසු වී ඇත. එම නිසා රේගු දෙපාර්තමේන්තුව පසුගිය දශකයේ සිට අයවැය අවසානයේ වාර්ෂික තීරුබදු නාමාවලියක් තනි පොතක් ලෙස එළිදැක්වීමට කටයුතු යොදා ඇත. එහි එක් එක් භාණ්ඩ සඳහා අයවිය යුතු රේගු බදු හා බදු අනුපාත වෙන වෙනම දක්වා ඇත.

## හුවමාරු අනුපාත චක්‍රලේඛ

බැංකු සහ මුදල් හුවමාරු කරන ආයතන භාවිතා කරන්නා වූ නිරන්තරයෙන්ම විචලනය වන (පාවෙන) විනිමය අනුපාතික වෙනුවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති පරිදි ශ්‍රී ලංකා රේගුව භාවිතා කරන්නේ එක් වැඩ කරන සතියක කාලයක් සඳහා අදාළ කරගත හැකි සාමාන්‍ය විනිමය අනුපාතකයකි. සියළුම රේගු බදු මෙන්ම රේගු ආඥා පනත (235 පරි) යටතේ ගෙවිය යුතු අනෙකුත් සියළුම ගාස්තු දඩ සහ අභිමි කිරීම් ගෙවීම සඳහා අදාළ වන මෙම " හුවමාරු අනුපාතය " තීරණය කරනු ලබන්නේ රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වන අතර, එය සෑම සිකුරාදාවකම ප්‍රකාශයට පත් කර, ප්‍රතිපත්ති සැළසුම්කරන සහ පර්යේෂණ අංශය විසින් රේගු ප්‍රකාශන (CusDec) සම්බන්ධයෙන් කටයුතු කරන සියළුම ඒකකවලට සහ රේගු වෙබ් අඩවියේ පළ කිරීමසඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය වෙත බෙදා හරිනු ලැබේ. මෙම චක්‍රලේඛය සියළුම නිලධාරීන්ට මෙන්ම වෙළඳුන්ටද අත්‍යාවශ්‍ය මාර්ගෝපදේශයකි.

## ජාත්‍යන්තර මට්ටමේ කටයුතු

රේගුව සම්බන්ධ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ වගකීමද දරනු ලබන්නේ ප්‍රතිපත්ති සැළසුම්කරණ හා පර්යේෂණ අංශය විසිනි. රේගුවේ ජාත්‍යන්තර මට්ටමේ කටයුතු වර්ධනය හා වඩාත් හොඳින් කළමනාකරණ කර ගැනීමේ අදහස ඇතිව රේගු ජාත්‍යන්තර කටයුතු අංශය ඇති කර තිබේ. ලෝක රේගු සංවිධානය හා එහි ආසියා පැසිෆික් කලාප කාර්යාලය විදෙස් රටවල රේගු පරිපාලන ආයතන සහ අදාළ වන අනෙක්තු ජාත්‍යන්තර ආයතන සමඟින් රේගුව සම්බන්ධ ජාත්‍යන්තර කටයුතු පිළිබඳව සම්බන්ධීකරණය සහ සන්නිවේදනය කරමින් ඔවුන්ට රේගුව සමඟින් සම්බන්ධ විය හැකි කේන්ද්‍රයක් ලෙස කටයුතු කිරීම එහි කාර්ය භාරයට ඇතුළත් වේ. ලෝක රේගු සංවිධානයෙන් නිරන්තරයෙන්ම විවිධ කරුණු පිළිබඳ සන්නිවේදනය කරන අතර, මෙම අංශය මගින් ඊට නිසි ප්‍රතිචාර දක්වනු ලැබේ. වර්ගීකරණය පිළිබඳව වන ආරවුලක් ශ්‍රී ලංකා රේගුවට නිරාකරණය කර ගැනීමට නොහැකි වුවහොත් එමගින් එය ලෝක රේගු සංවිධානයට යොමු කරනු ලැබේ. සම්බන්ධීකරණය කරන ලද සංයෝජන නාමකරණ ක්‍රමවේදයෙහි (Harmonized System Nomenclature) සිදුකර ඇති වෙනස්කම් පිළිබඳව ලෝක රේගු සංවිධානයෙන් දැනුම් දෙන අතර, ඒවා මෙම අංශය මගින් පිළිගනු ලැබේ. ඊට අමතරව ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් සඳහා රේගු සහයෝගිතා ගිවිසුම් සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුම් හා සම්බන්ධ කටයුතු සිදු කරන්නේද ප්‍රතිපත්ති සැළසුම්කරණ හා පර්යේෂණ අංශය විසින් වේ. ශ්‍රී ලංකාව, ඉන්දියාව සහ පකිස්ථානය සමඟින් ද්විපාර්ශ්වික ගිවිසුම් දෙකක් අත්සන් තබා ඇත. ඊට අමතරව කටාර් රාජ්‍යය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ චීනය සමඟින්ද අන්‍යොන්‍ය පරිපාලන සහාය සඳහා වන ගිවිසුම් අත්සන් කිරීමට නියමිතය.

## දෙපාර්තමේන්තු නියෝග

නව ක්‍රියාවලි හඳුන්වාදීමේදී, ක්‍රියාවලි සංග්‍රහයන්හි හා පවත්නා ක්‍රියාවලි වෙනස් කළයුතු අවස්ථාවලදීද, ප්‍රතිපත්තිමය තීරණ දැනුම් දීමේ අවශ්‍යතාවලදීද, දෙපාර්තමේන්තු නියෝග නිකුත් කරනුලැබේ. මේ අනුව දෙපාර්තමේන්තු නියෝග වැදගත් රාජකාරී සන්නිවේදන ක්‍රමවේදයන් බවට පත්වී තිබේ. විවිධ අංශයන්හිදි පැන නගින ප්‍රතිපත්තිමය සංකල්ප වැදගත් ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශයට සන්නිවේදනය කරන අතර මෙහිදි එම සංකල්ප පවත්නා නියෝග හා ක්‍රියාවලි සමඟ ප්‍රති විරෝධීතාවන් පිළිබඳ විමසා බලා රාජකාරීමය ස්වභාවයෙන් හා මාදිලියෙන් යුක්ත වන ලෙස අවසාන කෙටුම්පත් සකස් කරනු ලැබේ. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලැබීමෙන් පසු, එය මුද්‍රණය කර නිලධාරීන් අතර බෙදා හරිනු ලැබේ. ආදායම් සංරක්ෂණ ආඥා පනතේ (RPO) වෙනස් තීරු ගාස්තු හා වෙනත් බදු නියමිත දින හා වෙලාවට රැස් කිරීම පිණිස නිලධාරීන් වෙත දැනුම් දීම පිණිස පලකරනු ලබන දෙපාර්තමේන්තු නියෝග වේ. (මෙම වෙනස්කම් මහා භාණ්ඩාගාරයෙන් සිදුකරන අතර, දෙපාර්තමේන්තු නියෝග බදු කරණයේදී වැදගත් කාර්යයක් සිදු කරයි)

## අන්තර්ජාතික කටයුතු

මෙම අංශයේ නමෙහි අන්තර්ගත නොවූවද ප්‍රතිපත්ති, සැලසුම් හා පර්යේෂණ අංශයට රේගු කටයුතු සම්බන්ධ අන්තර් ජාතික කටයුතු පිළිබඳ වගකීම ද පැවරී ඇත. මේ යටතට වැටෙන ප්‍රධාන කර්තව්‍යයක් වන්නේ ලෝක රේගු සංවිධාන හා එහි ආසියා පැසිපික් කලාපීය කාර්යාලය සමඟ අදහස් හුවමාරු කර ගැනීමට කටයුතු කිරීමයි. ලෝක රේගු සංවිධානය නිරන්තරයෙන් නිවේදන නිකුත් කරන අතර ඒවාට සුදුසු ලෙස ප්‍රතිචාර දැක්විය යුතුවේ. ශ්‍රී ලංකා රේගුවට වර්ගීකරණ ගැටළු විසඳ ගැනීමට අපහසු වූ කල්හි එවන් ආරවුල් සහගත තත්ත්වයන් ලෝක රේගු සංවිධානය වෙත යොමු කරනු ලැබේ. **HS** නාමකරණයට අදාළ වෙනස්කම් ලෝක රේගු සංවිධානය විසින් දැනුම් දෙන අතර මෙම අංශය ඒවාට අනුගත වීමට කටයුතු කරනු ලබයි. ඊට අමතරව, ප්‍රතිපත්ති සැලසුම් හා පර්යේෂණ අංශය, කලාපීය ද්විපාර්ශ්වික හා බහු පාර්ශවික වෙළඳ ගිවිසුම් වලට සම්බන්ධ අන්‍යොන්‍ය රේගු සහයෝගිතාවට අදාළ වගන්ති පිළිබඳ කටයුතු කිරීමේ වගකීම දරයි. දැනට ඉන්දියාව ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ හවුල්කරු වන අතර පාකිස්ථානය දෙවන විශාලතම හවුල්කරු වේ. ඉන්දු ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රේගු අන්‍යොන්‍ය සහයෝගිතා ක්‍රියාකාරකම් හොඳින් ස්ථාපිත වූ යෝජනා ක්‍රමයක් බවට පත්ව ඇත. පාකිස්ථාන රේගුව සමඟ අන්‍යොන්‍ය සහයෝගිතාව වර්දනය කිරීම සඳහා වන එකී යන්ත්‍රනය මේ වන විට නිසි ආකාරයට වර්ධනය වීමට පටන් ගත්තා පමණි. පිළිවෙලින් ඉන්දියාව හා පාකිස්ථානය සමඟ වන ද්විපාර්ශ්වික ගිවිසුම්වලට අමතරව ශ්‍රී ලංකාව, ඉරානය, ඉරාකය, පකිස්ථානය හා මෙක්සිකෝව ආදී රටවල් සමඟ රේගු සහයෝගිතාවන් ගොඩ නඟා ගැනීමට ඇති හැකියාවන් සම්බන්ධව ක්‍රියකාරී ලෙස සොයා බලමින් සිටී.

## ජාත්‍යන්තර ගිවිසුම

ශ්‍රී ලංකා රේගුව පහත සඳහන් ජාත්‍යන්තර ගිවිසුම් වලට එළඹීමට කටයුතු කරමින් සිටි.

1. ශ්‍රී ලංකාව සහ කටාර් රාජ්‍යය අතර, රේගු නීති නිසියාකාරව ක්‍රියා කිරීම රේගු වැරදි පිළිබඳ බලාත්මක කිරීම් සම්බන්ධව හා අන්‍යොන්‍ය පරිපාලන සහය සම්බන්ධ ගිවිසුම.
2. ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි රාජ්‍යය අතර රේගු කටයුතු සම්බන්ධව සහයෝගය සහ අන්‍යොන්‍ය සහාය සම්බන්ධ ගිවිසුම.

## අවබෝධතා ගිවිසුම

ශ්‍රී ලංකා රේගුව පහත සඳහන් අවබෝධතා ගිවිසුම් ගත වීමේ ක්‍රියාවලින් සිදු කරමින් සිටි.

1. ශ්‍රී ලංකාව සහ කොරියාව අතර රේගු සහයෝගිතාවය සම්බන්ධව අවබෝධතා ගිවිසුම.
2. ශ්‍රී ලංකාව හා චීන රේගුව අතර උපාය මාර්ගික සහයෝගිතාව සම්බන්ධ අවබෝධතා ගිවිසුම.
3. ශ්‍රී ලංකාව හා චීනය අතර කාර්මික භාණ්ඩ ආනයන හා අපනයන සුපරීක්ෂණය සම්බන්ධ අවබෝධතා ගිවිසුම.

## සැළසුම් කටයුතු

2013 වසරේ ශ්‍රී ලංකා රේගුවේ සියළු අංශ ප්‍රධාන කාර්ය සාධන අවසන් වූ අතර, එම වසරේ කාර්යසාධන වාර්තාව ප්‍රකාශයට පත් කර ඇත. 2014 වසරේ සියළු අංශ අඩංගු වාර්ෂික කාර්ය සැලැස්ම සකස් කර ඇති අතර, ඔවුන් වෙත දැනුම් දී ඇත.

**පර්යේෂණ කටයුතු**

ආදායම් කාර්ය සාධනය තුළ සැලකිය යුතු කරුණක් වන ආදායම් විශ්ලේෂණය මෙම අංශය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කටයුත්තක් වේ. ආයතනය මගින් එකතු කරන ලද ආදායම් විශ්ලේෂණය සෑම සති 2කට වරක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරනු ලැබේ.

රේගු ක්‍රියාවන්ට ගතහැකි කාලය මැන ගැනීම සඳහා කාල පරාගගණනය අධ්‍යනය (TRS) මගින් ලෝක රේගු සංවිධානයේ (TRS) මාර්ගෝපදේශයේ අංක 2 වගන්තිය යටතේ ප්‍රතිපත්ති සැළසුම් හා පර්යේෂණ අංශය ක්‍රියාත්ම කර ඇත. මෙහි අරමුණ නම් භාණ්ඩ ළඟාවූ කාලයේ සිට ඒවා භාර දීම දක්වා වූ මධ්‍යන කාලය මැන ගැනීම වේ. ආරම්භයක් ලෙස මේ සම්බන්ධ පර්යේෂණ රේගු බල සීමාවතුළ සීමා කළ අතර, රේගු ප්‍රකාශන ක්‍රියාකාරකම්, පරීක්ෂණ මධ්‍යස්ථාන සහ වටිනාකම් තක්සේරු මධ්‍යස්ථාන යනාදි ආයතනවල මෙම පර්යේෂණ පවත්වනු ලබයි. ඉදිරියේදී සියළු දේශ සීමා නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පරිපූර්ණ වූ අධ්‍යයනයක් පැවැත්වීමට තීරණය කරනලදි.

## 2014 කාර්ය සාධනය

2014 වර්ෂය තුළ මෙම අංශය විනිමය අනුපාත වලට අදාළ චක්‍රලේඛ 52 ක් හා දෙපාර්තමේන්තු නියෝග 86 ක් නිකුත් කර ඇත. බදු සංශෝධන පිළිබඳ 2014 වර්ෂය තුළදී නිකුත් කළ දෙපාර්තමේන්තු නියෝග පහත පරිදි වේ.

- වැට් සංශෝධන 02
- නිෂ්පාදන බදු සංශෝධන 07
- වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සංශෝධන 01
- විශේෂ භාණ්ඩ බදු සංශෝධන 24
- සෙස් බදු සංශෝධන 05
- ආදායම් සංරක්ෂණ නියෝග 02
- ජාතිය ගොඩනැගීමේ බදු සංශෝධන 01

## 2014 වර්ෂයේ නිකුත් කළ දෙපාර්තමේන්තු චක්‍රලේඛ

| දෙපා. නියෝග අංකය | දිනය | සම්බන්ධ වූ | විස්තරය |
|---|---|---|---|
| 906 | 09.01.2014 | රේගු ආනයන බදු | රේගුවේ බදු ගෙවීමට එරෙහිව වැට් ආයෝජන බදු ඉදිරියට ගෙනඒම සමනයට පත් කිරීම. |
| 886A | 09.01.2014 | ආනයන | M/S රණතුංග මෝටර්ස්වලට රේගු පහසුකම් නැවත ලබාදීම. |
| 907 | 16.01.2014 | ආනයන | රේගු ප්‍රසංසා ප්‍රතිපත්තිය. |
| 908 | 20.01.2014 | ආනයන | ආදායම් සංරක්ෂණ නියෝග 2014/01 |
| 908A | 24.01.2014 | ආනයන | දෙපාර්තමේන්තු නියෝග .අදාළව නිවැරදි කිරිම 908 |
| 909 | 24.01.2014 | නිෂ්පාදන බදු | එතනෝල් සඳහා නිෂ්පාදන බදු පැනවීම. |

| | | | |
|---|---|---|---|
| 908B | 28.01.2014 | ආනයන | දෙපාර්තමේන්තු නියෝග .අදාළව නිවැරදි කිරිම 908 |
| 910 | 31.01.2014 | නැව් ගාස්තු | නැව් නියෝජිත වරායට භාණ්ඩ සැපයීම්කරුවන් සහ කන්ටේනර් ක්‍රියාකරු සඳහා රීති |
| 910A | 31.01.2014 | නැව් ගාස්තු | දෙපාර්තමේන්තු නියෝග .අදාළව නිවැරදි කිරිම 910 |
| 911 | 03.02.2014 | බදු සහන | කිරිපිට සඳහා බදු සහන. |
| 912 | 06.02.2014 | විශේෂ භාණ්ඩ බදු | පරිප්පු සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 913 | 07.02.2014 | විශේෂ භාණ්ඩ බදු | අර්තාපල් සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 914 | 07.02.2014 | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය රෙගුලාසි. |
| 915 | 13.02.2014 | ආනයන පාලන බලපත්‍ර | ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයන්. |
| 916 | 10.03.2014 | විශේෂ භාණ්ඩ බදු | පරිප්පු සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 118-O | 27.03.2014 | ත්‍යාග | සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ සංචිතය. |
| 917 | 14.03.2014 | විශේෂ භාණ්ඩ බදු | බී ළූණු සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 918 | 19.03.2014 | ආනයන | ඉක්මන් මාර්ග ලිපිලේඛන ඉදිරිපත් කිරිම. |
| 919 | 21.03.2014 | අපනයන | වෙනස් නොකරන සහතිකය (Non manipulation certification). |
| 920 | 26.03.2014 | ආනයන | රේගු පහසුකම් නතර කිරිම. |
| 921 | 26.03.2014 | පාලන | BCNH සම්බන්ධ නීති රේගු සොයා ගැනීම් සමඟ සම්බන්ධතා පැවැත්වීම. |
| 922 | 10.04.2014 | විශේෂ භාණ්ඩ බදු | සහල් සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 923 | 17.04.2014 | විශේෂ භාණ්ඩ බදු | බඩ ඉරිඟු සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 924 | 22.04.2014 | තක්සේරු | මෝටර් රථ සඳහා රේගු තක්සේරුව. |
| 861A | 23.04.2014 | නීති | රේගු පරීක්ෂණ සහ විමර්ශන. |
| 925 | 23.04.2014 | ආනයන | ආහාර නිෂ්පදනය සම්බන්ධව බර තීරණය කිරිම සඳහා අනුමැතිය . |
| 923A | 24.04.2014 | විශේෂ භාණ්ඩ බදු | දෙපාර්තමේන්තු නියෝග අ 23 A අදාළ නිවැරදි කිරීම. |
| 926 | 25.04.2014 | ආනයන | භාකෝට්ස් සඳහා රේගු පහසුකම් නතර කිරීම. |
| 927 | 05.05.2014 | ආනයන | තාවකාලික වර්ගීකරණය |
| 926A | 07.05.2014 | ආනයන | රේගු පහසුකම් නැවත ලබාදීම. |
| 928 | 20.05.2014 | පාලන | බලාත්මක කිරීමේ කමිටුව. |
| 929 | 30.05.2014 | විශේෂ භාණ්ඩ බදු | විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 930 | 30.05.2014 | විශේෂ භාණ්ඩ බදු | පරිප්පු සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 931 | 02.06.2014 | බදු සහන | කිරපිට සඳහා බදු සහන |
| 932 | 10.06.2014 | විශේෂ භාණ්ඩ බදු | බඩ ඉරිඟු සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය |
| 933 | 11.06.2014 | දුම්කොළ | දුම්කොළ නිෂ්පාදනය ලේබල් කිරීම සහ ඇසුරුම් කිරීමේ රීති. |
| 934 | 04.07.2014 | ආනයන / ආනයන | Hub ක්‍රියාව සඳහා ලිපිලේඛන හා පරීක්ෂා කිරීමේ පරිපාටිය. |
| 935 | 16.07.2014 | විශේෂ භාණ්ඩ බදු | අල සහ සීනි සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 936 | 17.07.2014 | විශේෂ භාණ්ඩ බදු | මැකරල් සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 937 | 17.07.2014 | විශේෂ භාණ්ඩ බදු | සහල් සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 562E | 21.07.2014 | NC කමිටුව | NC කමිටුව. |
| 938 | 28.07.2014 | විශේෂ භාණ්ඩ බදු | විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 939 | 31.07.2014 | පාලන | රේගු ජාත්‍යන්තර කටයුතු අංශය. |
| 940 | 01.08.2014 | සෙස් බද්ද | සීනි ආනයන සෙස් බද්ද අයකර ගැනීම. |
| 941 | 11.08.2014 | විශේෂ භාණ්ඩ බදු | විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 942 | 14.08.2014 | විශේෂ භාණ්ඩ බදු | විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 943 | 15.08.2014 | මෝටර් වාහන | රුහුණු මාගම්පුර මහින්ද රාජපක්ෂ වරායේ මෝටර් වාහන අත් අඩංගුවට ගැනීම. |
| 869A | 15.08.2014 | මැණික් | මැණික්ගල් අපනයනය. |

| | | | |
|---|---|---|---|
| 869B | 19.08.2014 | නිවැරදි කිරිම | දෙපාර්තමේන්තු නියෝග 869A අදාළ නිවැරදි කිරිම |
| 749B | 20.08.2014 | තක්සේරු | තක්සේරු කමිටුව. |
| 944 | 25.08.2014 | ආනයන | අපනයන වෙළඳ සම්පාලය සම්බන්ධ වටිනාකම සීමාව. |
| 945 | 25.08.2014 | විශේෂ භාණ්ඩ බදු | බී ළූණු සහ අල සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 946 | 05.09.2014 | විශේෂ භාණ්ඩ බදු | සහල් සහ සීනි සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 947 | 05.09.2014 | භාණ්ඩ පරීක්ෂා කිරීම | බර -GSM ටොලරන්ස් . |
| 118-P | 26.09.2014 | ත්‍යාග | ප්‍රතිපත්ති සැළසුම් හා පරීක්ෂණ අංශයේ සංචිතය වර්ධනය. |
| 948 | 10.10.2014 | බදු සහන | කිරිපිටි බදු සහන නැවැත්වීම. |
| 949 | 13.10.2014 | නිෂ්පාදන බදු | ඊතල් මත්ද්‍රව්‍ය.ආනයනය |
| 950 | 14.10.2014 | නිෂ්පාදන බදු | සිගරට් සඳහා නිෂ්පාදන බදු සංශෝධනය. |
| 951 | 15.10.2014 | ආනයන පාලන බලපත්‍ර | ආරක්ෂක අමාත්‍යාංශයේ බලපත්‍ර ඉල්ලුම් කිරීම. |
| 952 | 24.10.2014 | ආනයන | ආදායම් සංරක්ෂණ නියෝග .2014/02 |
| 953 | 24.10.2014 | ආනයන පාලන බලපත්‍ර | ආනයන පාලන බලපත්‍ර ඉල්ලුම් කිරීම. |
| 954 | 24.10.2014 | බදු සහන | කිරිපිටි සඳහා බදු සහන. |
| 955 | 24.10.2014 | විශේෂ භාණ්ඩ බදු | විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 956 | 24.10.2014 | ආනයන | මෝටර් රථ ක්ෂය වීමේ සටහන. |
| 957 | 24.10.2014 | සෙස් බද්ද | ආනයන සෙස් බදු වෙනස්වීම්. |
| 958 | 24.10.2014 | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු වෙනස්වීම් .(විශේෂ නියෝග) |
| 959 | 24..10.2014 | සෙස් බද්ද | ආනයන සෙස් බදු වෙනස්වීම්. |
| 960 | 24.10.2014 | නිෂ්පාදන බදු | නිෂ්පාදන බදු නිදහස් කිරීම. |
| 961 | 24.10.2014 | ආනයන | ජාතික ගොඩනැගිලි බද්ද වැට් /බද්දබදු වරාය හා ගුවන් / .නිදහස් කිරිම |
| 962 | 24.10.2014 | ආනයන | ඊතෙල් මත්ද්‍රව්‍ය ආනයනය . |
| 958A | 27.10.2014 | නිෂ්පාදන බදු | දෙපාර්තමේන්තු නියෝග .අදාළ නිවැරදි කිරීම 958 |
| 958B | 28.10.2014 | නිෂ්පාදන බදු | දෙපාර්තමේන්තු නියෝග 58A අදාළ නිවැරදි කිරීම. |
| 963 | 28.10.2014 | විශේෂ භාණ්ඩ බදු | මාගරින් සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 964 | 30.10.2014 | බදු සහන | රත්‍රන් සඳහා බදු සහන. |
| 956A | 30.10.2014 | මෝටර් රථ | මෝටර් රථ ක්ෂය වීමේ සටහන. |
| 957A | 31.10.2014 | සෙස් බද්ද | දෙපාර්තමේන්තු නියෝග .අදාළ නිවැරදි කිරීම 957 |
| 958C | 03.11.2014 | නිෂ්පාදන බදු | වාහන බලපත්‍ර සඳහා නිෂ්පාදන බදු සංශෝධනය. |
| 956B | 03.11.2014 | මෝටර් රථ | මෝටර් රථ ක්ෂය වීමේ සටහන සම්බන්ධ නිවැරදි කිරීම. |
| 965 | 10.11.2014 | බදු සහන | කිරිපිටි සඳහා බදු සහන. |
| 966 | 10.11.2014 | බදු සහන | පෙට්‍රල් හා ඩීසල් සඳහා බදු සහන. |
| 957B | 10.11.2014 | සෙස් බද්ද | දෙපාර්තමේන්තු නියෝග .අදාළ නිවැරදි කිරීම 957 |
| 967 | 11.11.2014 | ආනයන | අර්තාපල් ආනයනය තහනම් කිරීම. |
| 968 | 20.11.2014 | ආනයන | අර්තාපල් ආනයනය සඳහා අවසර ගැනීම. |
| 969 | 02.12.2014 | විශේෂ භාණ්ඩ බදු | අර්තාපල් සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය . |
| 970 | 05.12.2014 | බදු සහන | පෙට්‍රල් හා ඩීසල් සඳහා බදු සහන. |
| 971 | 12.12.2014 | විශේෂ භාණ්ඩ බදු | අර්තාපල් සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |
| 972 | 19.12.2014 | ආනයන පාලන බලපත්‍ර | නව වායු සමීකරණ සඳහා ආනයන පාලන යන්ත්‍ර .යබලපත්‍ර |
| 973 | 23.12.2014 | මුදල් හුවමාරු පාලන | විනිමය හුවමාරු පාලන රෙගුලාසි |
| 974 | 31.12.2014 | වැට් බදු | වැට් බදු සංශෝධනය . |
| 975 | 31.12.2014 | විශේෂ භාණ්ඩ බදු | බී ළූණු සඳහා විශේෂ භාණ්ඩ බදු සංශෝධනය. |

# අලුතෙන් විවෘත කරන ලද දෙපාර්තමේන්තු විෂයානුබද්ධ ලිපිගොණු

| දිනය | පී එල් අංකය | විස්තරය |
|---|---|---|
| **03.01.2014** | 729 | අනුරාධපුර මහ රෝහලට ඩයලසිස් යන්ත්‍රය පරිත්‍යාග කිරීම. |
| **13.01.2014** | 730 | වෙළඳ පහසුකම් සඳහා ලෝක වෙළඳ සංවිධානය සමඟ ගිවිසුම. |
| **12.02.2014** | 731 | ශ්‍රී ලංකා ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය. |
| **19.02.2014** | 732 | ඵලදායිතා වර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම. |
| **19.03.2014** | 733 | දෙපාර්තමේන්තු උපාය සැලැස්ම කමිටුව. |
| **27.03.2014** | 734 | නව ගොඩනැගිල්ලේ ආරම්භක උත්සවය. |
| **02.04.2014** | 735 | වෙනස් නොකරන සහතිකය. |
| **11.04.2014** | 736 | ඉක්මන් මාර්ග ලිපි ලේඛන ක්‍රියාත්මක කිරීමේ කමිටුව. |
| **24.04.2014** | 737 | කාබනික අපද්‍රව්‍ය සඳහා ස්ටොක්හෝම් සම්මුතිය වැඩ කමිටුව. |
| **06.05.2014** | 738 | ලෝක රේගු සංවිධානය SAFE ෆෙම් වර්ක් සඳහා ප්‍රමිති උප කමිටු රැස්වීම. |
| **06.06.2014** | 739 | ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි රාජ්‍යය අතර රේගු කරුණු සම්බන්ධ සහයෝගය හා අන්‍යෝන්‍ය උපකාර සඳහා ගිවිසුම. |
| **31.07.2014** | 740 | ශ්‍රී ලංකා හා කොරියාව අතර එකමුත් කාර්ය සමූහ රැස්වීම. |
| **15.08.2014** | 741 | තිඹපු සංකල්ප පත්‍රිකාව. |
| **15.08.2014** | 742 | සනීපාරක්ෂක හා ජීව සෞඛ්‍ය ක්‍රියාවලිය සම්බන්ධ ජාතික සම්මන්ත්‍රණය. |
| **21.08.2014** | 743 | ශ්‍රී ලංකාව සහ කටාර් අතර ගිවිසුම. |
| **25.08.2014** | 744 | ආනයන පාලන බලපත්‍රය රහිතව කෘෂිකර්ම යන්ත්‍රෝපකරණ ආයනයනය කිරීම. |
| **02.09.2014** | 745 | රැකියා විස්තරය පරීක්ෂා කිරිම. |
| **05.09.2014** | 746 | ශ්‍රී ලංකාව හා චීනය අතර අවබෝධතා ගිවිසුම. |
| **10.09.2014** | 747 | අවබෝධතා ගිවිසුම පරීක්ෂණය සඳහා විවෘතකිරිම. |
| **18.09.2014** | 748 | කාලය හැරිම අධ්‍යයනය පරීක්ෂා කිරිම. |
| **27.11.2014** | 749 | යෝජිත වරාය ප්‍රවේශ මාර්ගයේ නව කන්ටේනර් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානය. |

**2015 අයවැය යෝජනාවට ඇතුළත් කිරීම සඳහා ව්‍යාපාර හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යෝජනා කරන ලද භාණ්ඩ විස්තර හා සළකුණු ක්‍රමය අදාල ජාතික අනු බෙදීම් 2015 ජාතික අයවැය යෝජනාව අනුව HS හි අදාළ පරිච්ඡේදය යටතේ පහත සඳහන් භාණ්ඩ සඳහා ජාතික අනු බෙදීම් 07 ඇති කිරීම යෝජනා කර ඇත.**

1. මුද්‍රණය කළ භාණ්ඩ.
2. විදේශ මුදල් නෝට්ටු.
3. ශාඛ සාර අඩංගු බීම වර්ග.
4. බඳු ස්ථරකඩදාසි මලු.
5. පැතලි ඇකිලිය හැකි යකඩ නිෂ්පාදන.
6. සිටුවීම සඳහා අනුමත බෝංචි වර්ග.
7. කරාමය, කොකු, වැල්ව් හා ඊට සමාන අයිතමයන්.

## අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් සහභාගී වූ සම්බන්ධීකරණ රැස්වීම.

**2014 වර්ෂයේ පහත සඳහන් ආයතනවල විවිධ වූ රැස්වීම් පැවැත්විය.**

1. වාණිජ දෙපාර්තමේන්තුව
2. ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව
3. විදේශ කටයුතු අමාත්‍යාංශය
4. පරිසර අධිකාරිය
5. මුදල් අමාත්‍යාංශය, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්තිය, පිස්කල් ප්‍රතිපත්ති
6. ප්‍රතිපත්ති සැළසුම් පර්යේෂණ අංශයේ සංවිධානය කරනලද රැස්වීම්.

### 1. ජාත්‍යන්තර රේගු දින සැමරුම

දිනය - 2014 ජනවාරි 27
ස්ථානය - රේගු මූලස්ථානය
තේමාව - සන්නිවේදනය: හොඳ සම්බන්ධතාවයක් සඳහා තොරතුරු හුවමාරු කර ගැනීම.
ප්‍රධාන ආරාධිත අමුත්තා - ආචාර්ය සරත් අමුණුගම, නියෝජ්‍ය ඇමති මුදල් හා ක්‍රමසම්පාදන

### 2. අවදානම් කළමනාකරණය / තක්සේරුව සම්බන්ධ ජාත්‍යන්තර රේගු සංවිධානය වැඩ මුළුව

දිනය - 2004 දෙසැම්බර් 8 සිට 12 දක්වා

ස්ථානය - ටාජ් සමුද්‍රා හෝටලය, කොළඹ, ශ්‍රී ලංකා

සම්පත් දායකත්වය

- ඔගුස් ඕනල් මහතා - වැඩසටහන් කළමනාකරු , එකඟතාවය මත පහසුකම් අංශය, ජාත්‍යන්තර රේගු සංවිධානය
- ටී.ඒ.එල්. වීරසිංහ මහතා - අවදානම් කළමණාකරණ අංශයේ ජාත්‍යන්තර රේගු සංවිධානය පිළිගත් අවදානම් කළමණාකරණ ප්‍රවීනයෙකි.
- තකාහිරෝ තකාෂි මහතා - අවදානම් කළමණාකරණ අංශයේ ජාත්‍යන්තර රේගු සංවිධානය පිළිගත් අවදානම් කළමණාකරණ ප්‍රවීනයෙකි.

# පශ්චාත් නිශ්කාශන විගණන අංශය

## හැඳින්වීම

පශ්චාත් නිශ්කාශන විගණනය යනු යම්කිසි භාණ්ඩ තොගයක් රේගුවෙන් නිදහස් වූ පසුව සිදු කරන විගණනය පාදක කරගත් රේගු පාලනයකි. මෙවැනි විගණනයක අවශ්‍යතාව වන්නේ රේගු සටහන්කරවල නිරවද්‍ය බව හා නීත්‍යානුකූල භාවය සොයා බැලීමටත්, ව්‍යාපාරිකයන්ගේ වාණිජ දත්ත ව්‍යාපාර ක්‍රමවේද හා සටහන් වාර්තා නිරවද්‍යය ද යන්න අනාවරණය කර ගැනීමටත්ය. මෙවැනි විගණනයක් ව්‍යාපාරිකයාගේ පරිශ්‍රය තුළම කළ හැකි වන අතර, එක් එක් ගණුදෙනුවක් සඳහා කරනු ලබන විගණන "ගණුදෙනුව පදනම් කරගත්" යන නමින් හඳුන්වන අතර, යම්කිසි කාල පරාසයක සිදු කරන ආනයන හෝ අපනයන ආවරණය කරන විගණන "සමාගම පාදක කරගත්" නමින් හඳුන්වයි.

අවදානම් විශ්ලේෂණයෙන් හඳුනාගත් භාණ්ඩ හා ව්‍යාපාරිකයන් ඉලක්ක කරගෙන එකින් එක වෙන් වෙන් වශයෙන් ගත් නඩු පදනම් කරගෙන පශ්චාත් නිශ්කාෂණ විගණන ක්‍රියාත්මක කළ හැකි අතර, වාර්ෂික විගණන වැඩසටහන් යටතේ සැළසුම්ගත විධිමත් ක්‍රමයකින් ද එය ක්‍රියාත්මක කළ හැක. තෝරාගත් ආර්ථික ක්‍රියාකරුවන්ට විශේෂත්වයක් පිරි නැමීමේ ක්‍රමවේදයක් ලෙසට ද මෙම විගණන භාවිතා කළ හැක.

පශ්චාත් නිශ්කාෂණ හා විගණන අංශය (PCAB), ජගත් රේගු සංවිධානයේ (WCO), මිල පිරික්සුම් එකඟතා ගිවිසුම යටතේ පහසුකම් සැලසීම සඳහා මිල පිරික්සුම් අංශය යටතේ වසර 2000 දී මුලින්ම පිහිටුවන ලදී. ඒ සඳහා පශ්චාත් විගණන හා නෞභාර ලේඛන අංශය (PAMU), හා විගණන පිරික්සුම් අංශය (ALID) යන අංශ දෙක අන්තර්ග්‍රහණය කරන ලදී.

රේගු දෙපාර්තමේන්තුවේ නව ආයතනික ව්‍යුහය ක්‍රියාත්මක වීමත් සමග මිල පිරික්සුම් අංශයේ කොටසක් වශයෙන් ක්‍රියාත්මක වූ පශ්චාත් නිශ්කාෂණ හා විගණන ඒකකය නීති බලාත්මක කිරීම් පර්ෂදයේ නව අංශයක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලද අතර, පශ්චාත් නිශ්කාෂණ හා විගණන අංශය වශයෙන් නම් කරන ලදී.

රේගුවේ නිශ්කාෂණ ක්‍රියාවලියේ ඇති ප්‍රමාද දෝෂ හා සිදු කරන වංචා පාලනය කිරීම පිණිස හා ව්‍යාපාරික හවතුන්ට පහසුකම් සැලසීම යන කරුණු මුල් කරගෙන පවතින ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම් වස් අවදානම් කළමනාකරණ ඒකකයක් (RMU) පිහිටුවීමට තීරණය කරනලදී.

අවදානම් කළමනාකරණයේ ගුණාංග ක්‍රියාත්මක කිරීම හා රේගු නිශ්කාෂණ ක්‍රියාවලියේ පහසුකම් සලසන ලද ක්‍රියාදාමය හඳුන්වා දීම මගින් ව්‍යාපාරික ප්‍රජාවගේ තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා PCAB සහ RMU ඒකක දෙක සහාය සේවා පර්ෂදය යටතේ ක්‍රියාත්මක වන එක අංශයකට ගෙන ඒමට තීරණය කරන ලදී. එමගින් PCAB, RMU යන ශාඛා දෙක 2013 සැප්තැම්බර් මස 26 දින සිට "අනුගත වීමේ හා පහසුකම් සැලසීමේ අංශය" යටතේ ක්‍රියාත්මක වේ. (DOPL 883)

## මූලික කාර්යයන්

1. සියලු රේගු සටහන්කරවල වොරන්ට් පිටපත සැලසුමකට අනුව එකතු කිරීම, ගබඩා කිරීම හා ආරක්ෂා කිරීම
2. වොරන්ට් පිටපත හා සම්බන්ධ අනෙකුත් ලියකියවිලි පරීක්ෂා කිරීම හා ඒවායේ දත්ත විශ්ලේෂණය කිරීම
3. විගණනයට භාජනය වන්නන් තේරීම
4. විගණන පැවැත්වීම
5. සිදුවන වංචා සහ හිඟ බදු සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම
6. ඉදිරි වැඩි දියුණු කිරීම් සිදු කිරීම සඳහා විගණන ක්‍රියාවලිය විමර්ශනය කිරීම
7. 'Asycuda World' ක්‍රියාපිළිවෙල යටතේ ලබා දෙන e-නෞභාර ලේඛන පරීක්ෂා කිරීම
8. ආපසු දෙන මුදල් හැකි ඉක්මණින් ලබාදීම

## මූලික අරමුණු

(අ) පසුගිය යම් කාලසීමාවක් තුළ රේගු සටහන්කරවල නීත්‍යානුකූල භාවය හා නිරවද්‍යතාව පරීක්ෂා කිරීම
(ආ) වැරදි රේගු සටහන්කර සංශෝධනය කිරීම සඳහා විගණන ලාභීන්ට නිර්දේශ ලබා දීම
(ඇ) විගණන ලාභීන් රේගු නීතිය හා රෙගුලාසිවලට අනුගතවීම වැඩි කිරීමට පෙළඹවීම
(ඈ) අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට යෙදවුම් ලබාදීම

**පශ්චාත් නිශ්කාශන විගණනය යටතේ පරීක්ෂා කරන අයිතම**

පහත වගුවේ දැක්වෙන සියළු අයිතමයන් යටතේ පසු නිශ්කාෂණ විගණන කළහැකි වේ.

| බදු මූලය සම්බන්ධ අයිතම | බදු අනුපාත සම්බන්ධ අයිතම | බදු ප්‍රමාණය සම්බන්ධ අයිතම | අනෙකුත් |
|---|---|---|---|
| • වටිනාකම<br>• ප්‍රමාණය<br>• මුදල් වර්ගය විනිමය අනුපාත | • වර්ගීකරණය සාමාන්‍ය බදු අනුපාත<br>• වරණීය බදු අනුපාත | • නිදහස් කිරීම් යුක්ති සාධන ප්‍රමාණය<br>• බදු ගණනය කිරීමේ නිරවද්‍යතාවය | • සීමා කිරීම්<br>• තහනම් කිරීම්<br>• ආනයන බලපත්‍ර<br>• IPR<br>• CITES |

ඉහත දැක්වෙන අයිතම පශ්චාත් නිශ්කාශන විගණනයට පෙර නිශ්කාශන අවස්ථාවේ දී හෝ නිශ්කාෂණයට පෙර අවස්ථාවල දී රේගු පරීක්ෂාවට ලක් කළ හැක. පශ්චාත් නිශ්කාෂණ විගණනයේ ප්‍රවේශය සාමාන්‍ය රේගු පරීක්ෂාවට වඩා වෙනස් අතර, එය එහි යහගුණය වැඩි කිරීමටත් දුර්ගුණය අවම කර ගැනීමටත් සිදු කරනු ලබයි. පශ්චාත් නිශ්කාෂණ විගණනය මගින් විගණනයට භාජනය වන්නාගේ රේගු නිශ්කාෂණයේ ලියකියවිලි පරීක්ෂාවට ලක් කිරීමට නිලධාරීන්ට බලය පැවරෙන අතර, ඔහුගේ පරිශ්‍රයේ දී විගණනයට ලක්වන්නාගේ ගිණුම් පොත්, වාර්තා හා අදාළ පොත්පත් පරීක්ෂාවට ලක් කළ හැක.

## පශ්චාත් නිෂ්කාශන විගණන අංශය


### 2014 වර්ෂයේ කාර්ය සාධනය

| | 2014 |
|---|---|
| වසර තුළ ලියාපදිංචි කළ විගණන සංඛ්‍යාව | 98 |
| අවසන් කරන ලද විගණන සංඛ්‍යාව (කලින් වසරවල ලියාපදිංචි කළ සංඛ්‍යාව දඇතුළුව) | 50 |
| විගණන මගින් සොයාගත් වැරදි සහ නියම කල දඩ | 50 |
| අයකර ගන්නා ලද දඩ මුදල් ප්‍රමාණය | රු: 77,080,892.00 |
| රාජසන්තක කළ භාණ්ඩවල විකුණුමෙන් ලත් වටිනාකම | රු: 37,635,525.00 |
| අතිරේක සටහන්කර ලෙස එකතු කරගත් ප්‍රමාණය | රු: 4,660,935.00 |


## වර්ෂයේ කාර්ය සාධනය (2012,2013 හා 2014 )

| | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| වසර තුළ ලියාපදිංචි කළ විගණන සංඛ්‍යාව | 47 | 93 | 98 |
| අවසන් කරන ලද විගණන සංඛ්‍යාව (කලින් වසරවල ලියාපදිංචි කළ සංඛ්‍යාව ද ඇතුළුව) | 24 | 42 | 50 |
| විගණන මගින් සොයාගත් වැරදි සහ නියම කල දඩ | 24 | 42 | 50 |
| අයකර ගන්නා ලද දඩ මුදල් ප්‍රමාණය | රු: 165,713,513 | රු: 251,181,532 | රු: 114,716,417 |
| රාජසන්තක කළ භාණ්ඩවල වටිනාකම | රු: 278,159,754 | නැත | නැත |
| අතිරේක ආදායම් ලෙස එකතු කරගත් ප්‍රමාණය | රු: 41,223,576 | නැත | රු: 4,660,935 |

### කාර්ය සාධන සංසන්දනය – 2014




### කාර්ය සාධන සංසන්දනය – 2012, 2013 හා 2014



## 2014 වසරේ මෙම අංශයේ විශේෂ කාර්ය සාධනය

## 2014 වසරේ යෝජිත අවිනිශ්චිත සටහන

| | ප්‍රධාන කාර්යයන් | ළඟා කරගත් දේ |
|---|---|---|
| 1. | රේගු නිලධාරීන්ට පැවැත්වීමට ඇති දෙපාර්තමේන්තු වැඩමුළු දෙකක් | 2014 මැයි සිට නොවැම්බර් අතර |
| 2. | දෙපාර්තමේන්තුවට සම්බන්ධ අය සඳහා පැවැත්වෙන උපදේශක වැඩමුළු | 2014මැයි සිය ජූනි අතර |
| 3. | රේගු වෙබ් අඩවිය හරහා මිල තක්සේරු තොරතුරු බෙදාහැරීම | 2014 අගොස්තු මැද භාගය |
| 4. | ස්ථානමාරු ප්‍රතිපත්තිය පිළිබඳ සාකච්ඡා පැවැත්වීම | ඊළඟ හය මාසික ස්ථාන මාරුවට පෙර |
| 5. | මිල තක්සේරු ක්‍රියාමාර්ග සම්බන්ධ පොත් පිංචක් නිකුත් කිරීම | 2014 ඔක්තෝබර් වන විට |

## ඉහත ලේඛනයට අනුව ප්‍රගති වාර්තාව

| | ප්‍රධාන කාර්යයන් | ළඟා කරගත් දේ |
|---|---|---|
| 1. | රේගු අධිකාරී / නියෝජ්‍ය රේගු අධිකාරී/ සහකාර රේගු අධිකාරී සඳහා ලෝක වෙළඳ සංවිධාන තක්සේරු පරිපාටිය හඳුන්වා දීම සම්බන්ධ වැඩමුළුව පැවැත්විය. | 2014 ජනවාරි - පැය 3ක කාලය<br>2014 පෙබරවාරි - පැය 12ක කාලය<br>2014 මාර්තු - පැය 12ක කාලය<br>2014 අප්‍රේල් - පැය 9ක කාලය |
| 2. | ලංකා වානිජ සංගමයේ පැවැත්වූ දෙපාර්තමේන්තුවට සම්බන්ධ අය සඳහා ලෝක වෙළඳ සංවිධානයේ මිල තක්සේරු පරිපාටිය හඳුන්වා දීමේ වැඩමුළුව | 2014 සැප්තැම්බර් පැය 3 |
| 3. | මිල තක්සේරු තොරතුරු බෙදාහැරීම | නවතම සහ පාවිච්චි කරනලද මෝටර් රථ සඳහා රේගු තක්සේරු ප්‍රකාශනය |
| 4. | ස්ථානමාරු ප්‍රතිපත්තිය පිළිබඳ සාක්චිඡා පැවැත්වීම | සම්පූර්ණයි. |
| 5. | තක්සේරු ක්‍රියාමාර්ග සම්බන්ධ ප්‍රකාශනයන් | අසම්පූර්ණයි. |

## ආපසු ගෙවීමේ අංශය


### ආපසු ගෙවීම් හිමිකම් තත්ත්වය - 2014

| වසර | 2014 |
|---|---|
| අයදුම්පත්/හිමිකම් ලියාපදිංචි කළ | 141 |
| සම්පූර්ණ කළ ආපසු ගෙවීම් | 18 |
| අයදුම්පත්/හිමිකම් නිශ්ප්‍රභා කරන ලද | 01 |


### ආපසු ගෙවීම් හිමිකම් තත්ත්වය - (2011 - 2014)

| වසර | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| අයදුම්පත්/හිමිකම් ලියාපදිංචි කළ | 76 | 186 | 165 | 141 |
| සම්පූර්ණ කළ ආපසු ගෙවීම් | 51 | 98 | 121 | 18 |
| අයදුම්පත්/හිමිකම් නිශ්ප්‍රභා කරන ලද | 01 | 01 | 02 | 01 |

### සංසන්දනය - 2011 - 2014



## සංසන්දනය - 2010 - 2014




## අවදානම් කළමනාකරණ ඒකකය

අවදානම් කළමනාකරණය යනු, අවදානමට මුහුණ දීම සඳහා රේගු දෙපාර්තමේන්තුවට වුවමනා කරන තොරතුරු ලබා දෙන්නාවූ කළමනාකරණ කාර්ය පටිපාටි සහ පරිචයන් ක්‍රමානුකූලව යොදා ගැනීම වේ. අදාළ ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූල නොවීමට ඇති ඉඩකඩ සහ ප්‍රමාණවත් මට්ටමකින් පහසුකම් සැලසීමට අපොහොසත් වී යන ඒවා රේගු පරිපාලනය මුහුණ දෙන ප්‍රධාන අවදානම් වේ.

නීත්‍යානුකූල ජාත්‍යන්තර වෙළඳාම ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය වන අතර, භාණ්ඩ රට තුළට ගෙන ඒමත්, රටින් පිටතට රැගෙනයාමට පහසුකම් සැලසීම සම්බන්ධයෙන් වැඩි වැඩියෙන් අවධාරණය කෙරෙමින් පවතී. එම නිසා මෙම නිෂ්කාශණ ක්‍රියාවලියේ සහ කාර්ය පටිපාටීන්හි ඇති මනුෂ්‍ය මැදිහත්වීම් අවම කර, පද්ධති පදනම් කරගත් පාලන හඳුන්වා දීමට රේගු දෙපාර්තමේන්තුවට සිදුව තිබේ.

ඉහත කී අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීමේ අරමුණ ඇතිව, පාලනය සහ පහසුකරණය අතර, නිසි සමබරතාවය පවත්වාගෙන යාම සඳහා අවදානම් කළමනාකරණ මෙවලම් භාවිතා කරන්නා වූ අවදානම් කළමනාකරණ ඒකකයක් ඇති කිරීමට ශ්‍රී ලංකා රේගුව විසින් කටයුතු කර තිබේ. ස්වයංක්‍රීය වරණියතා පද්ධිතය අවදානම් කළමනාකරණ මෙවලම් භාවිතා කරන අතර, වියහැකි අවදානම් තක්සේරු කිරීම සඳහා අවදානම් දර්ශකද භාවිතයට ගනු ලැබේ. ASYCUDA පද්ධති තුළ ඇති ස්වයංක්‍රීය වරණියතා වැඩසටහන හරහා මෙම අවදානම් කළමනාකරණ මෙවලම් දිවෙන අතර, ඊට ඇතුළත් කරන ප්‍රකාශිත ආනයන දත්ත හඳුනාගත් ආවදානම් පරාමිතීන් මත පදනම් වෙමින් විශ්ලේෂණයට භාජනය වෙනු ඇත. තෝරාගනු ලබන අවදානම් මට්ටම අනුව අදාළ බඩු තොගය වෙනස් නාලිකා කිහිපයක් ඔස්සේ රේගුවේ පරීක්ෂාව සඳහා යොමු වනු ඇත. රේගු පරිපාලනය විසින් තීරණය කරන අවදානම් මෙවලම් අතරින් මිල දත්ත පද්ධතිය, ආනයන භාණ්ඩ සඳහා ප්‍රකාශිත මිලෙහි සත්‍ය හා නිවැරදිභාවය තක්සේරු කිරීම සඳහා වැදගත් වන එක් අවදානම් කළමනාකරණ මෙවලමකි. මෙමගින් ප්‍රකාශිත මිල රේගුවේ සටහන්ව ඇති මිල සමඟ සසඳා බැලීමට අවස්ථාව ලැබේ. ASYCUDA පද්ධිතය තුළ පවතින මිල තොරතුරු බුද්ධිමත් තොරතුරු පද්ධති මගින් විශ්ලේෂණය කර ගොනු කිරීම මගින් රේගු සටහන් මිල දත්ත පද්ධතියක් පිහිටුවීම හරහා සාක්ෂාත් කර ගතහැක. රේගු මිල දත්ත පද්ධතිය පිහිටුවීම මූලික අදියරයේ පවතින අතර, ඉදිරි මාස කීපයක කාලයකදි අවසන් කරගත හැකි වනු ඇත.

නීත්‍යානුකූලව කටයුතු කරන වෙළඳුන්ට පහසුකම් සැලසීමේ අරමුණින්, කඩනමින් ලේඛනගත කිරීමේ වැඩසටහනක් හඳුන්වා දීමට මෙම ඒකකය විසින් කටයුතු කර ඇති අතර, ඒ යටතේ රේගු දිගු කාමරයේදී සිදු

කෙරන ලේඛන ගත කිරීමේ කාර්ය පටිපාටිය සඳහා ග්‍රීන් චැනල් පහසුකම ලබාදෙනු ලැබේ. ඉදිරියේදී භාණ්ඩ පරීක්ෂා කර බැලීම සඳහාද ග්‍රීන් චැනල් පහසුකම ලබාදිය හැකි පරිදි මෙම පහසුකරණ කාර්ය පටිපාටිය වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය.

පාලනය සහ පහසුකරණය අතර නිසි සමබරතාව සාක්ෂාත් කරගැනීම සඳහා අවදානම් කළමනාකරණ මූලධර්ම යෙදවීම අවදානම් කළමනාකරණ ඒකකයේ ප්‍රධාන කාර්ය භාරයයි.

## අවදානම් කළමනාකරණ අංශය

### ප්‍රධාන කාර්යයන්

1. **දිගු කාමරයේ සීඝ්‍ර මාර්ග ප්‍රලේඛන වැඩසටහන**

- නීති ගරුකවීමට එකඟ වී ඇති ව්‍යාපාරිකයින් හඳුනා ගැනීම සහ විවිධ වූ ක්‍රියාමාර්ගයන් හරහා දිගු කාමරයේ සීඝ්‍ර මාර්ග ප්‍රලෝඛන පහසුකම් සැපැයීම.
- ඔවුන්ගේ අභ්‍යන්තර ක්‍රියාපටිපාටි හා ගිණුම් ක්‍රම යනාදිය තක්සේරු කිරීම නිසා එසේ හඳුනාගත් ව්‍යාපාරිකයින්ගේ ආයතන වෙත ගොස් බැලීම.
- සීඝ්‍ර මාර්ග භාණ්ඩ හිමිකරුවන්ගේ නාම ලේඛණය නිසි පරිදි පවත්වාගෙන යාම හා එවුන්ගේ එකඟතාවය පිළිබඳව සුපරීක්ෂාකාරී වීම.

2. **වැඩි අවදානම් භාණ්ඩ තේරීම**

- විවිධ පර්යේෂණ හා පරීක්ෂණ සැලැස්ම හරහා වැඩි අවදානම් භාණ්ඩ හඳුනාගැනීම.
- වැඩි අවදානම් භාණ්ඩ ලේඛනය නියමිත කාලයේදී තක්සේරු කිරීම හා පර්යේෂණ කිරීම.
- නිතර නිතර වැඩි අවදානම් භාණ්ඩ ලේඛනය අලුත් කිරීම.

3. **ස්වයංක්‍රීය තේරීමේ වැඩසටහන**

- අවදානම් පරාමිතිය හඳුනා ගැනීම.
- සෑම අවදානම් පරාමිතියකටම අවදානම් මට්ටම සැකසීම.
- භාණ්ඩ පරීක්ෂණය සඳහා නියම ක්‍රමවේදය සොයා ගැනීම සඳහා උචිත අවදානම් මට්ටම තීරණය කර ගැනීම.
- ස්වයංක්‍රීය තේරීමේ වැඩසටහන යෝජනා කරනලද කාර්යයන් අඛන්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රායෝගික අධ්‍යනයන් පැවැත්වීම.
- පරීක්ෂණය සඳහා උචිත පරීක්ෂණ දත්ත විශ්ලේෂණය කිරීම.
- පරීක්ෂණයන් පවත්වාගෙන යාම.

4. **මිල පිරික්සුම් දත්ත සමුදාය**

- ආනයන භාණ්ඩ සම්බන්ධ රේගුව විසින් තීරණය කරන ලද වටිනාකම තැන්පත් කිරීම.
- දත්ත සමුදායේ තැන්පත් කරන ලද තීරණය වූ වටිනාකම එක් එක් භාණ්ඩ විස්තරයන්ට අනුව ඇති HS භාණ්ඩ සංකේතය පර්ෂදය කිරීම.
- තක්සේරු දත්ත සමුදාය යෝජනා කරන ලද කාර්යයන් අඛන්ඩව පවත්වාගෙනයාම සඳහා ප්‍රායෝගික අධ්‍යනයන් පැවැත්වීම.
- පරීක්ෂණය සඳහා උචිත පරීක්ෂණ දත්ත විශ්ලේෂණය කිරීම.
- පරීක්ෂණයන් පවත්වාගෙන යාම.

**වසරේ කාර්ය සාධනය 2014**

| | **භාණ්ඩ හිමිකරුවන්ගේ සංඛ්‍යාව / තත්වය** |
|---|---|
| දිගු කාමරයේ සීඝ්‍ර මාර්ග ප්‍රලේඛණ වැඩසටහන | 271 |
| වැඩි අවදානම් භාණ්ඩ ලැයිස්තුව | 763 |
| ස්වයංක්‍රීය තේරීමේ වැඩසටහන | අවදානම් පරාමිතියන් 4ක් අවදානයට ගෙන හා ඒ අනුව අවදානම් මට්ටම පවත්වාගෙන මූලික තේරීම් වැඩසටහන ඇද ඇත. |
| තක්සේරු දත්ත සමුදාය | තක්සේරු දත්ත සමුදාය ආරම්භක අවස්ථා යොදා ඇත. සම්පූරුණ වූ ආකෘතිපත්‍රයක මට්ටම ලබාගැනීම සඳහා නව වටිනාකම් ප්‍රකාශන පත්‍රයක් හඳුන්වා දී ඇත. |

# පශ්චාත් නිෂ්කාශන විගණනය, ආපසු ගෙවීම හා අවදානම් කළමනාකරණ

## හැඳින්වීම

පශ්චාත් නිශ්කාශන විගණනය යනු යම්කිසි භාණ්ඩ තොගයක් රේගුවෙන් නිදහස් වූ පසුව සිදු කරන විගණනය පාදක කරගත් රේගු පාලනයකි. මෙවැනි විගණනයක අවශ්‍යතාව වන්නේ රේගු සටහන්කරවල නිරවද්‍ය බව හා නීත්‍යානුකූල භාවය සොයා බැලීමටත්, ව්‍යාපාරිකයන්ගේ වාණිජ දත්ත ව්‍යාපාර ක්‍රමවේද හා සටහන් වාර්තා නිරවද්‍යය ද යන්න අනාවරණය කර ගැනීමටත්ය. මෙවැනි විගණනයක් ව්‍යාපාරිකයාගේ පරිශ්‍රය තුළම කළ හැකි වන අතර, එක් එක් ගණුදෙනුවක් සඳහා කරනු ලබන විගණන "ගණුදෙනුව පදනම් කරගත්" යන නමින් හඳුන්වන අතර, යම්කිසි කාල පරාසයක සිදු කරන ආනයන හෝ අපනයන ආවරණය කරන විගණන "සමාගම පාදක කරගත්" නමින් හඳුන්වයි.

අවදානම් විශ්ලේෂණයෙන් හඳුනාගත් භාණ්ඩ හා ව්‍යාපාරිකයන් ඉලක්ක කරගෙන එකින් එක වෙන් වෙන් වශයෙන් ගත් නඩු පදනම් කරගෙන පශ්චාත් නිශ්කාෂණ විගණන ක්‍රියාත්මක කළ හැකි අතර, වාර්ෂික විගණන වැඩසටහන් යටතේ සැළසුම්ගත විධිමත් ක්‍රමයකින් ද එය ක්‍රියාත්මක කළ හැක. තෝරාගත් ආර්ථික ක්‍රියාකරුවන්ට විශේෂත්වයක් පිරි නැමීමේ ක්‍රමවේදයක් ලෙසට ද මෙම විගණන භාවිතා කළ හැක.

පශ්චාත් නිශ්කාෂණ හා විගණන අංශය (PCAB), ජගත් රේගු සංවිධානයේ (WCO), මිල පිරික්සුම් එකඟතා ගිවිසුම යටතේ පහසුකම් සැලසීම සඳහා මිල පිරික්සුම් අංශය යටතේ වසර 2000 දී මුලින්ම පිහිටුවන ලදී. ඒ සඳහා පශ්චාත් විගණන හා නෛභාර ලේඛන අංශය (PAMU), හා විගණන පිරික්සුම් අංශය (ALID) යන අංශ දෙක අන්තර්ග්‍රහණය කරන ලදී.

රේගු දෙපාර්තමේන්තුවේ නව ආයතනික ව්‍යුහය ක්‍රියාත්මක වීමත් සමග මිල පිරික්සුම් අංශයේ කොටසක් වශයෙන් ක්‍රියාත්මක වූ පශ්චාත් නිශ්කාෂණ හා විගණන ඒකකය නීති බලාත්මක කිරීම් පර්ෂදයේ නව අංශයක් ලෙස උත්ශ්‍රේණිගත කරන ලද අතර, පශ්චාත් නිශ්කාෂණ හා විගණන අංශය වශයෙන් නම් කරන ලදී.

රේගුවේ නිශ්කාෂණ ක්‍රියාවලියේ ඇති ප්‍රමාද දෝෂ හා සිදු කරන වංචා පාලනය කිරීම පිණිස හා ව්‍යාපාරික හවතුන්ට පහසුකම් සැලසීම යන කරුණු මුල් කරගෙන පවතින ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම් වස් අවදානම් කළමනාකරණ ඒකකයක් (RMU) පිහිටුවීමට තීරණය කරනලදී.

අවදානම් කළමනාකරණයේ ගුණාංග ක්‍රියාත්මක කිරීම හා රේගු නිශ්කාෂණ ක්‍රියාවලියේ පහසුකම් සලසන ලද ක්‍රියාදාමය හඳුන්වා දීම මගින් ව්‍යාපාරික ප්‍රජාවගේ තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා PCAB සහ RMU ඒකක දෙක සහාය සේවා පර්ෂදය යටතේ ක්‍රියාත්මක වන එක අංශයකට ගෙන ඒමට තීරණය කරන ලදී. එමගින් PCAB, RMU යන ශාඛා දෙක 2013 සැප්තැම්බර් මස 26 දින සිට "අනුගත වීමේ හා පහසුකම් සැලසීමේ අංශය" යටතේ ක්‍රියාත්මක වේ. (DOPL 883)

## මූලික අරමුණු

(අ) පසුගිය යම් කාලසීමාවක් තුළ රේගු සටහන්කරවල නීත්‍යානුකූල භාවය හා නිරවද්‍යතාව පරීක්ෂා කිරීම
(ආ) වැරදි රේගු සටහන්කර සංශෝධනය කිරීම සඳහා විගණන ලාභීන්ට නිර්දේශ ලබා දීම
(ඇ) විගණන ලාභීන් රේගු නීතිය හා රෙගුලාසිවලට අනුගතවීම වැඩි කිරීමට පෙළඹවීම
(ඈ) අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට යෙදවුම් ලබාදීම

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| රේගුව සඳහා දෙපාර්තමේන්තුමය වැඩමුළු දෙකක් පැවැත්වීම | 2 වන කාර්තුව | ඉටුව ඇත | |
| පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමේ සැසියක් පැවැත්වීම | 3 වන කාර්තුව | ඉටුව ඇත | |
| රේගු වෙබ් අඩවිය ඔස්සේ තක්සේරු කිරීමේ තොරතුරු බෙදා හැරීම | රේගු යොමු වට්නාකම් ප්‍රකාශයට පත් කිරීම | ඉටුව ඇත | |
| CFD ස්ථාන මාරු ක්‍රමවේදය පිළිබඳව පරිපාලනය සමග සාකච්ඡා කිරිම | 2 වන කාර්තුව | අවසන් කොට ඇත | |
| තක්සේරුකරණ නියමයන් පිළිබඳ පොත් පිංචක් නිකුත් කිරීම | 2 වන කාර්තුව | අවසන් කොට නොමැත | කාර්ය මණ්ඩලය හා සම්පත් ප්‍රමාණවත් නැත |

## අවදානම් කළමනාකරණ ඒකකය

### ප්‍රධාන කාර්යයන්

1. ඉහළ අවදානම් භාණ්ඩ තෝරා ගැනීම.
   - පළමුවතාවට ලියාපදිංචි කළ ආනයනකරුවන්ගේ විස්තර ලබා ගැනීම. (from 01st of May to November 20th and 21st of November to 9th of January)
   - දැනට පවතින ඉහළ අවදානම් භාණ්ඩ පිළිබඳව පසු දත්ත ගවේෂණය කිරිම. (HRC)
   - පැවති HRC නාමාවලිය ඉවත් කිරිම.
   - නව HRC නාමාවලිය සැකසීම.
   - අළුතින් එකතු කළ HRC ආනයනකරුවන් අධීක්ෂණය.

2. **දිගු කාමරයේ සීඝ්‍ර මාර්ග ප්‍රලේඛන වැඩසටහන**
   - හඳුනාගත් අනුකූල ව්‍යාපාරිකයන් සඳහා දිගු කාමරයේ කොළ වැනල ප්‍රලේඛන පහසුකම.
   - අනුකූලතා ව්‍යාපාරිකයන් ඔවුන්ගේ අභ්‍යන්තර ක්‍රමවේදයන් ගිණුම්කරණ ක්‍රමය සහ අනෙකුත් අනුකූලතා සංවේදී විෂයයන් හා විචල්‍යයන් තක්සේරු කිරීම සඳහා සියුම් ප්‍රශ්නමාලාවක් සැකසීම.
   - යෝජිත වැඩසටහන ගැන ඉහත සඳහන් සමාගම්වල නිලධාරීන් දැනුවත් කිරීම.
   - දිගු කාමරයේ රේගු සටහන්කර ක්‍රියාවලිය සඳහා Asycuda world system තුළට එම සමාගම්වල TIN අංක ඇතුලත් කිරීම.

3. **ආදායම් පර්යේෂණ**
   - යෝජිත ආදායම් පර්යේෂණ වාර්තාවේ අන්තර්ගතයේ හා විෂය පථයේ ආකෘතිය සැකසීම.
   - එක් එක් අංශවලින් එකතු කරනු ලබන අමතර අයකර ගැනීම් දඩමුදල් හා රාජ සන්තක කිරීම් යනාදිය සම්බන්ධයෙන් ආකෘති පත්‍රයක් සකස් කිරීම.
   - වාර්තාවල සවිස්තර විශ්ලේෂණ සඳහා පරිගණක දත්ත ගබඩාවෙන් ආනයන දත්ත ලබාගැනීමට පරිගණක දත්ත ගබඩා විමසුමක් සකස් කිරීම.

## 4. පරිගණකගත මිළ පිරික්සුම් සම්බන්ධ දත්ත ගබඩාවක් පිහිටුවීම.

- භාණ්ඩවල විස්තරය/ ස්වභාවය අනුව ඒවායේ සංයෝජිත වර්ගීකරණය අයිතම පර්ෂදීකරණය භාවිත කිරීම.
- දැනට ක්‍රියාත්මකව පවතින ASYCUDA World මොඩියුලයට එදිරිව යෝජිත මිළ පිරික්සුම් සම්බන්ධ දත්ත
  ගබඩාවක් සඳහා සාවද්‍යතා වාර්තාවක් සකස් කිරිම.
- ඉන්දියානු නියෝජිත මණ්ඩලය විසින් ඉදිරිපත් කළ දත්ත උපයෝගී කර ගනිමින් දැනට පවතින පර්ෂදීකරණය භාවිතා කිරීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් 1 : පෙර වැරදි දත්ත පද්ධතියේ නිරවද්‍යතාවය හා ඵලදායී බව ඉහළ නැංවීම<br><br>වගකිම : මධ්‍යම බුද්ධි ඒකකය | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන පියවරයන් | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | |
| 1. යම් වරදක් ස්ථාපිත වූ සැනින් අනෙකුත් කාර්යාංශ වෙතින් ඒ පිළිබඳ තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | | | | | වරදක් සාර්ථක ලෙස ස්ථාපිත නොවූ අවස්ථාවක අනෙකුත් කාර්යාංශ වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා වූ සුමට ක්‍රියාකාරකම් ප්‍රවාහයක් ස්ථාපිත කිරීම. අනෙකුත් කාර්යාංශ සමග නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාමට නොහැකිවීම හේතුවෙන් සාමානය ක්‍රමවේදය ක්‍රියාත්මක වේ. අත් අඩංගුවට ගැනීම් පිළිබඳ වාර්තා නිසි කලට ඉදිරිපත් කිරීමේ වැදගත්කම පිළිබඳ අවබෝධයක් නොතිබීම හා නිසි සන්නිවේදන ජාලයක් නොතිබීම සැලසුම අසාර්ථක වීමට පාදක වී ඇත. |
| 2. එම තොරතුරු මධ්‍යම ඉලෙක්ට්‍රොනික පද්ධතියට ඇතුලත් කිරීම සඳහා වූ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | | | | | පෙර වැරදි දත්ත පද්ධතිය මධ්‍යගත කිරීම සඳහා අපේක්ෂිත මට්ටමට වඩා වැඩි යටිතල පහසුකම් හා තාක්ෂණික දැනුම අවශ්‍යය. රේගු දෙපාර්තමේන්තුව තුල සිදුවන අනෙකුත් මහා පරිමාණ ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘතීන් හමුවේ මෙම උප ක්ෂේත්‍රයට හිමිවනුයේ අඩු අවධානයකි. තවද මධ්‍යම බුද්ධි කාර්යාංශය විසින් මධ්‍යම සිද්ධි ලේඛනය CIU වෙත සම්බන්ධ කොට නොමැත. මෙම අඩුපාඩුවද සැලසුම අසාර්ථක වීමට හේතු වී ඇත. |
| 3. එම තොරතුරු<br>○ CHA ඒකකයට<br>○ බුද්ධි තොරතුරු අවශ්‍ය වෙනත් ඒකකයකට ලබාදිම සඳහා වූ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම | | | | | CHA හෝ වෙනත් අංශයක ඉල්ලීම අනුව තොරතුරු බෙදාහැරීම සිදු කෙරේ. CHA අවසරපත්‍රය වාර්ෂිකව අළුත් කිරීමේදී පෙර වැරදි දත්ත පද්ධතියේ වාර්තාවක් අවශ්‍ය වන අතර එම තොරතුරු පාලනය පහසු කිරීම සඳහා CIU ඒකකය තොරතුරු ලබා දෙයි. කෙසේ වෙතත් එම තොරතුරු ලබා දීම නවීන තාක්ෂණයට අනුව හා කාර්යක්ෂම ලෙස සිදුවිය යුතුය. |

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

## හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ අරමුණ වන්නේ පැය විසිහතර පුරාම නිරන්තරයෙන් දෙපාර්තමේන්තුව වෙත රේගු සටහන්කර පිළිබඳ කටයුතු කිරීමට හා අන්තර්ජාල සේවාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණ, සේවා හා පහසුකරණයන් ලබාදීමයි. රේගු සටහන්කර සම්බන්ධව කටයුතු කිරීමේ ක්‍රියාවලිය පූර්ණ වශයෙන් ස්වයංක්‍රීයකරණය කිරීමෙන් යහපත් රේගු පරිපාලනයක් සඳහා වේගවත්, ගුණාත්මක තොරතුරු පද්ධති ඵලදායී හා ප්‍රතිඵලදායී හා කාර්යක්ෂම ලෙස ලබා දීම සහතික කරයි. මෙම අංශය මේ වන විට වඩා ඵලදායී හා බිඳවැටීම් වලින් තොර තොරතුරු තාක්ෂණය පදනම් කරගත් පද්ධති ස්ථාපිත කිරීමටත්, රේගු සටහන්කර හා ඊට අදාළ සහාය ලියකියවිලි ඉලෙක්ට්‍රෝනිකව ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය කටයුතු කරමින් සිටියි.

## ප්‍රධාන කාර්යයන්

1. ස්වයංක්‍රීයකරණය තුළින් ආයතනික අරමුණු ඉටුකර ගැනීමට සහාය වීම.
2. පද්ධති ජාලය, පරිගණක හා දත්ත ගබඩා සාර්ථක ලෙස නඩත්තු කිරීම.
3. රේගු පාලනයට, අනෙකුත් රේගු අංශයන්ට, අනෙකුත් රජයේ ආයතනවලට හා සහායක ආයතන වලට අවශ්‍ය වේලාවට නිවැරදි තොරතුරු වාර්තා ලබාදීම.
4. ගෝලීය වැඩි දියුණු කිරීම්වලට සාරානුකූලව ඇගයීම් සිදු කිරීම හා පවත්නා පද්ධති යාවත්කාලීන කිරීම; "ආසිකුඩා" භාණ්ඩ පාලන පද්ධතිය, රථවාහන පාලන පද්ධතිය හා "තිනෙත්" (Thineth) පද්ධතිය
5. අධීක්ෂණ මෙහෙයුම් අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම අංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම සමඟ වෘත්තීය ගුණාත්මකභාවය වර්ධනය කිරීම.
6. 2013 වර්ෂයේදී දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම හා ඒවායේ මෙහෙයුම් වලට අදාළ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

| ප්‍රධාන කාර්යයන් | 2014.12.30 දිනට ප්‍රගතිය | විශේෂ සටහන් |
|---|---|---|
| 1. ආනයන පාලන බලපත්‍ර ASYCUDA පද්ධතියට සම්බන්ධ කිරීම | 50% | අවශ්‍ය මෘදුකාංග නිර්මාණය කොට ඇත. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය. |
| 2. e-නැව් බඩු ලේඛන සකස් කිරීම කාර්යක්ෂම කිරීම හා ඒවා CusDecS වෙත සම්බන්ධ කිරීම | 90% | අවසන් කිරීම සඳහා එ.ජා. විශේෂඥවරයාගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටී. |
| 3. භාණ්ඩ නිරීක්ෂණ නිලධාරීන්ගේ කාර්යසටහන් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම | 90% | පරීක්ෂණ අවසන්. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය. |
| 4. අනෙකුත් ආයතන සමග සන්නිවේදනය කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික් පණිවුඩ හුවමාරු ක්‍රමය ක්‍රියාත්මක කිරීම | 10% | සකස් කිරීමේ අදියරේ පවතී. |
| 5. ASYCUDA WORLD ස්වයංක්‍රිය වරණ ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කරීම | 75% | පරීක්ෂණ අවසන්. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය |

| | | |
|---|---|---|
| 6. ශ්‍රී.ලං.ප්‍රමිති කාර්යාංශය ASYCUDA WORLD පද්ධතියට සම්බන්ධ කිරීම | 50% | පරීක්ෂණ අවසන්. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය |
| 7. මෝටර් රථ අංශයේ රේගු සටහන්කර සඳහා CusDecs ලැබුනු විට, ගෙවීම් යාවත්කාලීන වූ විට, මාර්ගය තෝරා ගත් විට හා නිදහස් කරන විට ඒ පිළිබඳ කෙටි පණිවුඩ මගින් භාණ්ඩ ගෙන්වන්නන් / ප්‍රකාශකයින් දැනුවත් කිරීම. | 100% | අවසන් කොට ඇත. |
| 8. නිදහස් කරන ලද රේගු ප්‍රකාශන වල තොරතුරු ඉලෙක්ට්‍රොනික ලෙස ශ්‍රී.ලං.ව.අ. / CICT වෙත යැවීම | 100% | අවසන් කොට ඇත |
| 9. ASYCUDA WORLD හි EXIT NOTE ක්‍රියාවට නැංවීම | 30% | අවසන් කිරීම සඳහා එ.ජා. විශේෂඥවරයාගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටී. |
| 10. මධ්‍යම විමර්ශන අංශනය සඳහා නව අපනයන ක්‍රියාවලියක් හඳුන්වා දීම | 100% | අවසන් කොට ඇත. |
| 11. ASYCUDA WORLD දත්ත විගණනය තවදුරටත් සංවර්ධනය කිරිම | 50% | ක්‍රියාවලිය සිදු වෙමින් පවතී |
| 12. ASYCUDA WORLD සඳහා නැව් බඩු පාලන පද්ධතිය හඳුන්වා දීම | 80% | පරීක්ෂණ අවසන්. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය. අවසන් කිරීම සඳහා එ.ජා. විශේෂඥවරයාගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටී. |
| 13. පරීක්ෂණ අංශනයේ වැඩ කටයුතු පහසු කිරීම සඳහා ඊට ASYCUDA WORLD සැපයීම | 90% | පරීක්ෂණ අවසන්. ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය |
| 14. ASYCUDA WORLD අංග ලක්ෂණ පිළිබඳව ICT කාර්ය මණ්ඩලය / අනෙකුත් මෙහෙයුම් කාර්ය මණ්ඩල පුහුණු කිරීම | 90% | 10% ක් නිලධාරීන් පුහුණුව අපේක්ෂාවෙන් සිටී. |

# මධ්‍යම මිල පිරික්සුම් අංශය

## හැඳින්වීම

රේගු ආදායම සුරක්ෂිත කිරීම පිණිස රේගු ආඥාපනතේ "ඊ" උපලේඛනය යටතට ගැනෙන ආනයනික භාණ්ඩ වල මිල තීරණය කිරීමට අදාළ කටයුතු පිළිබඳ වගකීම මධ්‍යම මිල පිරික්සුම් අංශයට පැවරී ඇත.

## අරමුණු

- දෙපාර්තමේන්තු ඉලක්ක සඳහා දායක වන අතරම මිල පිරික්සුම් උපකරණ හා හැකියාවන් ගොඩනැගීම තුළින් කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වර්ධනය කිරීම.
- රාජ්‍ය .පෞද්ගලික හවුල වර්ධනය කිරීම -
- උසස්ම හැසිරීම් ක්‍රමවේදය හරහා මිල පිරික්සුම් තක්සේරු රීති සම්බන්ධව එකඟතා මට්ටම ඉහළ නැංවීම.

## ප්‍රධාන කාර්යයන්

- රේගු මිල පිරික්සුම් පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධව මිල පිරික්සුම් කමිටුවට සහයෝගය දීම.
- මිල පිරික්සුම් මෙවලම් වර්ධනය කිරීම (දත්ත සටහන් හා විටින් විට ලැබෙන අනතුරු ඇඟවීම් ඇතුළුව) සහ බලපෑම්වලට සරිලන ඉතා සුදුසු ක්‍රියාවන්හි යෙදීම හා මිල පිරික්සුම් නීතිය ඒකාකාරීව යොදා ගැනීම.
- භාණ්ඩවල නිරවද්‍යතාවය තක්සේරු කිරීම.
- මිල පිරික්සුම් ගැටළු නිරාකරණය සඳහා රාජ්‍ය, පෞද්ගලික හවුල වර්ධනය කිරීම සහ මිල පිරික්සුම් පර්යේෂණ සඳහා මහජනතාවට ආරාධනා කිරීම.
- මිල සංවේදී භාණ්ඩ සම්බන්ධව මිල ප්‍රවණතාව පර්යේෂණ කිරීම සහ උචිත තීරණ ගැනීම.
- මිල පිරික්සුම් මාර්ගෝපදේශය හා ක්‍රියාපටිපාටිය නියමාකාරයට යොදා ගැනීම සහ අනුගමනය කිරීම සනාථ කර ගැනීම සඳහා මිල පිරික්සුම් පරීක්ෂණය හා පර්යේෂණය කිරීම.
- අදාළ ජාත්‍යන්තර සංවිධාන සහ අනෙකුත් විදේශ සම්පත් සමඟ රේගු මිල පිරික්සුම් සම්බන්ධව සම්බන්ධතාවයන් ඇති කර ගැනීම.
- හුවමාරු මිල වෙනස්කම් සම්බන්ධව ඇති ගැටළු සඳහා අධ්‍යයනය කිරීම හා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| 1.1 මධ්‍යම මිල පිරික්සුම් කාර්ය මන්ඩලය විසින මුහුණ දෙනු ලබන මිල පිරික්සුම් ගැටළු VRU වෙත යොමු කිරීම (විශේෂයෙන් මිල පිරික්සුම් පිළිබඳ එකඟ නොවීම් පිලිබඳ ගැටළු) | දැනට පවතින සාමාන්‍ය ක්‍රමය ස්වයංක්‍රීයකරණය කිරීම | මෙතෙක් ඉටුව නොමැත. | මෙම කාර්යය ADGC (corp) යටතේ ඇති විශේෂ ඒකකයක් විසින් භාර ගෙන ඇත. |
| 1.2 එකඟ නොවන මිල පිරික්සුම් තක්සේරු ගැටළු මතුවූ අවස්ථාවලදී ඒ සඳහා VRU හි සහාය ලබාගැනීම පිළිබඳව සියළු තක්සේරු කාර්ය මණ්ඩල දැනුවත් කිරීම | DDC(V) / SC (VIU) විසින් එවන් ගැටළු VRU වෙත යොමු කිරීම | අපේක්ෂිත ඉලක්කයට ළඟා වී ඇත | |

| | | | |
|---|---|---|---|
| 1.3 මූලික සත්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීම හා වටිනාකම් සත්‍යාපනය කිරීම සඳහා අවශ්‍ය ලේඛන හඳුනාගැනීම. | නව අංගසම්පූර්ණ ආකෘතියක් නිර්මාණය කිරීම | මෙතෙක් ඉටු ව නොමැත | ඉහත 1.1 පරිදි |
| 1.4 වටිනාකම් සත්‍යාපනය යටතේ නිපැයුම්වල ද්‍රව්‍ය භාවිතය ඇගයීම සඳහා පෞද්ගලික අංශය හා රාජ්‍ය ආයතන සමග ඇති කරගත යුතු ජාල හඳුනාගැනීම හා ඒවා සකස් කිරීම | අදාල සියළු සංගම් හා එක්ව එක් ආකාර පද්ධතියක් පවත්වා ගෙන යාම | භාවිතා කරන ලද වාහන කොටස් ගෙන්වනන්ගේ සංගමය, Flexible Packaging සංගමය හා දැව ආනයනය කරන්නන්ගේ සංගමය සමග ඒකාත්මික බවක් ඇති කර ගන්නා ලදි. | |
| 1.5 භාණ්ඩ මුදල් කිරීමෙන් අතිරේක බදු අය කරගැනීමෙන් හෝ විමර්ෂණයන් සඳහා යොමු කිරීමෙන් සත්‍යාපන ක්‍රියාවලිය අවසන් කිරීම සඳහා වූ ක්‍රමවේදයක් සකස් කිරීම | ස්වයංක්‍රීය අශ්‍රේය මිල දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම | ඉටු ව නොමැත | ICT කාර්යාංශයේ සහාය ඇතිව ස්වයංක්‍රීයකරණය සිදු කිරීමට නියමිතය. |
| ප්‍රධාන ක්‍රියාකාරකම 2 : බෙහෙවින්ම අඩු මිලට ප්‍රකාශ කරන ලද භාණ්ඩ වල අවම අගය නිර්ණය කිරීම සඳහා වන පද්ධතියක් සකස් කිරීම හා පවත්වාගෙන යාම | | | |
| 2.1 බෙහෙවින්ම අඩු මිලට ප්‍රකාශ කරන ලද භාණ්ඩ හඳුනාගැනීම | අඩු මිල ප්‍රකාශ කිරීමට ලක් වූ අවදානම් සහගත ද්‍රව්‍ය හඳුනාගැනීම හා ඒවායේ HS සංකේත වාර්තා කිරීම | කාලීන වාර්තා සකස් කෙරෙමින් පවතී | |
| 2.2 නිෂ්පාදන ක්‍රියාවලිය හා ද්‍රව්‍ය වල සංයුතිය හඳුනා ගැනීම | විවිධ අදියරයන්හි නිෂ්පාදන වල අගය වෙන් කොට හඳුනාගැනීම උදා: ප්‍රාථමික අර්ධ නිමි, නිමි ආදී | දැව, නම්‍යශීලි ඇසුරුම්, වීදුරු භාණ්ඩ හා ඩයපර්ස් නිෂ්පාදන ක්‍රියාවලිය අධ්‍යයනය කරන ලදී. | |
| 2.3 පර්යේෂණ ආයතන හා පර්යේෂණාගාර, කාර්මික තාක්ෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය ආදී ආයතන වෙත සිදු කළ යුතු ගෙවීම් සඳහා ගිණුම් අංශයේ අයවැය අනුමැතිය ලබාගැනීම | අදාල ආයතන වෙතින් හැකිතාක් ඉක්මනින් පර්යේෂණ වාර්තා/ විශ්ලේෂණ වාර්තා ලබා ගැනීම | දරන ලද වියදම් භාණ්ඩ ගෙන්වන්නන් විසින් ප්‍රතිපූර්ණය කිරීම | |

| | | | |
|---|---|---|---|
| 2.4 අමුද්‍රව්‍ය වල මිල මත පදනම්ව අවම අගය ගණනය කිරීම හා හඳුනාගැනීම | අමුද්‍රව්‍ය මිල මත පදනම්ව අවම අශ්‍රේය මිල ස්ථාපිත කිරීම | දැනට ඇති අවම අශ්‍රේය මිල සාමාන්‍ය පරිදි සකස් කොට ඇත. | ICT කාර්යාංශයේ සහාය මත ස්වයංක්‍රිය අගය පදනමක් නිර්මාණය කිරීම |
| 2.5 ගණනය කරන ලද අවම මිල ADGC/DC වෙත වාර්තා කිරීම | වඩාත්ම යාවත්කාලීන කරන ලද අවම අශ්‍රේය මිල පදනම සකස් කොට ඇත. | වාර්තා සීමාසහිත සංඛ්‍යාවක් පමණක් අවසන් කොට ඇත. | VRU හි සම්පත් ප්‍රමාණවත් නොවීම |
| ප්‍රධාන ක්‍රියාකාරකම 3 : RMU විසින් යෝජනා කරන ලද දත්ත පද්ධතිය සකස් කිරිමට සහාය වීම | | | |
| 3.1 ඉහළ වරණීය තීරු බදු අනුපාතය සහිත භාණ්ඩ හඳුනාගැනීම | ඉහළ බදු අනුපාතයන්ට යටත් වන භාණ්ඩවල මිල අධීක්ෂණය කිරීම | HS සංකේත ලේඛන කාලීනව RMU වෙත යොමු කෙරේ | |
| 3.2 ඉහළ බදු අනුපාතයන් අදාල වන භාණ්ඩ ප්‍රමාණයන් තෝරාගැනීම | ඉහල බදු අනුපාතයන්ට යටත් වන භාණ්ඩ ප්‍රමාණයන්ගෙන් අපේක්ෂිත ආදායම ලැබෙන බව තහවුරු කිරීම | ඉටු වී නොමැත | තාක්ෂණික පහසුකම් ප්‍රමාණවත් නොවීම |
| 3.3 දේශීය නිෂ්පාදන කර්මාන්තයන්ට අවශ්‍ය මිල සංවේදී භාණ්ඩ හඳුනාගැනීම | දේශීය නිෂ්පාදන කර්මාන්තයන්ට බලපෑමක් විය හැකි බෙහෙවින්ම අඩු මිලට ප්‍රකාශ කරන ලද භාණ්ඩ ආනයනය වැලැක්වීම | අගයන් අධීක්ෂණය කිරීම සඳහා දේශීය නිෂ්පාදකයන් වෙතින් තොරතුරු ලබා ගැණින | |
| 3.4 යෝජිත මිල දත්ත පද්ධතියට එක් කළ යුතු මිල අගය සංවේදී භාණ්ඩ නිර්ණය කිරීම | උක්ත පද්ධතිය නිර්මාණය කිරීම හා ස්වයංක්‍රීයකරණය කිරීම හා HS සංකේත ඇතුලත් කිරීම | අර්ධ වශයෙන් ඉටු කොට ඇත | දත්ත පද්ධතිය නිර්මාණය කිරීම සඳහා ICT හි සහාය ලබා ගත යුතු වේ |

| මාසය | ලැබුණු මුළු සටහන්කර සංඛ්‍යාව | වටිනාකම සංශෝධනය කළ සටහන්කර සංඛ්‍යාව | මිල පිළිගත් මුළු සටහන්කර සංඛ්‍යාව | මිල ගැලපුම්වල ප්‍රතිශතය | අමතර සටහන්කර මගින් අයකරගත් මුදල |
|---|---|---|---|---|---|
| ජනවාරි | 2550 | 695 | 1855 | 27% | 57,224,493.00 |
| පෙබරවාරි | 2202 | 673 | 1529 | 31% | 66,208,615.00 |
| මාර්තු | 2267 | 679 | 1588 | 30% | 65,694,110.00 |
| අප්‍රේල් | 2153 | 737 | 1416 | 34% | 61,577,199.00 |
| මැයි | 2087 | 607 | 1480 | 29% | 43,792,269.00 |
| ජූනි | 2244 | 649 | 1595 | 29% | 50,771,482.00 |
| ජූලි | 2300 | 807 | 1493 | 35% | 65,188,511.00 |
| අගෝස්තු | 2114 | 725 | 1389 | 34% | 54,970,957.00 |
| සැප්තැම්බර් | 2020 | 752 | 1268 | 37% | 60,165,713.00 |
| ඔක්තෝබර් | 2104 | 885 | 1219 | 42% | 73,967,692.00 |
| නොවැම්බර් | 2093 | 824 | 1269 | 39% | 71,542,811.00 |
| දෙසැම්බර් | 2223 | 1036 | 1187 | 47% | 93,500,943.00 |
| එකතුව | **26357** | **9069** | **17288** | **34.5%** | **764,604,795.00** |

| කාර්යසාධන සැසඳීම 2013 - 2014 | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාසය | යොමු කරනු ලැබූ සටහන්කර සංඛ්‍යාව | | වටිනාකම සංශෝධනය කළ සටහන්කර සංඛ්‍යාව | | මිල පිළිගත් මුළු සටහන්කර සංඛ්‍යාව | | මිල සංශෝධනයන්ගේ ප්‍රතිශතය | | අමතර සටහන්කර මගින් අයකර ගත් මුදල | |
| | **2013** | **2014** | **2013** | **2014** | **2013** | **2014** | **2013** | **2014** | **2013** | **2014** |
| ජනවාරි | 1813 | 2550 | 710 | 695 | 1103 | 1855 | 39.16% | 27% | 88,349,166.13 | 57,224,493.00 |
| පෙබරවාරි | 2040 | 2202 | 695 | 673 | 1345 | 1529 | 34.07% | 31% | 83,073,149.00 | 66,208,615.00 |
| මාර්තු | 2095 | 2267 | 555 | 679 | 1540 | 1588 | 26.49% | 30% | 54,449,123.00 | 65,694,110.00 |
| අප්‍රේල් | 3428 | 2153 | 853 | 737 | 2575 | 1416 | 24.88% | 34% | 86,986,255.00 | 61,577,199.00 |
| මැයි | 2945 | 2087 | 885 | 607 | 2060 | 1480 | 30.05% | 29% | 106,700,905.00 | 43,792,269.00 |
| ජූනි | 2670 | 2244 | 880 | 649 | 1790 | 1595 | 32.96% | 29% | 102,043,682.00 | 50,771,482.00 |
| ජූලි | 3246 | 2300 | 1152 | 807 | 2094 | 1493 | 35.49% | 35% | 132,629,674.00 | 65,188,511.00 |
| අගෝස්තු | 2530 | 2114 | 849 | 725 | 1681 | 1389 | 33.56% | 34% | 85,934,802.00 | 54,970,957.00 |
| සැප්තැම්බර් | 1875 | 2020 | 611 | 752 | 1264 | 1268 | 32.59% | 37% | 60,193,196.00 | 60,165,713.00 |
| ඔක්තෝබර් | 2108 | 2104 | 799 | 885 | 1309 | 1219 | 37.90% | 42% | 79,584,685.00 | 73,967,692.00 |
| නොවැම්බර් | 4058 | 2093 | 1046 | 824 | 3012 | 1269 | 25.78% | 39% | 108,686,473.00 | 71,542,811.00 |
| දෙසැම්බර් | 3290 | 2223 | 878 | 1036 | 2412 | 1187 | 26.69% | 47% | 76,124,888.00 | 93,500,943.00 |
| එකතුව | **32098** | **26357** | **9913** | **9069** | **22185** | **17288** | **31.64%** | **34.50%** | **1,064,755,998.13** | **764,604,795.00** |

| | 2013 | 2014 |
|---|---|---|
| දිගු කාමරයේ සිදු කරනු ලැබූ මුළු රේගු සටහන්කර සංඛ්‍යාව | 174556 | 185933 |
| මධ්‍යම තක්සේරු අංශයට යොමුකරන ලද රේගු සටහන්කර ප්‍රතිශතය. | 18% | 14% |

## වර්ෂයේ 2014මිල පිරික්සුම් විමර්ශණ (Investigation) අංශයේ කාර්ය සාධනය.

| | | |
|---|---|---|
| 1 | 2014 ජනවාරි සිට 2014.12.31 දක්වා ලියාපදිංචි වූ (Cases) සිද්ධි සංඛ්‍යාව | 95 |
| 2 | අවසන් වූ සිද්ධි සංඛ්‍යාව. | 85 |
| 3 | වැරදි ලෙස තහවුරු කළ සහ රාජසන්තක කළ / දඩ ගැසූ කාරණ සංඛ්‍යාව. | 48 |
| 4 | සාර්ථක වූ (effect) සිද්ධි ප්‍රතිශතය. | 56% |
| 5 | 2014 ජනවාරි 1 සිට 2014.12.31 දක්වා අය කර ගන්නා ලද මුළු දඩ හා රාජසන්තක කළ සංඛ්‍යාව (රු.) | 252,961,343.04 |
| 6 | රාජසන්තක කළ භාණ්ඩවල මුළු වටිනාකම | නැත |
| 7 | 2014.01.01 සිට 2014.12.31 දක්වා සම්පූර්ණ නොකරන ලද සිද්ධිවල මුළු සංඛ්යාව. | 10 |

## මිල පිරික්සුම් විමර්ශණ ඒකකයේ කාර්ය සාධන සැසඳීම 2013 - 2014

| | | 2013 | 2014 |
|---|---|---|---|
| 1 | ලියාපදිංචි වූ (Cases) කාරණ සංඛ්‍යාව | 95 | 72 |
| 2 | අවසන් වූ කාරණ සංඛ්‍යාව. | 85 | 47 |
| 3 | වැරදි ලෙස තීරණය වූ සහ රාජසන්තක කළ / දඩ ගැසූ කාරණ සංඛ්‍යාව. | 48 | 35 |
| 4 | ඉටු කරන ලද මුළු දඩ රාජසන්තක කළ සංඛ්‍යාව (රු.) | 252,961,343.04 | 206,451,478.00 |
| 5 | සම්පූර්ණ නොකරන ලද කරුණුවල මුළු සංඛ්‍යාව. | 10 | 25 |

RMU - අවදානම් කළමනාකරණ ඒකකය

VIU - මිල පිරික්සුම් විමර්ශන ඒකකය

VRU - මිල පිරික්සුම් පර්යේෂණ ඒකකය

# විශේෂ සේවා අංශය

## හැඳින්වීම

විශේෂ සේවා අංශය මගින් රේගු දෙපාර්තමේන්තුවට සහ රේගු සේවය ලබා ගන්නා අනෙකුත් ආයතන සහා විවිධ සේවාවන් සපයයි. ඒ අතර ආනයන/අපනයන භාණ්ඩ වර්ගීකරණය ආනයන/අපනයන රසායන ද්‍රව්‍ය විශ්ලේෂණය කැණික් හා ස්වර්ණාභරණ තක්සේරුකරනය, රේගු නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරිම,ආනයන අපනයන රේගු ප්‍රකාශන ක්‍රියාකරවීම පහසු කිරිම සඳහා මෙම අසිකුඩා ක්‍රමයෙන් ආනයන/අපනයනකරුවන් ලියාපදිංචි කිරීම වැනි සේවාවන් සපයනු ලබයි.

## ප්‍රධාන කාර්යයන්

1. භාණ්ඩ වර්ගීකරණය
2. මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරන හඳුනාගැනීම, වර්ගීකරණය හා වටිනාකම තක්සේකරු කිරීම.
3. රේගු නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරිම.
4. ආනයන/අපනයන කරුවන් ලියාපදිංචි කිරීම.

රේගු දෙපාර්තමේන්තුවේ සහය සේවා පර්ෂදය යටතේ ඇති විශේෂ සේවා අංශයේ විවිධ ඒකකයන් පවතී.

## භාණ්ඩ වර්ගීකරණ අංශය

ආනයන/අපනයන භාණ්ඩ සඳහා වඩාත් සුදුසු වන සංයෝජිත වර්ගීකරණ කේත ක්‍රම ( HS) තීරණය කිරීම මෙම අංශයේ වගකීමවේ.රේගු ප්‍රකාශන ක්‍රියාකාරි ඒකකය හෝ බඩු පරික්ෂා කිරීමේ ඒකකය විසින් එක් භාණ්ඩයකට වර්ගීකරණ කේත අංක ( HS) තීරණය කිරීමේදී ගැටලුවක් මතුවුවහොත් එය මෙම අංශය වෙත යොමු කරනු ඇත. 2014 වසරේ මෙම ඒකකය වෙත දෙපාර්තමේන්තුවේ විවිධ අංශයන් විසින් භාණ්ඩ වර්ගීකරණය සම්බන්ධ ගැටලු 920 ක් ලැබුනු අතර එයින් 912ක් විසඳා ගත හැකිවිය.

වෙළඳාම පහසු කරන මිනුමක් ආකාරයට මෙම අංශය ආනයන/අපනයන කළ යුතුව ඇති භාණ්ඩවලට වර්ගීකරණය ඉදිරි තීරණ නිකුත් කරනු ඇත. ආනයන අපනයන කරුවන් රේගු වෙබ් අඩවියේ ඇති ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කර ඉදිරපත් කිරීමේදී මෙම තීරණය ගත යුතුව ඇත.

2014 වසරේ මෙ අංශයට ඉල්ලුම් පත්‍ර 627ක් ලැබුනු අතර එයින් 514ක් සඳහා තීරණය දෙන ලදී.

## රේගු විද්‍යාගාර අංශය

ආනයන හා අපනයන කරන රසායනික ද්‍රව්‍ය හා ඊට සමාන ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා රේගුවට හා පාර්ශවකරුවන්ට සහායවීමට මෙම අංශය පිහිටුවන ලදී. ආනයනික හා අපනයනික රසායන ද්‍රව්‍ය හා ඒ සම්බන්ධ භාණ්ඩවල හඳුනාගැනීම පිළිබඳ සැකයක් මතුවූ අවස්ථාවලදී ඒවා පරීක්ෂා කිරිම සඳහා ඒවායේ නියැදි රේගු විද්‍යාගාරය වෙත යවනු ලැබේ. එවැනි ද්‍රව්‍යවල වර්ගීකරණය පිළිබඳව මතභේද මතු වූ අවස්ථාවලදී ද එම බඩු හා ලිපිලේඛන මෙම අංශය වෙත යොමු කරයි.

කාර්මික ඒකකයක්ආකාරයට මෙම අංශය විවිධ සම්මේලනයන්සහා එළිදක්වන රීතීන් ක්‍රියාත්මක කිරීමේදී එයට අදාල රේගු සේවය ලබාගන්නා අය සමග සම්බන්ධතාවය ඇති කර ගත යුතුයි.

මෙම වසරේ රේගු ප්‍රකාශන 228ක්, වර්ගීකරණ ඉදිරි තීරණ ගොනු 129 ක් සහ සාම්පලයන් 242 මෙම අංශයට ලැබුන අතර එම සියලු කටයුතු අවසන් කර ඇත.වර්ගීකරණය කළ නොහැකි භාණ්ඩ ,

භාණ්ඩ වර්ගීකරණ අංශයට යොමු කරනු ලබයි. භාණ්ඩ වර්ගීකරණ අංශය මෙම වසරේ වෙනස් හා වැරදි වර්ගීකරණයන් 55ක් සොයා ගන්නා ලදී.

## මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරන

මැණික් හා ස්වර්ණාභරන ක්ෂේත්‍රයේ ප්‍රවීනත්වයක් ලැබූ නිලධාරීන් විසින් මැණික්, වටිනා ලෝහ හා ස්වර්ණාභරන යනාදිය ආනයන/අපනයන ලේඛන සකස් කිරීම මෙම අංශයේ වගකීමයි . මේවා තක්සේරු කිරිම ජාතික මැණික් හා ස්වර්ණාභරන අධිකාරියේ නිලධාරීන් හා සමගාමීව මෙම අංශය විසින් සිදු කරනු ලබයි.
2014 වසරේ ආනයන රේගු ප්‍රකාශන 4,932 අපනයන රේගු ප්‍රකාශන 7,154 අනුමත කර ඇති අතර වරාය හා ගුවන් බදු රුපියල් 28,617 ක් ,ජාතික ගොඩනැගීම් බදු රුපියල් 770,419 , පරීක්ෂණ ගාස්තු රුපියල් 7,101,100 සහා සේවා ගාස්තු US ඩොලර් 295,800අයකර ගත් අතර එයට අමතරව වටිනා භාණ්ඩ ආනයන සම්බන්ධ බදු හා අනෙකුත් බදු හැටියට කර්මාන්ත හා සේවා අංශය විසින් රුපියල් 168,474,189/- අය කර ගෙන ඇත.

### 2014 වර්ෂයේ කාර්යසාධනය

#### ආනයන වටිනාකම 2014

| | | |
|---|---|---|
| දියමන්ති | රු. | 28,663,052,458 |
| ස්වර්ණාභරන | රු. | 1,276,028,158 |
| මැණික් | රු. | 4,075,814,078 |
| රත්‍රන් | රු. | 1,562,099,395 |
| රිදී | රු. | 148,715,063 |
| වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය | රු. | 125,451,533 |
| ප්‍රති ආනයන | රු. | 4,517,818,801 |
| එකතුව | රු. | 40,368,979,486 |

### අපනයන වටිනාකම 2014

| | | |
|---|---|---|
| මැණික් | රු. | 21,552,286,696 |
| දියමන්ති | රු. | 25,451,149,160 |
| දියමන්ති ස්වර්ණාභරන | රු. | 255,254,070 |
| අනෙකුත් ස්වර්ණාභරන | රු. | 2,439,439,497 |
| ගෙවුඩ හා ඛණිජ ද්‍රව්‍ය | රු. | 169,760,116 |
| රත්‍රන් ප්‍රති අපනයන | රු. | 3,483,225,661 |
| එකතුව | රු. | 53,351,115,200 |

### වාප්පු නියෝජිත අංශය

වාප්පු නියෝජිතයන්ගේ බලපත්‍ර නිකුත් කිරීම මෙම ඒකකයේ කාර්යය වේ. රේගු ආඥා පනතේ 115 (1) ඡේදයට අනුව වාප්පු නියෝජිතයින් එයට අදාල සියලු ලිපි ලේඛන සම්පූර්ණ කර ඇත්නම් වාප්පු නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ බලය රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරි ඇත.රේගු බලපත්‍ර හිමි වාප්පු නියෝජිතයන් සඳහා පමණක් භාණ්ඩ සම්බන්ධ ගණුදෙනුවලට අදාලව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම වරායකට හෝස්ථානයකට භාණ්ඩ හෝ මගී බඩු ආනයන හා අපනයන නිෂ්කාශනය සම්බන්ධයෙන් මොවුන් ඉදිරිපත් වේ. බලපත්‍ර වලංගු වන්නේ එක් අවුරුදු කාල සීමාවකට වන අතර අවුරුද්ද අවසානයේ මෙම බලපත්‍රය අලුත් කලයුතුවේ.

2014 වසරේ නිකුත් කල බලපත්‍ර සම්බන්ධව තොරතුරු පහත දැක්වේ.

**2014 වර්ෂයේ කාර්ය සාධනය**

| | |
|---|---|
| නව ලියාපදිංචි වාප්පු නියෝජිතයන් | 103 |
| නව ලියාපදිංචි වාප්පු සහකාර | 166 |
| අලුත් කිරීම් කල වාප්පු නියෝජිතයන් | 1449 |
| අලුත් කිරීම් කල වාප්පු සහකාර | 4730 |
| අවලංගු කල වාප්පු නියෝජිතයන් | 11 |
| අවලංගු කල වාප්පු සහකාර | 279 |
| තාවකාලික වාප්පු සහකාර | 364 |

## TIN/VAT ලියාපදිංචි කිරීමේ අංශය

රේගු ආඥාපනත 115අ වන වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි ආනයනකරුවකු හෝ අපනයකරුවකු නොවන කිසිවකු විසින් කිසිඳු භාණ්ඩයක් ලංකාවට ආනයනය/අපනයන නොකළ යුතුයි. ඔවුන් ලියාපදිංචි කිරීමේ දී වෙබ් අඩවියේ ඇති අන්දමට ඉල්ලුම් පත්‍රවල ඇති විස්තරවලට අදාලව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර ආනයනකරුවන් හා අපනයනකරුවන් විසින් ඉදිරිපත් කල යුතුය.

2014 වසරේ නව ආනයන හා අපනයනකරුවන් සමාගම් 2975ක් ලියාපදිංචි වී ඇති අතර බදු නිදහස් බලපත්‍රය යටතේ මෝටර් රථ ආනයනය කිරීමට ආනයනකරුවන් හැටියට 5866ක් පෞද්ගලිකව ලියාපදිංචි කර ඇත. මෙයට අමතරව රථ වාහන නිදහස් කිරීමේ ආනයනකරුවන් සහ පෞද්ගලික නම්වලින් විවිධ භාණ්ඩ ආනයනයකිරිම සදහා 5192ක් පෞද්ගලිකව ලියාපදිංචි විඇත.

## 2014 ක්‍රියාකාරී සැලසුමෙහි දක්වා ඇති කාර්යසාධනය සැසඳීම

### ප්‍රධාන ක්‍රියාකාරකම් 18 : 01

**කාණ්ඩකරණ නියමයන් නිකුත් කිරීම නියාමනය කිරීම**

මෙම කරුණ අධ්‍යක්ෂ (නීති) සමග සාකච්ඡා කරන ලද අතර රේගු ආඥාපනත සංශෝධනය කිරීම කළ නොහැකි බවත් ගැසට් නිවේදනයේ පූර්විකාවේ ආදායම් ආරක්ෂණ නියෝගය ඇතුලත් කරන ලෙසත් හෙතෙම දැනුම් දුනි. ගැසට් නිවේදනයේ පූර්විකාවෙහි ආදායම් ආරක්ෂණ නියෝගය ඇතුලත් කිරීමට නම් එය නාමකරණ කමිටුව විසින් අනුමත කළ යුතු වේ. අනතුරුව එම කරුණ නාමකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ අතර මෙ සම්බන්ධයෙන් බලතල රේගු ආඥාපනතේ 2 වන වගන්තිය මගින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත පවරා ඇති බැවින් ආඥාපනත සංශෝධනය කිරීම හෝ ගැසට් නිවේදනයක් නිකුත් කිරීම අවශ්‍ය නොවන බව අදාල කමිටුව විසින් පෙන්වා දුන් අතර නාමකරණ කමිටුවේ මතය සැලකිල්ලට ගනිමින් ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් නොගන්නා ලදී.

### ප්‍රධාන ක්‍රියාකාරකම් 12 : 02

තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ අංශය සමග සාකච්ඡා කල අතර ඔවුන් සමග එකග වු පරිදි මෙම අංශයට තොරතුරු ලබා ගෙන ඇති අතර තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ අංශය මෙය ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තුවේ.

# මානව සම්පත් පරිෂදය

# මානව සම්පත් කළමනාකරණ අංශය

## හැඳින්වීම

මානව සම්පත් කළමනාකරණ අංශය දෙපාර්තමේන්තුවේ මානව ප්‍රාග්ධනයේ ආයෝජන වෙනුවෙන් උපරිම ප්‍රතිඵල ළඟා කර ගැනීමට අපේක්ෂා කරන අතර මූල්‍ය අවදානම අඩු කර ගැනීමටද කටයුතු කරයි. මෙම අංශය මෙකී අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරන්නේ නිපුණතාවයෙන් යුත් හා සුදුසුකම් සපුරා ලූ පුද්ගලයන් එක්කර ගැනීම හා දැනට සිටින ශ්‍රම බලකායේ හැකියාවන් දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික සැලැස්ම සහ ආයෝජනයට අනුරූපීව ලැබෙන ප්‍රතිඵල උපරිම කිරීම හා අනාගත පැවැත්ම හා සාර්ථකත්වය යන කරුණු සමඟ එකට ගැලපීම තුළිනි. එම අරමුණු ඉටු කර ගැනිම සහතික කිරීම පිණිස මානව සම්පත් කළමනාකරණ අංශය, සේවාදායක අභිප්‍රේරණය, කැපවීම හා ඵලදායිතාවය හැකිතාක් උපරිම ආකාරයට වර්ධනය කිරීම සඳහා රජයේ කම්කරු නීති හා රෙගුලාසි, සදාචාර සම්පන්න ව්‍යාපාර විධි සහ දළ වියදම, සැලකිල්ලට ගනිමින් අවශ්‍යතා ප්‍රයෝජනයට ගනී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට පහත මට්ටම් වන මාණ්ඩලික හා මාණ්ඩලික නොවන මට්ටම්වල මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කරුණු සම්බන්ධව අවසාන අධිකාරි බලය හිමි ආයතනයයි.

මෙම හේතුව මානව සම්පත් කළමනාකරණ අංශය, වරින් වර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන බඳවා ගැනීම්, උසස් කිරීම්, කාර්ය සාධන කළමනාකරණය ආදිය මෙන්ම ආයතන සංග්‍රහය, රේගු ආඥාපනත හා මුදල් රෙගුලාසි ආදිය සම්බන්ධ වලට අනුගතව කටයුතු කරයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත මාණ්ඩලික නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ II වන කොටසේ දෙවන උපලේඛණයේ සඳහන් වැරදි සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට සහ ස්ථාන මාරුකිරීමටත් බලය පවරා ඇති අතර අනෙක් සියලු නිලධාරීන්ගේ සියලුම විනය හා ස්ථාන මාරු සම්බන්ධව බලය පවරා ඇත. (රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතියට යටත්ව)

එසේම රාජ්‍ය සේවයේ පවත්නා රෙගුලාසි වලට අනුගත වන වෙමින් කාර්ය සාධන ආකෘති හා උසස් කිරීමේ නිර්ණායක ද ඇතුළුව මානව සම්පත් කළමනාකරණ සැලසුම, රේගු දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අවශ්‍යතා සඳහා සරිලන ආකාරයට සකස් කර ගැනීමට රේගු දෙපාර්තමේන්තුවට නිදහස ඇත.

## ප්‍රධාන කාර්යයන්

**දෙපාර්තමේන්තුවේ දැක්ම ළඟා කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය ඉතා වැදගත් කාර්යයක් ඉටු කරයි;**

1. බඳවාගැනීම්, තෝරා ගැනීම් හා සම්පත් භාවිතා කිරීම.
2. සේවක වාර්තා තබා ගැනිම හා රහස්‍යභාවය.
3. ආයතනික සැලසුම් හා සංවර්ධනය .
4. ප්‍රතිව්‍යුහගතකරණය හා වෙනස්වීම් කළමනාකරණය,
5. කාර්ය සාධනය, හැසිරීම හා චර්යා කළමනාකරණය.
6. පාරිභෝගික හා සේවක සම්බන්ධතා.
7. මානව සම්පත්, (මිනිස්බල) විග්‍රහය හා මිනිස්බල පෞද්ගලික දත්ත කළමනාකරණය.
8. වන්දි ගෙවීම හා සේවක ප්‍රතිදාන කළමනාකරණය.
9. සේවක අභිප්‍රේරණ හා ධෛර්යය ගොඩනැගීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම් | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| 2013 කාර්යසාධන ඇගයීම් සම්පූර්ණ කිරීම<br>1. මධ්‍යකාලීන හා අවසන් ඇගයීම් සම්පූර්ණ කිරීම. | 1 වන කාර්තුවේදී අවසන් කිරීම | 1 වන කාර්තුවේදී අවසන් විය | |
| මානව සම්පත් සැලසුම සකස් කිරීම | | | |
| 1. මානව සම්පත් අවශ්‍යතා විශ්ලේෂණය සිදු කිරීම | 1 වන කාර්තුවේදී අවසන් කිරීම | 1 වන කාර්තුවේදී අවසන් විය | |
| 2. මානව සම්පත් සැලසුම සකස් කිරීම | 1 වන හා 2 වන කාර්තුවලදී අවසන් කිරීම | සැලසුම් කළ පරිදි අවසන් විය. | |
| 3. මානව සම්පත් තොරතුරු දත්ත පද්ධතිය සකස් කිරීම හා පවත්වාගෙන යාම | වසර පුරාම | සැලසුම් කළ පරිදි සම්පූර්ණ කරන ලදී | |
| 2014 කාර්යසාධන ඇගයීම් සම්පූර්ණ කිරීම | | | |
| 1. මධ්‍ය කාලීන ඇගයීම සම්පූරණ කිරීම | 3 වන කාර්තුවේදී අවසන් කිරීම | 3 වන කාර්තුවේදි අවසන් විය | |
| සහකාර රේගු අධිකාරිවරුන් 269 දෙනෙකු, රේගු පරීක්ෂකවරුන් 137 දෙනෙකු හා රේගු ආරක්ෂකයින් 100 දෙනෙකු බඳවා ගැනීම | | | |
| 1. ස.රේ.අ., රේ.ප. හා රේ.අ. බඳවා ගැනීම සඳහා ගැසට් නිවේදනයක් මගින් විවෘත පරීක්ෂණයක් සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවීම | 1 වන කාර්තුවේදි අවසන් කිරීම | 2 වන කාර්තුවේදි අවසන් විය | අයදුම්පත්‍ර කැඳවීමේ ගැසට් නිවේදනයේ සංශෝධන සිදු කිරීම |
| 2. රේ.ප. බඳවා ගැනීම සඳහා සීමිත පරීක්ෂණයට අයදුම්පත්‍ර කැඳවීම | 2 වන කාර්තුවේදී අවසන් කිරීම | 3 වන කාර්තුවේදි අවසන් විය. | |
| 3. පරීක්ෂණය පැවැත්වීම | 2 වන කාර්තුවේදී අවසන් කිරීම | 4 වන කාර්තුවේදී අවසන් විය | අයදුම්පත්‍ර කැඳවීමේ ප්‍රමාදය හේතුවෙන් |
| 4. ස.රේ.අ. 11 ශ්‍රේණිය සඳහා 269 දෙනෙකු හා රේ.ප. 11 ශ්‍රේණිය සඳහා 137 දෙනෙකු බඳවා ගැනිම | 3 හා 4 වන කාර්තුවලදි අවසන කිරීම | තවම බඳවාගෙන නොමැත | පරීක්ෂණ පැවැත්වීමේ ප්‍රමාදය හේතුවෙනි |
| උසස්වීම් නියමානුකූල කිරීම | | | |
| 1. උසස් වීම් ලේඛනයක් සකස් කිරීම හා පවත්වා ගෙන යාම | වසර පුරාම | සැලසුම් කළ පරිදි අවසන් විය | |
| 2. අදාල උසස්වීම් මට්ටම සැලකිල්ලට ගනිමින් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා රා.සේ.කො. සභාව වෙත නිර්දේශ කිරිම | වසර පුරාම | සැලසුම් කළ පරිදි අවසන් විය. | |

# මානව සම්පත් සංවර්ධන අංශය

## මානව සම්පත් සංවර්ධන අංශය - හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුවේ ඉලක්ක හා අරමුණු කරා ළඟාවීමට සේවකයින්ගේ දැනුමආකල්ප හා , කුසලතා වර්ධනය කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම මෙම අංශයෙන් සිදු කරනු ලැබේ.

### මෙහෙවර

දෙපාර්තමේන්තුවට උපරිම ඵලදායීතාවයක් ලැබෙන අයුරින් අප සතුව ඇති මානවසම්පත්වල හැකියාවන් වැඩි දියුණු කිරීම.

මෙම අංශය විසින් ප්‍රධාන වශයෙන් දෙපාර්තමේන්තු සේවකයන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වනු ඇත. මෙය දේශීය හා විදේශීය පුහුණුව වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක. අන්තර්ජාතික තලයේ රේගු ක්‍රියාකාරකම් පිළිබඳව විදේශ ශිෂ්‍යත්ව විදේශ පහසුකම් යටතේ මූලික වශයෙන් ඉලක්ක කර ඇත. දේශීය පුහුණුව, නිපුණතා සංවර්ධනය හා කුසලතා සහ උරුම කරගත් හැකියාවන් හඳුනා ගැනීම මූලික කරගත් අදාළ ක්ෂේත්‍රෙය් දැනුම හා දැනුවත්භාවය වැඩිදියුණු කිරීම ඉලක්ක කර ඇත. නව ඇරඹුමක් ආකාරයෙන් මෙම අංශය ප්‍රායෝගික පුහුණු අභ්‍යාස සහිත කායිකව ඉවසීමේ වැඩසටහන් වන නිරායුධ සටන් ක්‍රම හඳුන්වා දෙනලදි. තවද, මෙම ප්‍රායෝගික පුහුණුව මගින් නිලධාරීන්ගේ ස්ව හැසිරීම හා කායික ශුභසාධනය වර්ධනය කරනු ලබයි. මෙම අංශය වෙළඳ හා එකඟතාවයකට පැමිණීම සම්බන්ධව තෙමාක් ෆවුන්ඩේසන් මධ්‍යස්ථානයේ සහයෝගීත්වයෙන් හා ලෝක රේගු සංවිධානයේ උපකාරයෙන් අවදානම් කළමනාකරණය හා වෙළඳ පහසුකම් සම්බන්ධ දේශීය පුහුණු පාඨමාලා දෙකක් සාර්ථකව සංවිධානය කර ඇත. මෙහි කාර්යයන්ට අමතරව දෙපාර්තමේන්තුවට සම්බන්ධ අයගේ කරුණු සම්බන්ධව පුහුණු හා ධාරිතාව වර්ධනය කිරීම මෙම අංශයේ වගකීම වේ. මෙම අංශයේ ප්‍රධාන කාර්යය වශයෙන් පුහුණු ප්‍රතිපත්ති ක්‍රමය සහ ක්‍රියා පරිපාටිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම හැඳින්විය හැක.

### <u>ප්‍රධාන කාර්යයන්</u>

- දෙපාර්තමේන්තුවේ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම, ඒවා ප්‍රමුඛතාව අනුව පෙළ ගැස්වීම, පුහුණු සැළසුම් හා ක්‍රියා පටිපාටි සකස් කිරීම හා එය ක්‍රියාත්මක කිරීම.
- විෂය මාලාවන් සංවර්ධනය කිරීම, පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩ මුළු වර්ධනය කිරීම හා මෙහෙය වීම.
- පුහුණු පාඨමාලා අධීක්ෂණය හා ඇගයුම් කිරීම.
- රේගු කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම හා ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා පෙළඹවීම
- රේගු කටයුතු හා ඒ සම්බන්ධ කරුණු පිළිබඳව කටයුතු කරන අයට අවශ්‍ය පුහුණුව දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ලබාදීම.
- රේගු කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල පහසුකම් සැපයීම.
- පුහුණු අවස්ථාවන් පිළිබඳ ලිපි හුවමාරු කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා පොලිස් සේවය, නාවික හමුදාව, යුධ හමුදාව වැනි බාහිර ආයතනයන් සඳහා ඉල්ලීම් පරිදි අවශ්‍ය පුහුණුවීම් කිරීම.
- වාජ්පු නියෝජිතයින් සඳහා සහතික පත්‍ර පාඨමාලාවන් පැවැත්වීම.

මෙම ඉලක්ක ළඟා කර ගැනීම සඳහා කළමනාකරණ නිලධාරීන් විසින් පහත දැක්වෙන කාර්ය මණ්ඩලය අනුමත කර ඇත.

| ශ්‍රේණිය | අනුමත කර ඇති සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| රේගු අධ්‍යක්ෂ | 01 | 01 |
| නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ | 02 | 01 |
| රේගු අධිකාරි | 03 | 01 |
| නියෝජ්‍ය රේගු අධිකාරි | 08 | 04 |
| සහකාර රේගු අධිකාරි | 08 | 02 |
| කළමනාකරණ සහකාර | 03 | 02 |
| **එකතුව** | **25** | **11** |

## 2014 වර්ෂයේ කාර්ය සාධනය

2014 පුහුණු වැඩසටහන් සැලැස්ම සහ රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කල විශේෂ වැඩසටහන්වලට අදාළව අප විසින් දේශීය පුහුණු වැඩසටහන් 41 ක් හා විදේශීය පුහුණු වැඩසටහන් පවත්වා ඇත. මේ අනුව 1470 දෙනෙකු මෙමගින් පුහුණුව ලබා ඇත.

## 2014 වසරේ පුහුණු පාඨමාලා සඳහා සහභාගිත්වය

### ශ්‍රේණි අනුව

<table>
<tr><th>ශ්‍රේණිය</th><th>දේශීය</th><th>විදේශීය</th></tr>
<tr><td>රේගු අධ්‍යක්ෂ ජනරාල්</td><td>-</td><td>3</td></tr>
<tr><td>අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්</td><td>20</td><td>18</td></tr>
<tr><td>රේගු අධ්‍යක්ෂ</td><td>33</td><td>25</td></tr>
<tr><td>නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ</td><td>76</td><td>30</td></tr>
<tr><td>රේගු අධිකාරි</td><td>182</td><td>33</td></tr>
<tr><td>නියෝජ්‍ය රේගු අධිකාරි</td><td rowspan="2">720</td><td>23</td></tr>
<tr><td>සහකාර රේගු අධිකාරි</td><td>44</td></tr>
<tr><td>අනෙකුත්</td><td>260</td><td>-</td></tr>
<tr><td>එකතුව</td><td>1,294</td><td>176</td></tr>
</table>

## පුහුණුවීම් පිළිබඳ විස්තර (දේශීය, විදේශීය) – 2014

දේශීය පුහුණු වැඩසටහන් – එකතුව: 38

විදේශීය පුහුණු වැඩසටහන් – එකතුව: 131

දේශීය

- රේගු අධිකාරි සහ ඉහළ වැඩසටහන් - 314
- සහකාර රේගු අධිකාරි සහ ඉහළ වැඩසහටන් - 720
- අනෙකුත් - 260

විදේශීය

- සමුළු 11
- වැඩමුළු 16
- වැඩසටහන් 6
- පුහුණු පාඨමාලා 25
- රැස්වීම් 35
- පශ්චාත් උපාධ වැඩසටහන 21
- සම්මන්ත්‍රණ 10
- අනෙකුත් 07

මානව සම්පත් සංවර්ධන අංශය මගින් පැවැත්වූ භාෂා පන්ති

| සියළු නිලධාරීන් සඳහා භාෂා පුහුණු | එකතුව | |
|---|---|---|
| | සැළසුම්කල | පැවැත්වූ සංඛ්‍යාව |
| **අ.පො.ස.(සා.පෙළ) දෙවන භාෂාව/ දෙමළ** | 20 | 20 |

රේගු නියෝජිතයන්ගේ පුහුණු වැඩසටහන් හා විභාග

| විභාග | සහභාගිත්ව | සමත් | ප්‍රතිශතය |
|---|---|---|---|
| කාණ්ඩ 1 | 120 | 61 | 50.8% |
| කාණ්ඩ 11 | 120 | 88 | 73.3% |
| කාණ්ඩ 111 | 95 | 60 | 63.2% |

## රේගු පුස්තකාලය

මානව සම්පත් සංවර්ධනයේ ඉතා වැදගත් අවියක් වන රේගු පුස්තකාලය 2005.01.26 දින පිහිටුවන ලද අතර එය රේගු අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) යටතේ අනුබද්ධිත ඒකකයක් ලෙස ස්ථාපිත කරන ලදී. පුස්තකාලය සඳහා රේගු කාර්ය මණ්ඩයේ බලාපොරොත්තු නොවූ ධනාත්මක ප්‍රතිචාරයක් ලැබුණු අතර දැනට එහි සාමාජික සංඛ්‍යාව හා පොත් සංඛ්‍යාවද වැඩි වී ඇත. රේගු නිලධාරින්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලෙන් වෙන් කරනු ලබන මුදලින් පුස්තකාලය සඳහා පොත් මිලදී ගනු ලැබේ.

මෙම පුස්තකාලය දෙපාර්තමේන්තුවේ සියළු කාර්ය මණ්ඩලයට හා සාමාජික නොවන අයටද පරිහරණය කල හැකිය. පොත් වලට අමතරව පුවත්පත්, වාර සඟරා, හා විවිධ සඟරා ආදියද පරිහරණය සඳහා ඇති අතර දෙපාර්තමේන්තු නියෝග හා නිලධාරීන් විදේශ පුහුණුව සඳහා සහභාගී වීමෙන් පසුව ඉදිරිපත් කරනු ලබන වාර්තාද අනාගතයේ ප්‍රයෝජනය සඳහා මෙහි තැන්පත් කර ඇත.

මෙහි පුස්තකාලාධිපතිවරයකු නොමැති වුවද, පුස්තකාලයේ කටයුතු බාධාවකින් තොරව සිදු කෙරේ. පුස්තකාලයේ සාමාජිකත්වය වැඩි වෙමින් පවත්නා අතර එම නිසා එයට පහසුකම් ලබා දිය යුතු වේ. ඒවා අතර

(a) අනෙකුත් කාර්ය මණ්ඩලය සමග සුදුසු පුස්තකාලාධිපතිවරයෙකු අනුයුක්ත කිරීම
(b) සුදුසු මෘදුකාංගයක් හඳුන්වා දීම
(c) නවීන පහසුකම් සහිත පරිගණක අන්තර්ජාල පහසුකම් ලබාදීම.
(d) කාඩ්පත් ක්‍රමය යටතේ පොත් පත් නිකුත් කිරීමේ හා නැවත භාරගැනීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම වැනි දෑ දැක්විය හැක.

### පුස්තකාල සේවාව
### (සාමාජික සංඛ්‍යාව **1330**)

| විස්තරය | 2013 | 2014 |
|---|---|---|
| නව සාමාජික සංඛ්‍යාව | 96 | 73 |
| මිලදී ගන්නා ලද පොත් ප්‍රමාණය | - | 29 |
| ප්‍රදාන වශයෙන් ලද පොත් ප්‍රමාණය | 22 | 129 |
| පොත් සංඛ්‍යාව | 5,500 | 5,629 |

# කාර්ය මණ්ඩල සේවා අංශය

## හැඳින්වීම

ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ අලුතින් ආරම්භ කරන ලද මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ සේවකයන් හට දෙපාර්තමේන්තුමය අරමුණු ඉටුකර ගැනීම සඳහා නිර්මාණාත්මකව හා ප්‍රයෝජනවත් ආකාරයට දායක විය හැකි පරිසරයක් සැකසීමය.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

**i.** ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම :
රේගුවේ සියළුම මට්ටම්වල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ උපදෙස් අනුගමනය කරමින් ඵලදායිතා ප්‍රවර්ධන තත්ත්ව ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රමවේද හා තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීම

ii. රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම
සියලු අංශ සම්බන්ධීකරණය කරමින් විගණකාධිපති විසින් විමසන ලද විමසුම් සඳහා පිළිතුරු සැපයීම

iii. සුභසාධන කළමනාකරණය:
දැනට සැපයෙන සුභසාධක සේවා හා ඒවායේ ප්‍රමිතිය හඳුනාගෙන ගුණාත්මක සුභ සාධක සේවාවක් සැපයීම පිණිස අවශ්‍ය කටයුතු කිරීම.

iv. විනය පිළිබඳ කළමනාකරණය:
අදාළ නිලධාරීන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් වන්නේ නම් ඒ පිළිබඳව මූලික විමර්ශන හා විනය පරීක්ෂණ පැවැත්වීම. රේගු දෙපාර්තමේන්තුවේ විනය ක්‍රියාපටිපාටියට සංයුක්ත කොට ආචාර ධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. සේවකයින් ආචාර ධර්ම පද්ධතිය අනුගමනය කරන්නේද යන්න නිරීක්ෂණය කිරීම හා ආචාර ධර්ම පද්ධතිය අනුගමනය නොකරන්නේ නම්, ඔවුන්ට විරුද්ධව විනය ක්‍රියාපටිපාටිය හැකිතාක් දුරට අනුගමනය කොට ආචාර ධර්ම පද්ධතිය ඵලදායී බවට පත් කිරීම.

v. දුක්ගැනවිලි කළමනාකරණය:
සේවකයන් තුළ තෘප්තිය වර්ධනය කිරීමටත්, කළමනාකරණය කෙරෙහි අසංතෘප්තිය අවම කිරීමටත් හැකිවන පරිදි දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම. පිළිගත් වෘත්තීය සමිති සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩනඟා ගැනීමේ අපේක්ෂාවෙන් නිරන්තර සාකච්ඡා පැවැත්වීම. අර්බුදකාරී කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම පිණිස සාකච්ඡා සම්මුති, කමිටු පිහිටුවීම හා සේවක ගැටළු හඳුනාගෙන එකඟතාවයකට පැමිණීමට සාකච්ඡා පැවැත්වීම.

**2014 ක්‍රියාකාරී සැලසුමේ ඇති කාර්යසාධනය සැසඳීම**

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| 1. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සමග උපදේශන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගෙන යාම හා දෙපාර්තමේන්තුව තුළ 55 ක්‍රමය ක්‍රියාවට නැංවීම සැලසුම් කිරීම පිණිස තෝරාගත් ආදර්ශ කාර්යාංශ සමග සාකච්ඡා පැවැත්වීම | 1 වන කාර්තුව | 1 වන කාර්තුව | |
| 2. සියළු කාර්යාංශ සඳහා එස් 5 ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 1 වන කාර්තුව | 1 වන හා 2 වන කාර්තු | |
| 3. දෙපාර්තමේන්තුවේ එස් 5 අත්පොත සැකසීම | 1 හා 2 වන කාර්තුව | | සේවකයන් සමග අනුකූල නොවීම හේතුවෙන් සකස් නොකරන ලදී. |
| 4. දෙපාර්තමේන්තුව තුළ එස් 5 ක්‍රමය ක්‍රියාත්මක කිරීම | 2 වන කාර්තුව | | මිලදී ගැනීමේ දුෂ්කරතා සහ ගෘහභාණ්ඩ අංක කරන පද්ධතිය නොතිබීම හේතුවෙන් ප්‍රගතිය අඩාල විය. |
| 5. Kaizen හා ගුණාත්මක කව පිළිබඳ පුහුණු වැඩසටහන පැවැත්වීම | 3 වන කාර්තුව | 2 වන කාර්තුව | |
| 6. Kaizen හා ගුණාත්මක කව ක්‍රියාවට නැංවීම | 3 වන කාර්තුව | | සේවකයින් සමග අනුකූල නොවීම හා මිලදී ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ප්‍රගතිය අඩාල විය. |
| 7. හරිත ඵලදායිතාවය හා පූර්ණ තත්ව කළමනාකාරිත්වය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 4 වන කාර්තුව | | ඉහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය. |
| 8. හරිත ඵලදායිතාවය හා පූර්ණ තත්ව කළමනාකාරිත්ව ක්‍රමශිල්පය ක්‍රියාවට නැංවීම | 4 වන කාර්තුව | | ඉහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ක්‍රියාවට නැංවිය නොහැකි විය. |

# සේවා හා සැපයීම් අංශය

## හැඳින්වීම

රජයෙන් පවරන අත්‍යවශ්‍ය රාජකාරි ඉටු කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුවේ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අංශයකි. සේවා හා සැපයුම් අංශයේ පරමාර්ථය වන්නේ ඵලදායී ලෙස හා විනිවිදභාවයෙන් රේගුවේ සියලුම අංශයන් සඳහා සියලු අවශ්‍යතා සැපයීම, නඩත්තු කිරීම හා සේවා කටයුතු සිදු කිරීමයි.

## ප්‍රධාන කාර්යයන්

1. දෙපාර්තමේන්තුවේ කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ගුණාත්මකභාවය ආරක්ෂා කරමින් නියමිත වෙලාවට අදාළ අංශ වෙත සේවා හා සැපයීම් ලබාදීම.
2. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව යමින් විනිවිද භාවයෙන් යුක්ත ආකාරයට භාණ්ඩ හා සේවා මිලදී ගැනිම.
3. විධිමත් ආකාරයේ තොග පාලනයක් හා කාර්යක්ෂම ගබඩා පාලන ක්‍රමයක් පවත්වාගෙන යාම සහතික කිරීමත්, මිලදී ගන්නා භාණ්ඩවල ආරක්ෂාව හා උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි ඒවා ගබඩා කිරීම හා ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම.
4. රේගු දෙපාර්තමේන්තුවේ චංචල හා නිශ්චල වත්කම් කළමනාකරණය
5. කාලසටහනට අනුව රේගු මූලස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිම කිරීම හා පරිශ්‍ර කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන බවට සහතික වීම.
6. සුදුසු පියවර මගින් රේගු දෙපාර්තමේන්තුවේ රථවාහන සමූහය උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහතික කිරීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම | යෝජිත ගොඩනැගිල්ල 100% ක් සම්පූර්ණ කිරීම | 100% අවසන් | - |
| අවශ්‍ය භාණ්ඩ වැඩ හා සේවාවන් මිලදී ගැනීම | භාණ්ඩ හා සේවා මිලදි ගැනීම | 100% අවසන් | - |
| නිසි ගබඩා පාලන හා වත්කම් කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම | පද්ධතිය හරහා සියළු ඉන්වෙන්ටරි භාණ්ඩ පවත්වාගෙන යාම හා අධීක්ෂණය | 75% අවසන් | දැනට ක්‍රියාත්මකයි |
| 2014 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සත්‍යොක්ෂණය | සත්‍යොක්ෂණය අවසන් කොට එහි වාර්තාව විගණකාධිපති හා වෙනත් අදාල පාර්ශ්වයන් වෙත ඉදිරිපත් කිරීම සහ 2015 වසර සඳහා වාර්ෂික සත්‍යොක්ෂණ මණ්ඩල පත් කිරීම | 100% අවසන් | - |
| ශ්‍රී ලංකා රේගුවේ වාහන පවත්වාගෙන යාම | නිතිපතා සේවා කිරීම මගින් වාහන හොඳ ධාවන තත්වයෙන් පවත්වා ගෙන යාම, ආර්ථික වශයෙන් අවාසිදායක හා පැරණි වාහන ඉවත් කිරීම නව අවශ්‍යතා හඳුනාගනිමින් නව වාහන මිලදී ගැනීම | 95% අවසන් | - |

# පළාත් පරිෂදය

# මගී සේවා (කටුනායක) කාර්යාංශය

## හැඳින්වීම

ශ්‍රී ලංකා රේගුවේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තුල මගි සේවා (කටුනායක) කාර්යාංශය ආදායම් හා සේවා පර්ෂදය ඇතුලත ක්‍රියාත්මක වේ. වර්තමානයේදී මෙම අංශය එහි ස්ථිර කාර්ය මණ්ඩලයට අමතරව රේගු අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. නි.රේ.අ. තනතුරට පහළ තනතුරේ තවත් නිලධාරී කණ්ඩායමක් සේවා මුර ක්‍රමයට බ.ජා.ගු. තොටුපොලේ රාජකාරි ඉටු කරමින් දවසේ පැය 24 පුරාම රාජකාරි ආවරණය කරනු ලබයි.

මගී සේවා අංශය ගුවන් භාණ්ඩ ප්‍රදේශය හැර බ.ජා.ගු. තොටුපොලේ පාලන / ආවේක්ෂණ කටයුතු භාරව ක්‍රියා කරන අතර බ.ජා.ගු. තොටුපොලේ සේවයේ යෙදී සිටින රේගු නිලධාරීන් පැමිණීමේ / පිටවීමේ පර්යන්ත වල දේශසීමා නිලධාරින් ලෙස කටයුතු කරයි.

## මූලික ඉලක්කයන්

- ගුවන් මගී සංචලනය පහසු කිරීම
- රේගු ආඥා පනත හා අනෙකුත් අදාල නීති යටතේ පවරා දී ඇති නීති බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම
- ගුවන් සංචලන සම්බන්ධ දේශසීමා මෙහෙයුම් නියාමනය හා අධික්ෂණය කිරීම
- ගුවන්යානා සංචලන පාලනයේදී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කිරීම
- ආදායම් අහිමිවීම් / විදේශ විනිමය අහිමිවීම් අවම කිරීම, එවන් අවස්ථා හඳුනාගැනීම හා ඊට එරෙහි කඩිනම් පියවර ගැනීම
- ආරක්ෂක අමාත්‍යාංශය, TRC, SLSI, CDDA, ආනයන පාලන දෙපාර්තමේන්තුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ආදී වෙනත් ආයතන හා අධිකාරි වලට අදාල පනත් හා රෙගුලාසි මගින් රේගුව වෙත පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ගුවන්තොටුපොල හා ගුවන් සේවා, නිරෝධායන දෙපාර්තමේන්තුව, අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ආදී ගුවන් තොටුපොල පරිශ්‍රයේ පිහිටි අනෙකුත් රජයේ ආයතන සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගෙන යාම

මෙම කාර්යාංශයේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ මට්ටමේ විවිධ තනතුරු දරන නිලධාරීන් විසින් පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබයි.

## ප්‍රධාන කාර්යයන්

1. රට තුළට පැමිණෙන හා රටින් පිටවන මගින්ගේ හා ඔවුන්ගේ ගමන් බෑග වල සංචලනය පහසු කිරීම
2. බ.ජා.ගු. තොටුපොලේ ප්‍රභූ ගමන් බිමන් පහසු කිරීම
3. ශ්‍රී ලංකාවට පැමිණෙන හා ඉන් පිටවන ගුවන් යානා හා ඒවායේ කාර්යමණ්ඩල සැලසුම් කිරීම
4. මගී ගමන් බෑග සඳහා තීරුබදු රහිත ගමන් බෑග දීමනාව ප්‍රදානය කිරීම හා අධීක්ෂණය සහ එවන් පහසුකම් අපහරණය කිරීම වැලැක්වීමට අවශ්‍ය පියවර ගැනීම
5. ATA කාඩ් පත්, ඇපකර හා විශේෂ තැන්පතු මත භාණ්ඩ මුදා හැරීම
6. රේගුව / ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් අනුමත කරන ලද මැණික් / ස්වර්ණාභරණ පාර්සල් හැසිරවීම
7. රට තුළට පැමිණෙන / ඉන් පිටවන මගීන්ගේ විදේශ මුදල් ප්‍රකාශ පරීක්ෂා කිරීම හා අනුමත කිරීම

8. මගියා පිට වූ පසු ඔහු විසින් රැගෙන නොගිය බැග ඇටෝනි බලපත්‍ර සහිත බලයලත් පුද්ගලයෙකු හට ඉතිරි ගමන් බැග දීමනාව ලබා දීම
9. සැකසහිත අවස්ථාවක හෝ අවශ්‍ය වෙනත් අවස්ථාවක කැටුව රැගෙන එන ගමන් මළු පරීක්ෂා කිරීම
10. අවශ්‍ය විටකදී පුද්ගලයින් පරීක්ෂා කිරීම
11. වැරදි අනාවරණය කරගැනීම විමර්ශනයන් සිදු කිරීම හා අනාවරණය කොටගත් රේගු සිද්ධි පිළිබඳ විමර්ශනය කිරීම
12. රටින් පිටතට යන ගුවන් යානා සඳහා නිෂ්කාශන නිකුත් කිරීම
13. වාණිජ අන්දමේ භාණ්ඩ රැගෙන එන මගීන්ගෙන් තීරුබදු හා අනෙකුත් බදු අය කර ගැනීම

| **ප්‍රධාන රාජකාරි** | **ඉලක්කය** | **තත්‍ය** | **ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු** |
|---|---|---|---|
| සැබෑ සංචාරකයන්ගේ නිශ්කාශන කටයුතු පහසු කිරීම සහ මත්ද්‍රව්‍ය හා වෙනත් රේගු වැරදි සිදුකරන සැකසහිත සංචාරකයින් ඉලක්ක කිරීම ඉහළ දැමීම | ප්‍රතිෂ්ඨාපන සැලසුම සකස් කිරීම හා අනුමැතිය ලබා ගැනීම. අවශ්‍ය උපකරණ මිලදි ගැනිම හා ස්ථාපිත කිරීම | ප්‍රතිෂ්ඨාපන සැලසුම සකස් කොට අනුමැතිය ලබා ගෙන ඇත. අවශ්‍ය අපකරණ මිලදී ගැනීම සඳහා වන පියවර ගෙන ඇත. | ටෙන්ඩර් ක්‍රියාවලියේ ප්‍රමාදය |
| නියමිත ආදායම ජනනය කර ගැනීම සඳහා බ.ජා.ගු. මගීන් විසින් රැගෙන එන වාණිජ ස්වභාවයෙන් යුත් භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා වඩා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයක් හඳුන්වාදීම | නව සැලසුමක් සකස් කොට වාණිජ ස්වභාවයෙන් යුත් භාණ්ඩ පරික්ෂා කිරීම සඳහා පරීක්ෂණ ස්ථානයක් ඉදි කිරිම | යෝජනාව ගුවන් සේවා අධිකාරිය වෙත භාර දී ඇත. ඔවුන් විසින් ටෙන්ඩර් කැඳවීම සිදු කරනු ලබයි. | ගුවන් සේවා අධිකාරිය විසින් ටෙන්ඩර් කැඳවීම ප්රමාදවීම |
| රටින් බැහැර යන සැකසහිත සංචාරකයින් හා ඔවුන්ගේ ගමන් බැග පරීක්ෂා කිරීමට ඵලදායී ඉලක්ක කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාවට නැංවීම | බිම් සැලසුමක් සකස් කොට එය ගුවන් සේවා අධිකාරිය සමග සාකච්ඡා කොට යෝජිත රේගු පරීක්ෂණ ස්ථානය ඉදිකිරීම | සාමාන්‍ය සාකච්ඡා සමගින් යෝජනාව භාර දී ඇත | බැහැර යාමේ පර්යන්තයේ මගී ප්‍රදේශයේ සම්පූර්ණ සැලසුම වෙනස් කිරීමට නියමිතය. අනෙකුත් ආයතනවලට අයත් කාර්යාල ප්‍රතිෂ්ඨාපනය ඇරඹී ඇති නමුත් අවසන් කිරීම ප්‍රමාද වී ඇත. |

| | | | |
|---|---|---|---|
| මගීන් හා ගුවන්තොටුපල භාවිතා කරන්නන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා රේගු නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන CCTV පද්ධතියක් ස්ථාපිත කිරීම | CCTV පද්ධතිය ස්ථාපිත කිරීම හා මෙහෙයුම් ආරම්භ කිරීම | සංවිධාන කාර්යාංශය වෙත යෝජනා භාර දී ඇති අතර ටෙන්ඩර් ක්‍රියාවලිය සිදුවෙමින් පවතී | ටෙන්ඩර් ක්‍රියාවලියේ තාක්ෂණික ප්‍රමාදය |
| වඩා හොඳ රේගු මෙහෙයුම් කටයුතු උදෙසා බ.ජා.ගු. රේගු කාර්යාලයේ එස් 5 ක්‍රමය ක්‍රියාත්මක කිරීම | ගුණාත්මක කව පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | ගුණාත්මක කව පිහිටුවන ලද අතර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සහභාගී විය | ඉලක්කය සාක්ෂාත් කොට ගෙන ඇත |

# ආදායම් හා සේවා (කටුනායක )කාර්යාංශය

## හැඳින්වීම

ආදායම් හා සේවා කාර්යාංශය (කටුනායක) කටුනායක බන්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ ගුවන් භාණ්ඩ පර්යන්තයේ ස්ථාපිත කොට ඇත.
නිසි ආදායම එකතු කර ගැනීම හා ආනයනය කරන ලද භාණ්ඩ දේශ සීමා පාලන රෙගුලාසි සුරැකෙන ආකාරයට නිෂ්කාශනය කිරීම සහ රේගු ආඥාපනතේ හා වෙනත් අදාල නීති හා රෙගුලාසි වල විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම මෙම කාර්යාංශයේ වගකීම වේ.

ගුවන් භාණ්ඩ පර්යන්තයේ ප්‍රධානතම භාණ්ඩ නැව් හැසුරුම්කරු ලෙස කටයුතු කරන්නේ ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ් ආයතනයයි. අනෙකුත් නැව් භාණ්ඩ හැසුරුම්කරුවන් ලෙස හා නිහඬ රේගු පාලන යටතේ සේවා සැපයිම සඳහා නැව් භාණ්ඩ පර්යන්ත II හි ස්වයං හැසුරුම් සේවා සපයන්නා ලෙස SLFFA කාගෝ සර්විස් ලිමිටඩ් හා එක්ස්පෝ ඒවියේෂන් ලිමිටඩ් යන ආයතන කටයුතු කරයි. කුරියර් භාණ්ඩ වේගවත්ව නිශ්කාෂණය කිරීමේ කටයුතු ඩී එච් එල් හා කොළඹ කාර්ගෝ එක්ස්ප්‍රස්(ප්‍රයිවට්) ලිමිටඩ් මගින් බැඳුම්කර ගුදම් වලදී සිදු කරයි.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

1. ගුවන් මගින් ආනයනය කරනු ලබන භාන්ඩ වලට අදාල රේගු තීරු බදු, සෙස් හා වෙනත් ගෙවීම් තක්සේරු කිරීම හා එකතු කිරීම
2. භාණ්ඩ ප්‍රකාශ හා නිෂ්කාශන බලපත්‍ර සකස් කිරීම
3. නිෂ්පාදන හා සේවා කාර්යාංශය යටතේ ක්‍රියාත්මක විවිධ අපනයන කේන්ද්‍රිය පහසුකරණ වැඩසටහන් යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ නිෂ්කාෂණය සඳහා අනුමැතිය ලබා දීම
4. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි ව්‍යාපාර වෙත යැවීමට නියමිත ආයතනික භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබා දීම
5. ඉක්මනින් නරක් වන ද්‍රව්‍ය, කුරියර් භාණ්ඩ, විදේශ දූත මණ්ඩල භාණ්ඩ හා තැපැල් ආදී ආනයනික හදිසි භාණ්ඩ කඩිනමින් නිෂ්කාශනය කිරීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වීම
6. නැවත පැමිණෙන මගින් විසින් කැටුවනොයන ලද බැග්, කැටුව නොයන ලද මගී බැග් ගබඩා වෙත මාරු කර යැවීම පහසු කිරීම
7. ආයෝජන මණ්ඩල, ආයෝජන මණ්ඩල නොවන, කුරියර් හා ඉක්මනින් නරක්වන භාණ්ඩ සඳහා අපනයන CusDecs සකස් කිරීම හා නිෂ්කාශන ලබා දීම

## 2014 ක්‍රියාකාරී සැලසුමේ කාර්යසාධනය සැසඳීම

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| ආනයන භාණ්ඩ ගිණුම්ගත කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික් නැව් බඩු ලේඛනයක් සකස් කිරීම | ක්‍රියාත්මක කිරීම | පරීක්ෂණ කටයුතු අවසන් කොට ඇත | ICT අංශය විසින් ශ්‍රී ලංකන් එයා සමාගම හා ඔවුන්ගේ සිංගප්පූරු සේවා සපයන්නන් සමග සාකච්ඡා වට ගණනාවක් පවත්වා ඇත. මේ වන විට පරීක්ෂණ කටයුතු අවසන් වී ඇති අතර ඉලෙක්ට්‍රොනික් නැව් බඩු ලේඛනය නුදුරු අනාගතයේදී සකස් කිරීමට හැකියාව ඇත. |

# ආදායම් සහ සේවා (ප්‍රාදේශීය) අංශය

## හැඳින්වීම

ආදායම් හා සේවා (ප්‍රාදේශීය) අංශය විසින් ගාල්ල, යාපනය, ත්‍රිකුණාමලය සහ මාගම්පුර යන පිට පළාත් තොටුපලවල්හි සියලුම රේගු අනුබද්ධිත කාර්යයන් සිදු කරයි. එමෙන්ම භාණ්ඩ, මගීන්ගේ භාණ්ඩ සහ තැපැල් පාර්සල් නිශ්කාශනය සහ රජය විසින් ලැබිය යුතු ආදායම් ලැබෙන බව සහතික කරයි. රේගු දෙපාර්තමේන්තුව විසින් එහි නවතම කාර්යාලය මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරායේ දී 2012 ජූනි මස 05 වන දින විවෘත කරන ලදී. එමගින් ආනයන භාණ්ඩ සහ නැව් මාරු භාණ්ඩ (මෝටර් රථ වාහන) නිශ්කාශනය සිදු කරයි.

## ප්‍රධාන කාර්යයන්

1. ආනයන සහ අපනයන ආදායම් එකතු කිරීම
2. රටේ සමාජ/ආර්ථික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සීමා පාලනය පවත්වා ගැනීම
3. ආනයන සහ අපනයන භාණ්ඩ පරීක්ෂාව හා මුද්‍රා හැරීම
4. ප්‍රාදේශීය මට්ටමින් මගී භාණ්ඩ සහ තැපැල් පාර්සල් නිශ්කාශනය සඳහා පහසුකම් සැලසීම

**එකතු කරන ලද ආදායම් (රු)**

| පළාත | තීරුබදු සහ අනෙකුත් බදු වර්ග | අනෙකුත් ගාස්තු | එකතුව |
|---|---|---|---|
| ගාල්ල | 1,510,322.18 | 28,433,071.10 | 29,943,393.28 |
| හම්බන්තොට | 489,261 | 11,555,163.90 | 12,044,424.90 |
| ත්‍රිකුණාමලය | 314,086 | 11,510,838 | 11,824,924 |
| යාපනය | 3,282,414 | 754,835 | 4,037,249 |
| මත්තල | 102,393,390 | 144,161 | 102,537,551 |
| මුලු සංඛ්‍යාව | 107,989,473.18 | 52,398.069 | 160,387,542.18 |

## 2014 ක්‍රියාකාරී සැලසුමේ කාර්යසාධනය සැසඳීම

| ප්‍රධාන ක්‍රියාකාරකම් | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රේගුවේ කාර්යාල ඉඩකඩ මාගම් රුහුණුපුර මත්තල රාජපක්ෂ ගුවන් තොටුපල තුළ ව්‍යාප්ත කිරීම | ශ්‍රී.ලං.ව.අ. වෙතින් තොරතුරු ලබාගෙන රේගු කටයුතු සැලසුම් කිරීම | තොරතුරු ලබාගෙන රේගු කටයුතු සැලසුම් කොට ඇත | |
| මාගම් රුහුණුපුර මත්තල රාජපක්ෂ ගුවන් තොටුපොල(හම්බන්තොට) රේගු කාර්ය මන්ඩලය සඳහා නවාතැන් පහසුකම් පුළුල් කිරීම | ශ්‍රී.ලං.ව.අ. හා හා.ස.අ. තොරතුරු ලබා ගැනීම භූමියක් ලබාගැනීම | තොරතුරු ලබා ගෙන ඇත. | නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම තවමත් සාකච්ඡා මට්ටමේ පවති. |
| අනාගත අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ගාල්ල, ත්‍රිකුණාමලය හා යාපනය බාහිර වරාය වල කාර්යාල හා නවාතැන් පහසුකම් පුළුල් කිරීම | ශ්‍රී.ලං.ව.අ. යුධ හමුදාව හා නාවික හමුදාව සමග සාකච්ඡා පැවැත්වීම හා සුදුසු ස්ථාන හඳුනාගැනීම | සියළු ආයතන සමග සාකච්ඡා කොට ස්ථාන හඳුනාගෙන ඇත. යාපනය, වැල්වැටිතුරෙයි, කයිට්ස්හි අදාළ භූමි සීමා සහ නාමපුවරු සහිතව වෙන්කර ඇත. | ඇතැම් ඉඩම් යුධ හමුදාව හා නාවික හමුදාව විසින් අත්පත් කරගෙන සිටින අතර ඒවාට ප්‍රවේශය තහනම්ය. |
| වාර්ෂික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා බාහිර වරාය වල කාර්ය මණ්ඩල හා ක්‍රියාකාරකම් ඉහළ දැමීම | කාර්යමණ්ඩලය ඉහළ දැමීම සඳහා ඉහළ බලධාරින් වෙත යෝජනා කර ඇත. | තවමත් සාකච්ඡා මට්ටමේ පවතී. | |
| බාහිර වරාය ඇතුළුව කාර්යාංශයේ ඵලදායිතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම | නව මෙහෙයුම් කමිටු ස්ථාපිත කොට ඵලදායිතා ව්‍යාපෘතිය සකස් කිරිම | කමිටුව සහ ක්‍රියාකාරී සැලසුම සකස් කොට ඇත | |
| ප්‍රාදේශීයව ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථාන වල රේගු කාර්යාල හා ක්‍රියාකාරකම් ස්ථාපිත කිරීම සඳහා අනාගත ඉඩ ප්‍රස්ථා හඳුනාගැනිම | ස්ථාන හඳුනාගෙන ඒවා අත්පත් කර ගැනීම සඳහා සාකච්ඡා පැවැත්වීම | ස්ථාන කිහිපයක් හඳුනාගෙන ඇත. තලෙයිමන්නාරමේ මිනුම් සිතියම ලබා ගෙන ඇත. කයිට්ස්හි අදාළ භූමි සීමා සහ නාමපුවරු සහිතව වෙන්කර ඇත. | මන්නාරමේ ස්ථානය හඳුනාගෙන ඇති නමුත් එය පුරා විද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථානයක් යැයි යෝජනා කෙරේ. |

# මගී සේවා (ප්‍රාදේශීය) අංශය

## මූලික ඉලක්කයන්

- රට තුළට පැමිණෙන හා රටින් පිටවන මගීන්ගේ හා ඔවුන්ගේ ගමන් මළු සංචලනය පහසු කිරීම
- රේගු ආඥා පනත හා අනෙකුත් අදාල නීති යටතේ පවරා දී ඇති නීති බලාත්මක කිරීමේ කටයුතු සිදු කිරීම
- ගුවන් මගී සංචලන සම්බන්ධ දේශසීමා මෙහෙයුම් නියාමනය හා අධීක්ෂණය කිරීම
- ගුවන්යානා සංචලන පාලනයේදී කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කිරීම
- ආදායම් අහිමිවීම් / විදේශ විනිමය අහිමිවීම් අවම කිරීම, එවන් අවස්ථා හඳුනාගැනීම හා ඊට එරෙහි කඩිනම් පියවර ගැනීම
- ආරක්ෂක අමාත්‍යාංශය, TRC, SLSI, CDDA, ආනයන පාලන දෙපාර්තමේන්තුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ආදී වෙනත් ආයතන හා අධිකාරි වලට අදාල පනත් හා රෙගුලාසි මගින් රේගුව වෙත පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීම
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ගුවන්තොටුපොල හා ගුවන් සේවා, නිරෝධායන දෙපාර්තමේන්තුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ආදී ගුවන් තොටුපොල පරිශ්‍රයේ පිහිටි අනෙකුත් රජයේ ආයතන සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගෙන යාම
- වානිජ අන්දමේ භාණ්ඩ රැගෙන එන මගීන්ගෙන් තීරුබදු හා අනෙකුත් බදු අය කර ගැනීම

මුලු අයකිරීම් (රු.)

| | ට්‍රයිකෝ - ගාල්ල | ට්‍රයිකෝ - කුරුණෑගල | සී.එස්.එල්- මහනුවර | එම්.ආර්.අයි.ඒ. | මුලු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ආනයන තීරු බදු | 2,855,827 | 4,399,911 | 2,990,208 | 1,058,763 | 11,304,709 |
| වැට් බදු | 2,472,342 | 3,624,544 | 2,592,546 | 1,357,470 | 10,046,902 |
| වරාය හා ගු. තො. බද්ද | 936,923 | 1,347,984 | 939,379 | 779,508 | 4,003,794 |
| නිෂ්පාදන බදු | 281,973 | 615,210 | 660,661 | -- | 1,557,844 |
| ජා. ගො.බද්ද | 537,889 | 799,094 | 559,583 | 433,585 | 2,330,151 |
| ඊ.අයි.සී. | 2,210,204 | 3,239,991 | 2,404,927 | 4,300,626 | 12,155,748 |
| දඩ | 312,326 | 375,100 | 117,039 | 7,822,890 | 8,627,355 |
| අතිකාල | 8,400 | 7,359,551 | 4,024,998 | -- | 11,392,949 |
| මුලු සංඛ්‍යාව | **9,615,884** | **21,761,385** | **14,289,341** | **15,752,842** | **61,419,452** |

## මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි රත්‍රන් හා අනෙකුත් තහනම් භාණ්ඩ ජාවාරමට එරෙහි පියවර

රේගුවේ මුඛ්‍ය කාර්යයක් ලෙස ,රු. 17.110,000 වටිනාකම් හා කි. ග්‍රෑම්. 3.132 ,බර සහිත රත්‍රන්කුට්ටි 31 හා අනෙකුත් තහනම් භාණ්ඩ ජාවාරම් කිරීමට ගත් උත්සාහයන් අනාවරණය කර ගන්නා ලද අතර රු1 .,100,000 ක දඩ මුදල් සමඟ රාජ සන්තක කරන ලදි. සිගරට් පෙට්ටි 227 සහ සැටලයිට් රිසිවර් 137 සොයා ගන්නා ලද අතර ඒ සියල්ල රාජ සන්තක කරන ලදී.

# රේගු අධ්‍යක්ෂ ජනරාල් යටතේ පවතින අංශ

# පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය

## හැඳින්වීම

පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය සෘජුවම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ ක්‍රියාත්මක වේ. එයට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 වන පන්තියේ නිලධාරියකු විසින් නායකත්වය දෙනු ලබයි. මෙම නව අංශය ආරම්භ කිරීමේ අපේක්ෂාවක් වූයේ ක්‍රියාකාරී කළමනාකරණයට දායක වීමයි. එහිදී නීත්‍යානුකූල නොවන කාර්යයන් සිදු වීම වැළැක්වීමත්, අවංකත්වයේ සිදු වන අඩාපාඩු වැළැක්වීමෙහි ක්‍රමානුකූල වර්ධනයක් මඟින් ක්‍රියාකාරී කළමනාකරණයට දායක වීම අපේක්ෂා කරන ලදී. එමෙන්ම ඇති වන අවදානම් තත්ත්වයන්ට අනුරූපීව අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා වැඩි දියුණු කිරීම ද අපේක්ෂා කරන ලදී.

දෙපාර්තමේන්තුව තුළ සියලුම අංශයන් තුළ පවත්නා ප්‍රධාන ක්‍රියාවලීන් හා සහාය ක්‍රියාවලීන්හිදී සම්පත් යොදා ගැනීමේ අරපිරිමැසුම් බව හා සඵලතාව තක්සේරු කිරීම සඳහා විගණන සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන විෂය පථය වේ.

## ප්‍රධාන කාර්යයන්

1. හැකි සෑම අවස්ථාවකදීම විගණනයෙන් සිදු වන සේවය ප්‍රවර්ධනය කරමින්, එමගින් ආයතනයට වටිනාකමක් එකතුවන බව සනාථ කිරීම සඳහා ඵලදායී ලෙස අභ්‍යන්තර විගණන කාර්යය කළමනාකරණය කිරීම.
2. පහත සඳහන් කරුණු ද ඇතුළුව ආයතනයේ පාලන මෙහෙයුම් හා තොරතුරු පද්ධතියට අදාළව ඒවායේ ප්‍රමාණාත්මක බව හා සඵලතාවය ඇගයීමට ලක් කිරීම ;
   - අ. මූල්‍ය හා මෙහෙයුම් තොරතුරුවල විශ්වාසනීයත්වය
   - ආ. මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය හා සඵලත්වය
   - ඇ. වත්කම් ආරක්ෂා කිරීම.
   - ඈ. නීති, රෙගුලාසි හා ගිවිසුම්වලට අනුගත වන බව
3. අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන අවදානම් තක්සේරුවමත පදනම්ව විගණන සැළසුම් සකස් කිරීම හා ආයතනයේ මෙහෙයුම් වැඩි දියුණු කිරීම.
4. හෙළිවන්නා වූ වැදගත් අවදානම් අවස්ථා සහ පාලන ගැටළු හා අනෙකුත් අවශ්‍ය කරුණු පිළිබඳව වාර්තා කිරීම හෝ ඉහළ කළමනාකරණය විසින් ඒවා ඉල්ලා සිටි විට ලබා දීම.
5. දැනට ක්‍රියාත්මක මෙහෙයුම් හා වැඩසටහන් හෝ ඒවායින් ලද ප්‍රතිඵල කෙතරම් දුරට තීරණය කරන ලද ඉලක්ක හා අරමුණු සමඟ අනුකූලදැයි බැලීම සඳහා මෙහෙයුම් හා වැඩසටහන් සමාලෝචනය කිරීම.
6. පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමෙහිලා පාලන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා එය තක්සේරු කොට සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම
   - ආයතනය තුළ සුදුසු චර්යාධර්ම හා වටිනාකම් ප්‍රවර්ධනය කිරීම.
   - ඵලදායී ආයතනික කාර්ය සාධනය කළමනාකරණය හා වගකීම සහතික කිරීම

**කාර්ය සාධනය**

පද්ධති හා ක්‍රියාපටිපාටි අනුකූලතා විගණන අංශය 2014 වර්ෂයේ දී විගණන 72 ක් සිදු කර ඇති අතර, ඉන් විගණන 68 ක් සම්පූර්ණ කර ඇත.

## 2014 ක්‍රියාකාරී සැලසුමේ කාර්යසාධනය සැසඳීම

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| 1. රජයේ අපේක්ෂාවන්ට සමගාමීව උපරිම ආදායම ජනනය කිරීම | 40 | 36 | විගණන අංශයට නිලධාරීන් අඩු ප්‍රමාණයක් සිටීම<br>ගිණුම් අංශයේපැවතුන වැටුප් වංචා සම්බන්ධයෙන් විශේෂ විගණනයක් පැවැත්විය<br>සරප් අංශයේ විශේෂ විගණනය |
| 2. ආදායම, සමාජීය හා පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් වන රේගු නීතිය සහ වෙනත් අදාල නීති හා රෙගුලාසි නිසි පරිදි බලාත්මක කිරීම තහවුරු කරමින වෙළඳාම පහසු කරවීම | 17 | 11 | |
| 3. කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය / ඵලදායිතාවය ඉහළ දැමීම හා සුභවාදී රාජකාරි පරිසරයක් ඇති කිරීම සඳහා වන ආකල්ප ගොඩනැගීම | 10 | 07 | |
| 4. තාක්ෂණික විසඳුම් සමගින් සමස්ත රේගු ක්‍රියාවලිය සුමට ලෙස ක්‍රියාකරවීම පිණිස අවශ්‍ය තාක්ෂණික සහාය හා මාර්ගෝපදේශකත්වය නිසි කලට වේලාවට සැපයීම | 04 | 03 | |
| 5. වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා සමගාමීව යමින් වියදම් පාලනය කිරීම හා විවිධ අරමුදල් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම | 07 | 03 | |
| එකතුව | 78 | 60 | |

# මුල්‍ය අංශය

## හැඳින්වීම

රේගු දෙපාර්තමේන්තුව රජයේ මුළු ආදායමෙන් 56% වඩා බදු ආදායම් එකතු කිරීමේ ප්‍රධානතම දෙපාර්තමේන්තුවයි. දෙපාර්තමේන්තුවේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට පහත සඳහන් කාර්යයන් ඉටු කරලීම මුල්‍ය අංශයේ වගකීමයි.

## ප්‍රධාන කාර්යයන්

1. වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ වියදම් සහ බදු ආදායම් සකස් කිරීම.
2. බදු ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු රැස්කිරීම වාර්තා තබා ගැනීම හා බදු ආදායම් , වාර්තාකරණය.
3. වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ලබාදී ඇති ප්‍රතිපාදන පරිදි වියදම් කළමනාකරණය
4. නිසි කාලසීමාවන් තුළ අවශ්‍ය පරිදි මුල්‍යමය තොරතුරු මහා භාණ්ඩාගාරයට , විගණකාධිපති හා අනෙකුත් බලධාරීන්ට සැපයීම.
5. රේගු තැන්පත් ගිණුමරඳවාගත් හා ,රේගු නිලධාරීන්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල , රාජසන්තක කළ භාණ්ඩ අත්තිකාරම් ගිණුම සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යනාදිය පරිපාලනය වේ.
6. වාර්ෂික විසර්ජන ගිණුම රේගු නිලධාරීන්ගේ ,ආදායම් ගිණුම හා රේගු තැන්පත් ගිණුම , වන්දි කළමනාකරණ අරමුදල රඳවා ගත් හා රාජසන්තක කළ භාණ්ඩ ගිණුම හා , රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සකස් කිරීම හා ඉදිරිපත් කිරීම.

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටු කර ගැනීමට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ මුල්‍ය අංශයේ ප්‍රධාන මුල්‍ය නිලධාරී සහ ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ පහත සඳහන් අනු අංශ ස්ථාපිත කර ඇත.

- ආදායම් අංශය
- ගෙවීම් අංශය
- වැටුප් හා විශ්‍රාම වැටුප් අංශය
- අතිකාල ගෙවීම් අංශය
- අරමුදල් කළමනාකරණ අංශය

ප්‍රධාන මුල්‍ය නිලධාරී තනතුර තවමත් පුරප්පාඩු බැවින් මුල්‍ය අධ්‍යක්ෂ (ප්‍රධාන ගණකාධිකාරී) විසින් සියළු මුල්‍ය කටයුතු සුපරීක්ෂණය, සමායෝජනය හා පරිපාලනය සිදු කරනු අතර, දෙපාර්තමේන්තු සේවකයන් වෙනුවෙන් ඇපකරුවන් පිළිබඳව සොයා බැලීම ඉදිරිපත් කිරීම සහ BAYEE බදු ක්‍රමය පරිපාලනය කිරීම තවදුරටත් ඔහු සතු වගකීම වේ.

## කාර්ය සාධනය

**ආදායම් අංශය**

අයවැය ගත කළ ආදායම් සමඟ සසඳා බැලීමේදී පසුගිය වසර දෙක තුළ සෑම ආදායම් වර්ෂයක් යටතේ දෙපාර්තමේන්තුව විසින් එකතු කළ ආදායම් පිළිබඳව සැසඳීම පහත දක්වා ඇත .

ලංකා බැංකුවේ තැප්රොබේන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ප්‍රධාන ආදායම් ගිණුම හා සම්බන්ධිත ආදායම් රැස් කිරීමේ උප ගිණුම් හා රැස් කිරීමේ ස්ථාන 41 මගින් ආදායම් රැස් කිරීම ආදායම් අංශයේ වගකීම වේ. රැස්කරනු ලබන ආදායම් රජයේ අවශ්‍යතා සඳහා යොදවා ගතහැකි වන පරිදි මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම වෙත විද්‍යුත් මාර්ගයෙන් බැර කරනු ලබයි.

### රේගු ආදායම් කාර්ය සාධනය (රු. මිලියන )

| ආදායම් ශීර්ෂය | විස්තරය | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|
| | | ඉලක්කය | එකතු කරන ලද | ඉලක්කය | එකතු කරන ලද |
| 1001-01-00 | ආනයන බදු | 85,000 | 77,701 | 82,591 | 74766 |
| 1001-02-00 | අපනයන බදු | 25 | 24 | 20 | 22 |
| 1001-04-00 | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු (PAL) | 80,000 | 68,625 | 61,004 | 61516 |
| 1001-05-01 | සෙස් බදු - ආනයන | 41,500 | 35,609 | 37,362 | 33011 |
| 1001-06-00 | මෝටර් වාහන සහන බද්ද | | | | |
| 1001-07-00 | ප්‍රාදේශීය යටිතල සංවර්ධන බද්ද | | | | |
| 1001-05-02 | සෙස් බදු - අපනයන | 3,500 | 3,085 | 3,120 | 3088 |
| 1001-08-00 | විශේෂ වෙළඳ බද්ද | 65,000 | 47,953 | 50,106 | 46705 |
| | **මුළු රේගු බදු ආදායම** | **275,025** | **232,997** | **234,203** | **219,108** |
| 1002-05-01 | නිෂ්පාදන බදු - සිගරට් | 61,000 | 57,204 | 58,222 | 58534 |
| 1005-05-02 | නිෂ්පාදන බදු - මත්පැන් | | 12 | | |
| 1002-05-03 | නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් | 40,000 | | 35,849 | 27131 |
| | නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් (ආනයන) | | 28,732 | 32,753 | 27131 |
| | නිෂ්පාදන බදු - පෙට්‍රෝලියම් (දේශීය) | | 3,087 | 3,096 | |
| 1002-05-04 | නිෂ්පාදන බදු - මෝටර් රථවාහන | 70,000 | 76,435 | 71,906 | 55517 |
| 1002-05-99 | නිෂ්පාදන බදු - අනෙකුත් | 7,000 | | 5,347 | 2528 |
| | නිෂ්පාදන බදු - අනෙකුත් (ආනයන) | | | 1,477 | 1248 |
| | නිෂ්පාදන බදු - අනෙකුත් (දේශීය) | | | 3,870 | 1279 |
| | **මුළු නිෂ්පාදන බදු ආදායම** | **178,000** | **133,639** | **171,324** | **143,710** |
| 1002-01-04 | එකතු කළ අගය මත බද්ද (ආනයන) | 135,000 | 102,235 | 123,888 | 96591 |
| 1003-10-00 | **සමාජ වගකීම් බද්ද** (SRL) | | | | |
| | **සමාජ වගකීම් බද්ද** (SRL) - | | | | |
| | **සමාජ වගකීම් බද්ද** (SRL) - | | | | |
| 1002-02-17 | ජාතිය ගොඩනැගීමේ බද්ද | 19,000 | 16,086 | 19,721 | 22443 |
| | **මුළු අනෙකුත් බදු ආදායම** | | | | |
| | **මුළු බදු ආදායම** | **607,025** | **484,957** | **549,136** | **481,852** |
| 2003-02-17 | **ඇහලුම් විකිණීම** | | 89 | 95 | 92 |
| 2003-02-99 | | | | | |
| 2003-99-00 | විවිධ | | | 859 | 2141 |
| 2003-03-00 | | | | | |
| | **මුළු ආදායම** | | **485,046** | **550,090** | **484,085** |

### ගෙවීම් අංශය

පාර්ලිමේන්තු අනුදැනුම අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන යටතේ සියලු ගෙවීම් සිදු කිරීම සහ රේගු නිලධාරින්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල් හා රාජසන්තක කළ භාණ්ඩ අත්තිකාරම් ගිණුම හා රජයේ සේවකයින්ගේ අත්තිකාරම් ගිණුම ප්‍රතිපාදන යටතේ ගෙවීම් සිදු කිරීම ගෙවීම් අංශයේ වගකීමයි. (පසුගිය වසර දෙකේදී අයවැයට අනුව සිදු කරන ලද ගෙවීම් වෙන වෙනම සසඳා පහත විස්තර කර ඇත.)

| වියදම් කළමනාකරණය (රුමිලියන.) | | | | |
|---|---|---|---|---|
| විස්තරය | 2014 | | 2013 | |
| | ඇස්තමේන්තු ගත | සත්‍ය වියදම | ඇස්තමේන්තු ගත | සත්‍ය වියදම |
| පුනරාවර්තන | 1,681 | 1,659 | 1,497 | 1,495 |
| ප්‍රාග්ධන | 398 | 354 | 776 | 776 |
| **එකතුව** | **2,079** | **2,013** | **2,273** | **2,271** |
| | | | | |

#### වැටුප් සහ විශ්‍රාම වැටුප් ගෙවීම් අංශය

සේවකයින් 2000ට වැඩි සංඛ්‍යාවකට වැටුප් ගෙවීම හා දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ගිය සේවකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීමට ක්‍රියා කිරීම, මෙම අංශයේ වගකීම් වේ.

#### අතිකාල ගෙවීම් අංශය

ආනයන හා අපනයන කටයුතුවලදී සාමාන්‍ය රාජකාරී වේලාවෙන් පසුව රේගු සේවා ඉල්ලා සිටින ආනයන අපනයනකරුවන්ගේ අතිකාල ගෙවීම් එකතු කිරීම හා ගිණුම් ගත කර අතිකාල ගෙවීම මෙම අංශයෙන් සිදු කරයි. එම අයකරගත් මුදල් රේගු අතිකාල අරමුදලට සහ බඩු පරීක්ෂා කිරීමේ අරමුදලට බැර කර අනුමත කරනලද ගෙවීම් ක්‍රමය යටතේ නිලධාරීන් අතර, බෙදාහරිනු ලබයි.

#### අරමුදල් කළමනාකරණ අංශය

රේගු බදු හැර අනෙකුත් තැන්පතුවලින් ලැබෙන ලැබීම් ලබාගැනීම, වාර්තා කිරීම හා ගිණුම් තැබීම මෙම අංශයේ වගකීම වේ. දඩ මුදල්, විකුණුම් මුදල්, විශ්‍රාම වැටුප් සහ අනෙකුත් තැන්පතු මෙම ලැබීම් තුළ අඩංගු වේ. පළමුව ලැබෙන දඩ මුදල් හා විකුණුම් මුදල් ප්‍රධාන තැන්පතු ගිණුමට බැර කරන අතර, වරක් විමර්ශනය සහ අභියාචනය ක්‍රියාවලිය සිදුවීමෙන් අවසානව පසු රේගු පරිපාටියේ අංක. 152 ඡේදය යටතේ අනුමත ක්‍රමයට අනුව එම ලැබීම් රේගු ත්‍යාග අරමුදලට, රේගු නිලධාරීන්ගේ වන්දි අරමුදලට සහ පොදු අරමුදලට (Pool Fund) මාරු කරනු ලැබේ.

මේ අනුව, පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අදාළව පිළියෙල කර විගණනය සඳහා විගණකාධිපති වෙත යොමු කරනු ලැබේ.

- රේගු ත්‍යාග අරමුදල
- රේගු නිලධාරීන්ගේ වන්දි හා කළමනාකරණ අරමුදල

නීති විරෝධි ලෙස ආනයන හා අපනයන කරන ලද භාණ්ඩ හා රේගු සන්තක කළ භාණ්ඩ සම්බන්ධයෙන් සිදුවන වියදම් තැන්පත් කරනු ලබන රඳවාගත් හා රාජ සන්තක කළ භාණ්ඩ අත්තිකාරම් ගිණුමද මෙම අංශයෙන් තවදුරටත් පාලනය වේ.

## අනෙකුත් බැරැරුම් වගකීම්

### ත්‍යාග මුදල් ගෙවීම

මෙම අංශය විසින් ආයතනයට සම්බන්ධ වූවන්ට විශේෂයෙන් සේවකයින්ට මනා සේවයක් සැපයීම සඳහා මුල්‍ය කළමනාකරණ ක්‍රමය සරල කිරීමේ පරිපාටියක් පවත්වාගෙන යනු ලබයි. මෙම ක්‍රියාවලියේ එක් අංගයක් ලෙස මුදලින් හා චෙක්පත්වලින් ගෙවන ලද ත්‍යාග මුදල් මෙම වසරේ සිට බැංකු මාර්ගයෙන්, රිසිට්පත් මගින් ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මේ වන විට මෙමගින් ලැබී ඇති අත්දැකීම අගය කළහැකි මට්ටමක පවතී.

### විගණන ප්‍රශ්ණ (කාරණා)

මානව සම්පත් කළමනාකරණ අංශයේද සහයෝගය ඇතිව, මෙම වසරේ විගණකාධිපති සහ අභ්‍යන්තර විගණක විසින් පැන නැගූ සියලු අවසන් නොවූ විගණනයන් සම්බන්ධ තොරතුරු සැපයීමට මුල්‍ය අංශය සමත් විය. භාණ්ඩාගාරයේ විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් තවදුරටත් විශේෂ විගණන කමිටු රැස්වීම් 02ක් හා ඒ සමගම භාණ්ඩාගාර ලේකම් විසින් මෙහෙයවන ලද විගණන කමිටු රැස්වීම් 04ක් සිදු කරනලදි. විගණක විසින් පෙන්වා දෙන ආකාරයට දෙපාර්තමේන්තුව මුල්‍ය කළමනාකරණය වර්ධනය කිරීමසඳහා උචිත ක්‍රියාමාර්ග ගෙන ඇත.

# විශේෂ කාර්ය හා සුපරීක්ෂණ අංශය

**හැඳින්වීම**

මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පාලනයට සහාය වීම සහ දෙපාර්තමේන්තුවේ සෑම කටයුත්තකදීම සුපරීක්ෂාකාරීවීමයි. මෙම අංශය විවිධ බලාත්මක කාර්යයන් සේවකයන්ගෙන් ලබාගත් දැනුම සහ මහජනයාගෙන් ලබාගත් තොරතුරු මත සිදු කරයි.

තැපැල් පාර්සල් නිෂ්කාශනයේදී කුරියර් සේවාවලදී සහ අනෙකුත් විශේෂ ක්‍රියාවලියන්හිදි සුපරීක්ෂාකාරී බව පවත්වා ගැනීම මෙම අංශයේ වගකීමයි.

**<u>ප්‍රධාන කාර්යන්</u>**

1. ආදායම් කාන්දුවීම වැලැක්වීම.
2. නැව් බඩු ලේඛණ වාර්තා කිරීමේදී අවිධිමත් භාවයන් පිළිබඳ තිබේ දැයි පරික්ෂා කිරීම
3. භාණ්ඩ රහසින් ගෙයාම වැලැක්වීම.
4. ආනයන අපනයන පාලන බලපත්‍රය අවිධිමත්ව තිබේනම් එය වැලැක්වීම.
5. වෙළදාම පහසු කර ලීම සඳහා සන්නවේදනය හා තොරතුරු තාක්ෂණය උපරිමයෙන් යොදා ගැනීම.

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය | තත්‍ය | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| **අ. ආදායම එකතු කිරීම** | | | |
| 1. දඩ | | රු. 341,438,308.00 | |
| 11. A/E සහ වෙනත් බදු | | රු. 120,037,397.00 | |
| 111. විකුණුම් ආදායම | | රු. 64,908,466.00 | |
| **ආ. පාලන පියවරයන්** | | | |
| 1. සිද්ධි සංඛ්‍යාව | | 37410 | |
| මත්ද්‍රව්‍ය සොයාගැනීම් | | | |
| 1. CRTF/1358/2013 | | කි.ග්‍රෑ. 261.292 පාකිස්තානයෙන් ගෙනෙන ලද හෙරොයින් | |
| 2. CRTF/913/2014 | | පකිස්තානයෙන් ගෙනෙන ලද හෙරොයින් ග්‍රෑම් 135.35 | |
| 3. CRTF/481/2014 | | පකිස්තානයෙන් ගෙනෙන ලද හෙරොයින් කි.ග්‍රෑ. 36.85 | |

# නිෂ්පාදන බදු (විශේෂ නියෝග) අංශය

## හැඳින්වීම

1994 අංක 08 දරණ හා 1990 අංක 40 දරණ පනත් යටතේ සංශෝධනයන්ට ලක් වූ 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු පනත (විශේෂ නියෝග) ශ්‍රී ලංකා රජයේ නිෂ්පාදන බදු පිළිවෙත් ක්‍රියාවට නැංවෙන ප්‍රධාන නෛතික මූලාශ්‍රයයි.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන නිෂ්පාදන බදු (විශේෂ නියෝග) අංශය මුදල් අමාත්‍යාංශය යටතේ පවතී. වඩාත් යහපත් ජාතියක් සඳහා වගකීමක් සහිතව නිෂ්පාදන බදු නියෝග පනත් සහ නීති ක්‍රියාත්මක කරන රජයේ නියෝජිත ආයතනයක් වශයෙන් නිෂ්පාදන බදු අංශය වැදගත් ජාතික මෙහෙවරක් සිදු කරයි.

## ප්‍රධාන කාර්යයන්

1. පවතින බදු ප්‍රතිශතයට අනුව නිෂ්පාදන බඩු උපරිමයෙන් එකතු කර ගැනීම සහතික කිරීම.

2. ඉහත දේ ළඟා කර ගැනීමට බදු නිලධාරීන් මෙහෙයවීම.

3. බදු ගෙවන්නන් විසින් කරනලද අභියාචනවලට නිර්දේශය ඉදිරිපත් කිරීම.

4. නීතිපති දෙපාර්තමේන්තුව සහ නීති අංශය සම්බන්ධ වී බදු නොගෙවූ අය සම්බන්ධව නීතිමය පියවර ගැනීම

**2014 ක්‍රියාකාරී සැලසුමේ කාර්යසාධනය සැසඳීම**

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඉලක්කය (මිලියන) | තත්‍ය (මිලියන) | ඉටු නොකරන ලද්දේ නම් ඊට හේතු |
|---|---|---|---|
| දුම්කොළ | 57,000 | 57,966 | - |
| ඛනිජ තෙල් (පෙට්‍රල්,ඩීසල්) | 10,000 | 5,145 | දේශීය නිෂ්පාදන අඩු ප්‍රමාණයක් |
| දේශීයව එකලස් කරන ලද වාහන | 25,000 | 4 | ඉලක්කය තෙක් නිපදවා නොතිබුණි |
| වෙනත් (බීම වර්ග, රේස් ප්‍රකාශන, විදුලි භාණ්ඩ දේශීයව එකලස් කරන ලද) අධිකරණ නඩු | 2625 | 1697 | දේශීය අගය එකතු කිරීම හේතුවෙන් බදු නිදහස් කිරීම් ලබා ගැනීම |

අල්බා ලංකා ඉන්ඩස්ට්‍රීස් එරෙහිව නඩු විභාගය අවසන් විය. රු. මිලියන 75 ක් බදු සහ දඩ ගෙවිය යුතු අතර මාසිකව රු. 250,000 ක වාරිකයක් ගෙවිය යුතුය.

හතර වන වාරිකය සඳහා බදු ගෙවීමේ අවසන් දිනය 31.01.2015 එම නිසා මෙම ඉලක්කම් වෙනස් විය හැක.